වාර්ෂික වාර්තාව

2025

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

ශ්‍රී ලංකාව

පටුන

1. **ගරු සභාපතිතුමාගේ පණිවිඩය…… ……..……..5**
2. **ආයතනික පැතිකඩ පිළිබඳ දළ විශ්ලේෂණය**
   - 2.1 ගරු අධක්ෂතුමාගේ වාර්තාව ……..……7
   - 2.2 අදාළ පනත යටතේ ප්‍රධාන කාර්යයන් සහ විධිවිධාන……..……9
   - 2.3 දැක්ම සහ මෙහෙවර ප්‍රකාශනය……..12
   - 2.4 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ඓතිහාසික පසුබිම ……..14
   - 2.5 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රධාන උපායමාර්ගික අරමුණු ……30
   - 2.6 සංවිධාන ව්‍යුහය ……35
   - 2.7 පරිපාලන ව්‍යුහය ……..49
3. **මෙහෙයුම් පරිසරය**
   - 3.1 ප්‍රධාන පාර්ශවකරුවන් ……..52
   - 3.2 ආයතනයේ අරමුදල් ……54
4. **කාර්ය සාධන සමාලෝචනය**
   - 4.1. ප්‍රධාන කාර්යසාධන සමාලෝචනය ……..55
   - 4.2. පුහුණු වැඩසටහන් ……...59
5. **මූල්‍ය කාර්ය සාධනය**
   - 5.1. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති……..72
   - 5.2. 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ……76
   - 5.3. 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය ……77
   - 5.4. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූදල් ප්‍රවාහ ප්‍රකාශය ……..79
   - 5.5. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්කම් ප්‍රකාශය ….80
   - 5.6. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් …...…81
   - 5.7. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු හා සැබෑ වියදම් අතර සැසඳීම……...……..95
6. **මානව සම්පත් සහ ආයතනික ධාරිතාව**
   - 6.1. කාර්ය මණ්ඩල පැතිකඩ ……...97
   - 6.2. බඳවා ගැනීම් උසස්වීම්, විශ්‍රාම වැටුප් ……100
   - 6.3. ධාරිතා වර්ධනය ……..101
   - 6.4. කාර්ය මණ්ඩල විවිධාංගීකරණ දර්ශක ……101
7. **ප්‍රධාන අභියෝග සහ උගත් පාඩම්**

7.1 මෙහෙයුම් සහ උපායමාර්ගික අභියෝග 102

7.2 විගණකාධිපතිවරයා විසින් උද්දීපණය කරන ලද ප්‍රධාන විගණන කරුණු 103

7.3. නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ අනාගත දියුණුව සඳහා උගත් පාඩම් 109

8. **ඉදිරි වසර සඳහා සැලසුම්**

8.1. අනාගත මෙහෙයුම් සඳහා උපායමාර්ගික මාර්ග සිතියම සහ ඉදිරි මූල්‍ය වසර සඳහා ප්‍රධාන ප්‍රමුඛතා සහ ඉලක්ක 111

8.2. ක්‍රියාකාරී සැලැස්ම 2026 112

8.3. ක්‍රියාකාරකම් සැලැස්ම 2026 114

8.4. අයවැය ප්‍රතිපාදන ඉදිරි දැක්ම 121

8.5. ඩිජිටල් හෝ ප්‍රතිසංස්කරණ සැලසුම් 123

9. **ස්තූතිය 124**

ගරු සභාපතිතුමාගේ සමාලෝචනය

ෆැක්ස්: 0112437534
දුරකථනය: 0112422142

අග්‍රවිනිශ්චයකාර නිලමැදිරිය
ශ්‍රේෂ්ඨාධිකරණය
කොළඹ 12
ශ්‍රී ලංකාව

2026 ජූනි 09 දින

2025 වර්ෂය සඳහා අග්‍රවිනිශ්චයකාරතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ 2025 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවිඩය ඉදිරිපත් කිරීමට ලැබීම පිළිබඳව මම මහත් සතුටක් හා ගෞරවයක් අත්විඳිමි. මෙම වාර්තාව අධිකරණ පද්ධතියේ සංවර්ධනය, ශක්තිමත් කිරීම සහ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ආයතනය අඛණ්ඩව දක්වන කැපවීම පිළිබිඹු කරන වැදගත් ලේඛනයකි.

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ මූල්‍යමය හා ආයතනික අභියෝග රාසකට මුහුණ දීමට සිදුව තිබියදීත්, ආයතනය තම ව්‍යවස්ථාපිත කාර්යභාරය හා වගකීම් ඉටු කිරීමේදී ප්‍රදර්ශනය අභියෝග හමුවේ නොසැලී සිටීමේ හැකියාව, අධිෂ්ඨානය සහ අනුවර්තනශීලීත්වය විශේෂයෙන් අගය කළ යුතුය. පුහුණු වැඩසටහන් සහ අනෙකුත් අධ්‍යාපනික ක්‍රියාකාරකම් අඛණ්ඩව සංවිධානය කර ක්‍රියාත්මක කිරීම තුළින් අධිකරණ අධ්‍යාපනය, වෘත්තීය කුසලතා සංවර්ධනය සහ අධිකරණ සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ආයතනය දක්වන ස්ථිර කැපවීම මනාව ප්‍රදර්ශනය වේ.

මෙම වසර තුළ ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් මඟින් අධිකරණ ක්ෂේත්‍රයේ ස්ථාපිත මෙන්ම නැගී එන වැදගත් විෂය ක්ෂේත්‍ර ද ආවරණය කර ඇති අතර, යුක්තිය පරිපාලනයේ නිරන්තරයෙන් විකාශනය වන අවශ්‍යතා හා අභියෝගයන්ට කාර්යක්ෂමව ප්‍රතිචාර දැක්වීම සඳහා අධිකරණ නිලධාරීන් සවිබල ගැන්වීමට ඒවා දායක වී ඇත. අධිකරණ පද්ධතියේ සියලු මට්ටම්වල ධාරිතා සංවර්ධනය කෙරෙහි යොමු කර ඇති අවධානය තවදුරටත් මූලික හා අතිශය වැදගත් ප්‍රමුඛතාවක් ලෙස පවතී.

නව පත්වීම් ලැබූ අධිකරණ නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද ආරම්භක පුහුණු වැඩසටහන විශේෂ වැදගත්කමකින් යුක්ත විය. අධිකරණ කාර්යභාරයන් කාර්යක්ෂමව හා වගකීමෙන් යුතුව ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන නෛතික දැනුම, වෘත්තීය විනය, සදාචාරාත්මක මූලධර්ම සහ අධිකරණ වටිනාකම් ඔවුන් තුළ වර්ධනය කිරීම එම වැඩසටහනේ ප්‍රධාන අරමුණ විය.

නීතිමය දැනුම වෙත ප්‍රවේශය පුළුල් කිරීම සඳහා ආයතනය ගෙන ඇති පියවරයන් මෙන්ම, අධිකරණ කටයුතු සඳහා අවශ්‍ය සංවිධිත සම්පත් සංවර්ධනය කිරීම සඳහා දරන උත්සාහයන් ද විශේෂයෙන් අගය කළ යුතුය. එම

ප්‍රයත්නයන් අධිකරණ තීරණ ගැනීමේ ඒකාකාරීත්වය, ස්ථාවරත්වය හා ගුණාත්මකභාවය වර්ධනය කිරීමට සැලකිය යුතු දායකත්වයක් සපයයි.

එසේම, ජාත්‍යන්තර හවුල්කාර ආයතන සමඟ අඛණ්ඩ සහයෝගීතාව පවත්වාගෙන යාම ද සතුටුදායක කරුණකි. එම සහයෝගීතාව තුළින් විවිධ අධිකරණ පද්ධතිවල අත්දැකීම්, නව දෘෂ්ටිකෝණ සහ හොඳම භාවිතයන් අධිකරණ පුහුණු වැඩසටහන් වෙත අන්තර්ගත කර ගැනීමට හැකි වී ඇති අතර, එය අධිකරණ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීමට ද උපකාරී වී ඇත.
ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ගෙන ඇති පියවර ද, අධිකරණ අධ්‍යයන කටයුතු හා වෘත්තීය ප්‍රගතිය සඳහා වූ මධ්‍යස්ථානයක් ලෙස එහි භූමිකාව තවදුරටත් ශක්තිමත් කර ඇත.

ශ්‍රී ලංකා විනිසුරු ආයතනයේ අධ්‍යක්ෂ, උපදේශක, නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යයන සම්බන්ධීකාරක සහ කාර්ය මණ්ඩලය වෙත ඔවුන්ගේ කැපවීම හා සේවය වෙනුවෙන් ද, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වෙත ඔවුන්ගේ අඛණ්ඩ මහපෙන්වීම වෙනුවෙන් ද, මාගේ කෘතඥතාවය මෙහිදී සටහන් කිරීමට කැමැත්තෙමි.

අනාගතය දෙස බැලීමේදී, නීතියේ ආධිපත්‍යය සුරක්ෂිත කරමින්, අවංකභාවය, ස්වාධීනත්වය හා සාධාරණත්වය පදනම් කරගත් අධිකරණ සේවාවක් ජනතාව වෙත අඛණ්ඩව සැපයීම තහවුරු කිරීම සඳහා අපගේ අධිෂ්ඨානය සහ කැපවීම නොසැලී පවත්වාගෙන යාම අතිශය වැදගත් වේ.

අත්සන් කළේ/
පී. පද්මන් සුරසේන
අගවිනිසුරු

ආයතනික පැතිකඩ

විනිසුරු නිලමැදිරිය
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12.

අධ්‍යක්ෂතුමාගේ වාර්තාව

පරිවර්තනීය සමයක්, බාධාවන් මෙන්ම ස්ථාවර ප්‍රගතියක් සනිටුහන් වූ කාලපරිච්ඡේදයක් පිළිබිඹු කරන, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2025 වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව මා ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටකිනි.

වසරේ වැඩිම කාලයක් පුරා මෙම ආයතනය ක්‍රියාත්මක වූයේ මානව සම්පත් හිඟතාවන් මධ්‍යයේ ය. කෙසේ වුවද, වසර අවසානය වන විට අභ්‍යන්තර විගණක, ඇගයීම් සහ අධීක්ෂණ නිලධාරී සහ පරිපාලන නිලධාරී ඇතුළු ප්‍රධාන තනතුරු කිහිපයක් සඳහා නිලධාරීන් බඳවා ගැනීම මඟින් මෙම තත්ත්වයට අර්ධ වශයෙන් විසඳුම් සෙවීමට හැකි විය. මෙම පත් කිරීම් ආයතනයේ ආයතනික සහ පරිපාලන රාමුව ශක්තිමත් කිරීම උදෙසා තැබූ වැදගත් පියවරක් නිරූපණය කරයි.

සමාලෝචිත වසර තුළ, සංවර්ධන හවුල්කාරිත්වයන්හි ද කැපී පෙනෙන වෙනසක් දක්නට ලැබුණි. දිගු කලක් තිස්සේ සහයෝගය දැක්වූ පරිත්‍යාගශීලී නියෝජිතායතනයක් (donor agency) ඉවත් වීමෙන් පසුව, විකල්ප සහයෝගීතා ප්‍රභවයන් සොයා සක්‍රීයව කටයුතු කිරීමට ආයතනයට සිදු විය. මෙම පරිවර්තනය හා සබැඳි අභියෝග මධ්‍යයේ වුවද, ජාත්‍යන්තර හවුල්කරුවන් කිහිපදෙනෙකු සමඟ සාර්ථකව නව සහයෝගීතාවන් ඇති කර ගැනීමට හැකි වූ අතර, එමඟින් ධාරිතා සංවර්ධන මුලපිරීම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කෙරුණි.

මූල්‍යමය බාධාවන් පැවතුණ ද, පෙර වර්ෂයට සාපේක්ෂව රජයේ ප්‍රතිපාදන ඉහළ ගොස් ඇති බව සඳහන් කිරීම වටී. අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, අධිකරණ සේවා කොමිෂන් සභාව, විදේශ කටයුතු අමාත්‍යාංශය, භාණ්ඩාගාරය සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව ලබා දුන් අඛණ්ඩ සහයෝගය ආයතනයේ ඇගයීමට ලක් වේ.

වසර තුළදී ආයතනය විසින් මහාධිකරණ, දිසා අධිකරණ, මහේස්ත්‍රාත් අධිකරණ සහ කම්කරු විනිශ්චය සහා ඇතුළු සමස්ත අධිකරණ පද්ධතියේම සියලුම ස්ථර නියෝජනය වන පරිදි අධිකරණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 23 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන් මඟින් සමකාලීන වැදගත්කමක් ඇති විෂය පථයන් ගණනාවක් ආවරණය කෙරුණු අතර, එමඟින් අධිකරණ කාර්යයන්හි වෙනස්වන වන ඉල්ලුම පිළිබිඹු විය.

2025 අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලය තුළ අලුතින් පත් වූ අධිකරණ නිලධාරීන් 49 දෙනෙකු සඳහා පවත්වන ලද 'අධිකරණ සේවාරම්භක පුහුණු වැඩසටහන' (Judicial Induction Programme) ආයතනයේ ක්‍රියාකාරකම් අතරින් සුවිශේෂී එකක් විය. මෙම වැඩසටහන මඟින් අධිකරණ සේවයේ හරයාත්මක මෙන්ම ප්‍රායෝගික අංශයන් ද ඇතුළත් කරමින්, අධිකරණ සේවය සඳහා ක්‍රමවත් පදනමක් සපයන ලදී.

තවද, ආයතනය සතු ස්වකීය සම්පත් උපයෝගී කර ගනිමින් 'Law Ceylon' නීති දත්ත සංහිතාව මාර්ගගතව පවත්වාගෙන යාම හරහා නෛතික පර්යේෂණ සඳහා ප්‍රවේශය පහසු කිරීමට ආයතනය අඛණ්ඩව කටයුතු කර තිබේ. මෙයට අමතරව, අධිකරණ භාවිතයේ ස්ථාවරත්වය නැංවීම සහ ඊට සහය වීම අරමුණු කරගනිමින් 'විනිසුරුවරුන් සඳහා වන අත්පොතක්' (Judges' Manual) සකස් කිරීමට ද පියවර ගන්නා ලදී.

ආයතනයේ යටිතල පහසුකම් නැංවීම සම්බන්ධයෙන් ද ප්‍රගතියක් අත්කර ගැනීමට හැකි විය. පුස්තකාලය සහ ශ්‍රවණාගාරය ප්‍රතිසංස්කරණය කර ක්‍රියාත්මක කිරීම, පුහුණු සහ වෘත්තීය සංවර්ධන කටයුතු සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට දායක වී ඇත.

ජාත්‍යන්තර සහයෝගීතාව ද ආයතනයේ කාර්යභාරයේ වැදගත් අංශයක් ලෙස පැවතුණි. මෙම වසර තුළ මහාධිකරණ විනිසුරුවරුන් කණ්ඩායම් දෙකක්, ඉන්දියාවේ බෝපාල් හි පිහිටි ජාතික අධිකරණ ඇකඩමියේ (National Judicial Academy) පැවැත්වුණු පුහුණු වැඩසටහනකට සහභාගී වූ අතර, එහිදී ඔවුහු අධිකරණ ක්‍රමවේදයන් පිළිබඳ සංසන්දනාත්මක අත්දැකීම් ලබා ගත්හ.

පවතින බාධාවන් මධ්‍යයේ වුවද මෙම වසර තුළ අත්කර ගැනීමට හැකි වූ ප්‍රගතියට හේතු වූයේ ආයතන කාර්ය මණ්ඩලයේ කැපවීම සහ පාර්ශවකරුවන්ගෙන් ලැබුණු අඛණ්ඩ සහයෝගයයි.

ගරු අග්‍රවිනිශ්චයකාරතුමා සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් ලබා දුන් මඟපෙන්වීම සහ නායකත්වය වෙනුවෙන් මගේ අවංක කෘතඥතාව පිරිනැමීමට කැමැත්තෙමි.

ශ්‍රී ලංකාව තුළ ස්වාධීන සහ නෛපුණ්‍ය අධිකරණ පද්ධතියක අඛණ්ඩ වර්ධනය උදෙසා සහය වීමටත්, අධිකරණ ධාරිතාව ශක්තිමත් කිරීමටත් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය නිරන්තරයෙන් ඇප කැපවී සිටියි.

විනිසුරු සම්පත් බී. අභයකෝන්
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

අදාළ පනත යටතේ ප්‍රධාන කාර්යයන් සහ විධිවිධාන

- **ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ විධිවිධාන**

ජාතික අධිකරණ පුහුණු ආයතනයක් පිහිටුවීම සහ ඊට අනුශාංගික හෝ සම්බන්ධිත කරුණු සඳහා ප්‍රතිපාදන සැලසීම පිණිස 1985 අංක 46 දරන ශ්‍රී ලංකා අධිකරණ විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ස්ථාපිත කරන ලදී.

උක්ත පනතට අනුව, ශ්‍රී ලංකාවේ අධිකරණ නිලධාරීන්ගේ පුහුණුව සහ වෘත්තීය සංවර්ධනය සම්බන්ධයෙන් වගකියනු ලබන ප්‍රධානතම ආයතනය ලෙස කටයුතු කිරීම මෙම ආයතනයේ වගකීම වේ. මෙම ආයතනය අධිකරණ සේවා කොමිෂන් සභාවේ පුහුණු අංශය ලෙස ක්‍රියා කරන අතර, අධිකරණ ක්ෂේත්‍රයේ සාමාජිකයින්ගේ දැනුම, කුසලතා, සදාචාරාත්මක ප්‍රමිතීන් සහ වෘත්තීය නිපුනතාවය නැංවීමේ වගකීම ද මෙයට පැවරී ඇත.

අලුතින් පත් කරන ලද විනිසුරුවරුන් සඳහා විධිමත් සේවාරම්භක පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, සේවයේ නියුතු අධිකරණ නිලධාරීන් සඳහා අඛණ්ඩ අධිකරණ අධ්‍යාපනය ලබා දීම මෙන්ම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට අදාළ කරුණු සම්බන්ධයෙන් පර්යේෂණ, ශාස්ත්‍රීය කටයුතු සහ ප්‍රතිපත්ති සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම දක්වා මෙම ආයතනයේ වගකීම් පරාසය විහිදේ.

සිය වගකීම් ඉටු කිරීමේදී, අධිකරණයේ ස්වාධීනත්වය, අඛණ්ඩතාව, වගවීම සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ප්‍රධාන අරමුණ මහින් මෙම ආයතනය මෙහෙයවනු ලබන අතර, එමඟින් ශ්‍රී ලංකාව තුළ යුක්තිය පසිඳලීම ඵලදායී හා කඩිනම් ලෙස සිදු කිරීමට දායකත්වයක් සපයයි.

- **මූලික කාර්යයන් සහ වගකීම්**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය, අධිකරණ සේවා කොමිෂන් සභාවේ පුහුණු අංශය ලෙස ක්‍රියා කරන අතර ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ වෘත්තීය නිපුණතාව, ස්වාධීනත්වය සහ අඛණ්ඩතාව ශක්තිමත් කිරීමේ වගකීම එයට පැවරී ඇත. සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ, ආයතනය සිය ආරම්භක පනතට සහ ප්‍රතිපත්තිමය අරමුණු වලට අනුකූලව තම ව්‍යවස්ථාපිත වගකීම් අඛණ්ඩව ඉටු කරන ලදී.

ආයතනයේ ප්‍රධාන කාර්යයන් සහ වගකීම් පහත පරිදි වේ:

1. අධිකරණ නිපුණතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින්, ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය, මහාධිකරණ, පළාත් මහාධිකරණ, දිසා අධිකරණ, මහේස්ත්‍රාත් අධිකරණවල විනිසුරුවරුන් සහ අනෙකුත් අධිකරණ නිලධාරීන් සඳහා සේවාරම්භක, සේවා-ස්ථ සහ අඛණ්ඩ අධිකරණ අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ පැවැත්වීම.

2. අලුතින් පත් කරන ලද අධිකරණ නිලධාරීන්ට අධිකරණ කාර්යයන් ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන අවශ්‍ය දැනුම, කුසලතා, සදාචාරාත්මක ප්‍රමිතීන් සහ අධිකරණමය ආකල්ප ලබා දීම පිණිස ඔවුන් වෙනුවෙන් විධිමත් පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.

3. හරවත් නීතිය (Substantive law), කාර්ය පටිපාටික නීතිය (Procedural law), අධිකරණ ආචාර ධර්ම, නඩු කළමනාකරණය, තීන්දු ප්‍රකාශයට පත් කිරීම, දණ්ඩන මූලධර්ම, විකල්ප ආරවුල් නිරාකරණය සහ නීතියේ නැගී එන නව ක්ෂේත්‍ර පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු, සමුළු සහ දැනුම යාවත්කාලීන කිරීමේ පාඨමාලා හරහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනයක් ලබා දීම.

4. ව්‍යවස්ථාපිත මූලධර්ම සහ ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන් හා හොඳම භාවිතයන්ට අනුකූලව, අධිකරණයේ ස්වාධීනත්වය, වගවීම, අඛණ්ඩතාව සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම.

5. යුක්තිය පසිඳලීම, නීති ප්‍රතිසංස්කරණ, අධිකරණ ක්‍රියාවලීන් සහ අධිකරණ කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට අදාළ අධිකරණ පර්යේෂණ, ප්‍රතිපත්ති අධ්‍යයනයන් සහ ශාස්ත්‍රීය කටයුතු සිදු කිරීම සහ ඒවා සඳහා පහසුකම් සැලසීම.

6. නෛතික දැනුම සහ අධිකරණ පුහුණුව ඉහළ නැංවීම අරමුණු කරගත් පුහුණු ද්‍රව්‍ය, අත්පොත්, පර්යේෂණ පත්‍රිකා, සඟරා සහ අනෙකුත් ශාස්ත්‍රීය ප්‍රකාශන සංවර්ධනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම.

7. නඩු කළමනාකරණ පද්ධති, ඩිජිටල් පර්යේෂණ මෙවලම් සහ ඉලෙක්ට්‍රොනික අධිකරණ ක්‍රියාවලීන් ඇතුළුව යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සඳහා නවීන තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ එම ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබා දීම.

8. ධාරිතා වර්ධනය සහ දැනුම හුවමාරු කර ගැනීමේ අරමුණින් දේශීය හා ජාත්‍යන්තර අධිකරණ පුහුණු ආයතන, විශ්වවිද්‍යාල, වෘත්තීය ආයතන සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝගීතාව සහ ඒකාබද්ධතාව වර්ධනය කිරීම.

9. අවශ්‍යතාව පරිදි, කාන්ති අධිකරණ නිලධාරීන්, අධිකරණ කාර්ය මණ්ඩලය සහ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට සම්බන්ධ අනෙකුත් පාර්ශවකරුවන් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

10. ඇගයීම් සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන් හරහා අධිකරණ ක්ෂේත්‍රයේ සහ අධිකරණ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ අධිකරණ අධ්‍යාපන වැඩසටහන්වල ගුණාත්මකභාවය හා අදාළත්වය අඛණ්ඩව වැඩි දියුණු කිරීම.

11. ශ්‍රී ලංකාව තුළ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම තවදුරටත් ඉදිරියට ගෙනයාම සඳහා, ආයතනයේ අරමුණු වලට අනුගාංගික වන හෝ පවරනු ලැබිය හැකි වෙනත් කාර්යයන් ඉටු කිරීම.

දැක්ම සහ මෙහෙවර ප්‍රකාශනය

දැක්ම

සියලු දෙනාට ම විශ්වසනීය, අපක්ෂපාතී, ස්වාධීන, පරිශීලක මිත්‍ර සහ ප්‍රවේශ විය හැකි අධිකරණ ක්‍රමයක් සාක්ෂාත් කරගැනීම පිණිස විනිශ්චයකාරවරයන්ගේ වෘත්තිමය විශේෂඥතාව වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීම උදෙසා විනිශ්චයකාරවරයන් විෂයෙහිලා අධිකරණමය පුහුණුවීම් ලබා දීමේ දී, සහ ඉතාමත් ඉහළ මට්ටමේ පුහුණුවීම් සහ පර්යේෂණ පහසුකම් සැපයීමේ දී, විශිෂ්ඨ ගණයේ ආයතනයක් වශයෙන් ක්‍රියා කරන්නෙමු.

මෙහෙවර

විවිධ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් හරහා අධිකරණ නිලධාරීන්ගේ වෘත්තීමය විශේෂඥතාව සහ යුක්තියේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම පිණිස ඉහල මට්ටමේ දැනුමක් සහ කුසලතාවක් අධිකරණ නිලධාරීන්ට ලබාදීම හරහා ආයතනයේ දැක්ම සාක්ෂාත් කර ගැනීමට ක්‍රියා කරන්නෙමු.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පහත සඳහන් පරමාර්ථ සපුරා ගැනීමට දායක වෙමින් ස්වකීය මෙහෙවර පරිපූර්ණ කර ගැනීමට අපේක්ෂාවෙන් කටයුතු කරයි. එම පරමාර්ථ මෙසේ ය.

- අධිකරණ නිලධාරීන් සඳහා අඛණ්ඩ පුහුණුව ලබාදීම;
- පර්යේෂණ, ප්‍රකාශන පළකිරීම සහ තාක්ෂණික සහාය ලබාදීම හරහා අධිකරණ නිලධාරීන්ට සහයෝගීතාව දැක්වීම;
- අධිකරණ හා නෛතික කාරණාවන් පිළිබඳව අධිකරණ නිලධාරීන් විසින් අදහස් හුවමාරු කර ගැනීමට පහසුකම් සැලැස්වීම;
- අධිකරණ නිලධාරීන්ගේ වෘත්තිමය විශේෂඥතාව වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ දැනුම සහ කුසලතාවය වර්ධනය කිරීම ඉලක්ක කරගෙන සම්මන්ත්‍රණ, සම්මේලන, දේශන සහ වැඩමුළු සංවිධානය කිරීම සහ පැවැත්වීම;
- ප්‍රමාදය අවම කිරීමේ දී නඩු කළමනාකරණය සහ නඩු ප්‍රවාහ කළමනාකරණය මඟින් වැඩිම යහපත ගෙන දෙන පරිචයන් සහ ව්‍යවහාරයන් සාක්ෂාත් කරගැනීම පිණිස මාර්ගෝපදේශ සංවර්ධනය කිරීමට දායක වීම;
- යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ විවිධ අංශ පිළිබඳව පර්යේෂණ කටයුතු ඉටු කිරීම;
- විනිශ්චයකාරවරයන් ඉලක්ක කරගෙන පුස්තකාල සහ වෙබ් අඩවි පාදක, අධ්‍යාපන පහසුකම් සැපයීම සහ නීතිමය තොරතුරු සහ කාරණාවන් ප්‍රචලිත කිරීම;
- අන්තර්ජාතික අධිකරණ ආයතන සමඟ අන්තර් සහයෝගීතාව පවත්වාගෙන යාම;
- අධිකරණ ක්‍රමය තුළ මහජන භාරය සහ විශ්වාසය ආරක්ෂා කිරීම පිණිස නඩු කියන්නන්ට පිළිසරණ සැපයීම සම්බන්ධයෙන් නීති ප්‍රතිසංස්කරණවලට දායක වීම
- යුක්තිය පසිඳලීම සහ යුක්තියට ප්‍රවේශ වීම සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි සංවර්ධනය කොට ක්‍රියාත්මක කිරීම උදෙසා දායකත්වය සැපයීම;.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ඓතිහාසික පසුබිම

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ අධිකරණමය අධ්‍යාපනය සහ පුහුණුවීම් මෙන් ම ඔවුන්ගේ වෘත්තීමය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමේ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ශ්‍රී ලංකාව තුළ තනි හා එකම අධිකරණමය ආයතනය වශයෙන් වඩාත් දුර්ලභ ඝණයේ සුවිශේෂිත්වයක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාවේ අධිකරණ නිලධරයන් සඳහා අධිකරණ විෂය පිළිබඳව හැදෑරීමට අවකාශ සැලසීමේ දී, විනිශ්චයාසනය හොබවන විනිශ්චයකාරවරයා සමීපයෙහි අසුන් ගෙන සති කිහිපයක් පුරාවට අධිකරණ ශාලාවේ කටයුතු නිරීක්ෂණය කිරීම වනාහී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීමට පෙර කාලයේ දී අලුත් පත්වීම් ලද අධිකරණ නිලධරයන් අධිකරණ රාජකාරිවල වැඩ බාර ගැනීමට පෙර ලැබූ එකම පුහුණුව බවට පත්ව තිබුණි. යුක්තිය පසිඳලීම කරන විනිශ්චයකාරවරයන් ස්වකීය අධිකරණ වෘත්තිය ආරම්භ කිරීමට පෙරාතුව පමණක් නොව, ස්වකීය අධිකරණ වෘත්තිය නියැලෙන සමස්ත කාලය පුරාම පුහුණුවීම් ලබාගත යුතු බවට දැඩි ලෙස විශ්වාස කරනු ලැබේ. ඒ අනුව, සියලුම මට්ටමේ අධිකරණ නිලධරයන් සඳහා නිතිපතා පුහුණුවක් ලැබෙන අන්දමට වෙන් වූ පරිපූර්ණ සහ අඛණ්ඩ පුහුණු ආයතනයක් සැලසුම් කොට පිහිටුවීම කළ යුතු බවට ඉක්බිතව අවබෝධ කර ගන්නා ලදී.

විනිශ්චයකාරවරයන් සඳහා ආයතනයක් පිහිටුවීම පිළිබඳ අදහස මුල්වරට සාකච්ඡාවට භාජනය කළේ එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ධුරය හෙබ වූ පී.බී.හේරත් මහතා විසිනි. ප්‍රංශය තුළ ක්‍රියාත්මක වන එවැනි ආයතනයක් සියැසින් දැක බලා ගැනීමෙන් අනතුරුව 1982 වර්ෂයේ දී ඒ පිළිබඳව එතුමා විසින් ශ්‍රී ලංකා නීතීඥ සංගමයේ පුවත්පත් සඟරාවකට පුවත් ලිපියක් ලියන ලදී. නමුත්, සුපුරුදු ලෙස ඒ සම්බන්ධයෙන් කිසිවක් සිදු නොකරන ලද අතර, එම කාරණය සාකච්ඡාවට භාජනය කළ ද, ඊට ප්‍රමාණවත් ඇහුම්කන් දීමක් සිදු නොවීය. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයකු වශයෙන් ක්‍රියා කරමින් විනිශ්චයකාරවරයන්ගේ ආයතනයක් පිහිටුවීම පිළිබඳව පළමු වරට සාකච්ඡා කළ පී.බී.හේරත් මහතා එකී ආයතනය පිහිටුවීම දිරිමත් කිරීමේ ස්ථීරසාර ප්‍රබල මූලාශ්‍රයක් වශයෙන් ක්‍රියා කළ අතර, ආයතනයේ ප්‍රබලතම මට්ටමේ හිතෛෂී කොටස්කරුවෙකු බවට පත් විය.

ඒ අනුව, විනිශ්චයකාරවරුන් සඳහා සේවාස්ථ අඛණ්ඩ නීති අධ්‍යාපනයක් සැපයීම පිණිස විනිශ්චයකාරවරයන් සඳහා වන ආයතනයක් පිහිටුවීම පිණිස ඔවුන් විසින් එක්ව ක්‍රියා කළ අතර, ගරු විනිසුරු ජේ.එෆ්.ඒ.සෝසා මැතිතුමා 1984 මැයි මස 02 වන දින ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත්කරන ලදී. අරමුදල් සැපයීම පිළිබඳ ගැටලුව ආසියානු පදනමේ නේවාසික නියෝජිත ජෝන් ගුයේ මහතා සමඟ ඒ වන විටත් සාකච්ඡා කර තිබුණි. ආයතනය පිහිටුවීම පිණිස පළමුවෙන් ම කළ යුතුව තිබුණේ ඊට උචිත පරිශ්‍රයක් සොයා බලා තෝරා ගැනීමයි. ඒ අනුව, විවිධ විකල්ප පරිශ්‍රයන් හඳුනා ගැනීමෙන් පසුව, ශ්‍රී ලංකා පදනම් ආයතනයේ උප ගෘහය වසරක කාලයක් සඳහා බද්දට ගන්නා ලද අතර, ඊට අවශ්‍ය ගෘහභාණ්ඩ සැපයීමට ද කටයුතු කරන ලදී. මෙම සියලු ම කටයුතු ආසියානු පදනමේ මුල්‍ය අනුග්‍රහය හරහා සිදු විය. ඉන්

අනතුරුව සමහරක් සම්මන්ත්‍රණ පවත්වන ලද නමුත්, රජයේ අනුමැතිය ලබාගත යුතු බැවින්, අවස්ථාවෝචිත පරිදි පමණක් වැඩසටහන් දියත් කරන ලදී. අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සකස් කරන ලද නමුත්, රජයේ අනුමැතිය ලබාගත හැකිවේ ද යන්න පැහැදිලි කාරණයක් නොවීය.

අද්විතීය මට්ටමේ දේශන සමහරක් පවත්වන ලද අතර, එම කතිකාවන් ඉතාමත් ඉහළ මට්ටමේ ප්‍රමිතියකින් යුක්ත ඒවා විය. මෙම දේශනවල ආරාධිත දේශකයා බවට පත් වුයේ ගරු විනිසුරු ක්ලිෆර්ඩ් වොලස් මහතා වූ අතර, එතුමා නීති ක්‍රම හා අධිකරණ පරිපාලනය පිළිබඳ ආසියානු පදනමේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයා වූ අතර, එක්සත් ජනපදයේ අභියාචනාධිකරණයේ අධිකරණ මණ්ඩලයේ නවවන කීර්තිධර විනිශ්චයකාරවරයා ද විය.

ඒ අනුව, විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සමාරම්භය එලෙසින් සිදු විය. විශිෂ්ඨ ගණයේ බුද්ධිමතකු සහ පරිකල්පනයේ අද්විතීය මිනිසෙකු වූ ගරු ආචාර්ය ඒ.ආර්.බී අමරසිංහ මැතිතුමා ආයතනයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට සැදී පැහැදී උර දී සිටීම භාග්‍යයක් විය. ඔහුගේ නාමය විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රභවය සම්බන්ධයෙන් අවධාරණය කළ යුතු වන්නේ ඔහු විසින් දරන ලද උත්සාහයේ ප්‍රතිඵලය 1985 නොවැම්බර් මස 20 වන දින සහතිකය සටහන් කරන ලද 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පාර්ලිමේන්තුව විසින් පනතක් මඟින් පනවනු ලැබීම නිසාය. ගරු විනිසුරු සෝසා මැතිතුමා ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් 1986 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධිමත් ලෙස පත් කරන ලදී. එතැන් පටන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණුවීම් සහ උපදේශාත්මක සේවාවන් සැපයීම හරහා අධිකරණ නිලධරයන් සඳහා හැකි සෑම අවස්ථාවක දී ම, සේවය කර ඇත. තව ද, 1990 වර්ෂයේ දී, විනිසුරු ගරු කේ. විග්නරාජා මැතිතුමා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් ද, පී. නෙවිල් ඒ ද සිල්වා මහතා අගවිනිසුරු ලේකම් කාර්යාලයෙන් විශ්‍රාම යාමෙන් ඉක්බිතිව ආයතනයේ ලේකම්වරයා වශයෙන් ද, සම්බන්ධ වීමෙන් ගරු විනිසුරු සෝසා මැතිතුමාට සහාය ලබා දීම ද විශේෂයෙන් අගය කළ යුතුය

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් අතුරින් පත් කරන ජ්‍යෙෂ්ඨ ම විනිශ්චයකාරවරයන් දෙදෙනෙකු සහ නිල බලයෙන් ගරු අග්‍රවිනිශ්චයකාරවරයා සභාපති ධුරය හොබවන කළමනාකරණ මණ්ඩලයක් මඟින් විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පාලනය වේ. ආයතනයේ පරිපාලනය සහ කළමනාකරණය, කළමනාකරණ මණ්ඩලය වෙත පවරන ලදී.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ පළමු සභාපතිවරයා වුයේ එකී ආයතනය වෙත ඉමහත් උද්‍යෝගයකින් සහාය පළකළ හිටපු අගවිනිසුරු ගරු එස්. ෂර්වානන්ද මැතිතුමාය. ඉක්බිතිව අග්‍රවිනිශ්චයකාර ගරු පාරින්ද රණසිංහ මැතිතුමා කලමනාකරණ මණ්ඩලයේ සභාපති ධුරයට පත්විය. එතුමා අධිකරණයේ ම සාමාජිකයකු වූ අතර, ආයතනයේ කටයුතුවල දී ස්වකීය අවංක අගනා කැපවීම ප්‍රදර්ශනය කළේය. එතුමා ආයතනයේ සියලු ම සම්මන්ත්‍රණ සහ ක්‍රියාකාරකම්වලට සහභාගී විය. එතුමා විසින්

මෙම සම්මන්ත්‍රණවල දී නීතීඥවරුන් සහ මිනින්දොරුවරුන් සමඟ සාකච්ඡා පවත්වන ලද අතර, ගරු විනිශ්චයාසනය සහ නීතිඥ සංගමය අතර සුහද සම්බන්ධතාවක් ගොඩනගා ගැනීම පිණිස අධික්ෂණ කමිටු ද පිහිටුවන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය තුළ ඔහු සැමදා මතකයේ රැඳෙනු ඇත.

ඉන් පසුව, කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ඒ වන විටත් එහි සේවය කර තිබූ අග්‍රවිනිශ්චයකාර ගරු තම්බයියා මැතිතුමා කළමනාකරණ මණ්ඩලයේ සභාපති ධුරයට පත් කරන ලද අතර, ඔහු විසින් ආයතනයේ ප්‍රගතිය සහ අභිවෘද්ධිය වෙනුවෙන් ඉතාමත් අගනා වැදගත් දායකත්වයක් ඉටු කරන ලදී. එවකට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ ඒ. එස්. විජේතුග මහතා ආයතනයේ පරමාර්ථ සඵල කර ගැනීම පිණිස දැඩි උත්සාහයක් දරමින් ප්‍රමුඛ පෙළේ අනගිභවනීය කාර්ය භාරයක් ඉටු කරන ලදී. අභියාචනාධිකරණයේ සභාපති විනිසුරුවරයා වශයෙන් කටයුතු කළ අවධියේ දී, ඔහු විසින් ආයතනයට ඉටු කළ චිරස්ථායී මෙහෙවර තවමත් ප්‍රකටය. එතුමාගේ අනුප්‍රාප්තිකයා බවට පත් වූයේ ලාල් පීරිස් මහතාය. ඔහුට සහාය වූ එස්. විතානාරච්චි මහතා විසින් ද ආයතනයේ අභිවෘද්ධිය සහ දියුණුව පතා නොපසුහට මෙහෙවරක යෙදුණේය. ආයතනයේ සුභසිද්ධිය උදෙසා ඔවුන් විසින් අභිලාෂවත් සැලකිල්ලක් දක්වා ඇති අතර, ඔවුන් ආයතනයට වැරගැන්වූ ශක්තිමත් ටැඹක් වූවාට නිසැකය.

පූර්වයෙන් ජෝන් ගුයර් මහතා ප්‍රධානත්වය හෙබ වූ ද, ඉන්පසුව නික් ලැන්ග්ටන් මහතා ප්‍රධානත්වය හෙබවූ ද, ආසියානු පදනමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සිය ස්තුතිය මෙහි දී පළකර සිටිනු ලැබේ. ආයතනයේ වර්තමාන මනා තිරසාර පැවැත්ම උදෙසා ආසියානු පදනම විසින් ලබා දුන් අගනා සහයෝගයට අයතනයේ නොමඳ කෘතඥතාව හිමි විය යුතුය. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වනාහී ප්‍රමුඛත්වයෙහි ලා සැළකිල්ලට භාජනය කළ යුතු ආයතනයක් වන අතර, පදනමේ ත්‍යාගශීලිත්වයේ අර්ථලාභියෙකු වන බවට ප්‍රකාශ කරන්නේ ඉතාමත් සාඩම්බරයෙනි. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ඉන්පසු අවස්ථාවක අළුත්කඩේ පිහිටි ශ්‍රේෂ්ඨාධිකරණයේ පරිශ්‍රයක පිහිටුවන ලද අතර, නඩත්තු කිරීමේ වියදම් රජය විසින් දරන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් නඩු විභාග කරන විනිශ්චයාධිකාරවරයන් සඳහා පුහුණු වැඩසටහන් සකස් කිරීමේ දී, අධිකරණමය කාරණාවන් සම්බන්ධයෙන් වන විටක දී අභියාචනා අධිකරණ බලය ඇති අධිකරණවල ජ්‍යෙෂ්ඨ විනිශ්චයකාරවරයන්ගේ විශේෂඥතාව සහ පළපුරුද්ද ද, පරිපාලනමය කාරණාවන් සම්බන්ධයෙන් වන විටක දී, අධිකරණ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහයෝගය ද ලබාගෙන ඇත. 1990 වර්ෂයේ නොවැම්බර් මාසයේ දී කැලිෆෝනියාවේ පිහිටි අධිකරණ අධ්‍යාපනය සහ පර්යේෂණ මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය පෝල් එම්. ලී මහතා ශ්‍රී ලංකාවට ගෙන්වා අධිකරණ විෂය සම්බන්ධයෙන් විස්තීර්ණ අධ්‍යාපනික පුහුණු ක්‍රමවේදයක් තෙවසරක නියමු පදනමින් ලබාදීමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට හැකිවීම පිණිස ව්‍යාපෘතියක් සකස් කරන ලදී. එම ව්‍යාපෘතියේ සුවිශේෂී අංග ලක්ෂණ පහත දැක්වේ.

1. ශ්‍රී ලංකාවේ අධිකරණයට අලුතින් පත්වන අධිකරණ නිලධරයන්ගේ අධිකරණමය ක්ෂේත්‍රය

පිළිබඳ දැනුම සහ කෞශල්‍යය යාවත්කාලීන කොට ප්‍රගුණ කර ගනිමින් ඉදිරියටත් ස්වකීය අධ්‍යාපනය නොකඩවා ම කරගෙන යාම පිණිස අර්ධ වාර්ෂික වෘත්තීය අධ්‍යාපන වැඩසටහන හඳුන්වා දීම;

2. දිසා අධිකරණ සහ මහාධිකරණවලට අලුතෙන් උසස්වීම් ලබන විනිශ්චයාධිකාරවරයන් සඳහා වෙන් වෙන් වූ, මාසික සේවාස්ථ සමාරම්භක වැඩසටහන් දියත් කිරීම;

3. නව නෛතික ප්‍රවනතාවන්, පොදු සහ සුවිශේෂී අධිකරණ ගැටලු විසඳීම සහ දේශීය අධිකරණ පරිචයන්, කාර්ය පටිපාටි ප්‍රමිතිගත කිරීම පිළිබඳ නූතනමය අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි සකස් කිරීමේ දී පිළිවෙලින් මහේස්ත්‍රාත්වරයන්ට, දිසා විනිසුරුවරයන්ට, මහාධිකරණ විනිශ්චයකාරවරයන්ට, අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයන්ට සහාය ලබා දීම පිණිස වාර්ෂික සේවාස්ථ අඛණ්ඩ අධ්‍යාපන සම්මේලන පැවැත්වීම;

4. අධිකරණ කළමනාකරණය, සන්නිවේදන කෞශල්‍යය, කාන්තාවන් සහ සුළු ජනවාර්ගික කොටස් සඳහා අධිකරණ ශාලාව තුළ සාධාරණත්වය ඉටු කිරීම, අධිකරණ විෂය ගවේෂක තීරණ ගැනීම සහ නීති ශාස්ත්‍රය, මනුෂ්‍යත්වය, පවුල් නීතිය, ළමා අධිකරණ නීතිය, අපරාධ නීතිය, සිවිල් නීතිය, ප්‍රොබේට් සහ මානසික සෞඛ්‍යය පිළිබඳ නීතිය, ඉඩම් සහ බෙදුම් නඩු නීතිය මෙන් ම මානව අයිතිවාසිකම් පිළිබඳ නීතිය වැනි ඉතා වැදගත් අධිකරණ විෂයයන් පිළිබඳව කාලීනව සති එකක උසස් අධිකරණ අධ්‍යාපන වැඩ සටහන් හඳුන්වා දීම;

5. ශ්‍රව්‍ය සහ දෘශ්‍ය වශයෙන් පටිගත කළ අධ්‍යාපන කරුණු (අධිකරණවල දී, විනිශ්චයකාරවරයන් සඳහා මුලික පුස්තකාල පහසුකම්) ඇතුළුව අධිකරණ සඳහා විස්තීර්ණ දෛනික වැඩ මෙවලම් අංග (විනිශ්චයාසන පොත්, කතිත වචනයෙන් සහ ලිඛිත ආකාරයෙන් පරීක්ෂණ ලැයිස්තු, අත්පොත් සහ වෙනත් පරිශීලන පොත්පත්) හඳුන්වා දීම;

6. විනිශ්චයකාර ගුරු ඇදුරන් සඳහා කාර්යක්ෂම අධිකරණ පීඨ සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම;

7. අධිකරණ මෙහෙයුම් ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට, අධිකරණ නඩු ප්‍රමාදය මැඩලීමට සහ විනිශ්චයකාරවරයන් සඳහා ආචාර විද්‍යාත්මක පැවැත්ම සහ මහජන වගකීම් වැඩිදියුණු කිරීමට සිදු කරන පර්යේෂණ, ඉඩම් සංවර්ධන වැඩසටහන් හඳුන්වා දීම;

8. යථෝක්ත අධිකරණ ක්‍රමය දියත් කිරීම පිණිස සුදුසු පංති කාමර, කාර්යාල, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ සහ වෙනත් සම්පත් සහිත අධිකරණ පීඨ සැලසුම් කිරීම, කුලියට ගැනීමේ හැකියාව සලකා බැලීම හෝ අනාගතයේ දී ඉදිකිරීමට පියවර ගැනීම;

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ යුක්තියේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ නීතියේ ආධිපත්‍ය සවිබල ගැන්වීමයි. මක්නිසාද යත්, සාධාරණ, වේගවත් සහ කාර්යක්ෂම ලෙස යුක්තිය පසිඳලීම පිණිස අධිකරණයේ සාමාජිකයන් තමන්ට පැවරී ඇති භූමිකාව සහ වගකීම් ඉටු කිරීමට මැනැවින් සන්නද්ධ වී සිටීම අවශ්‍ය වේ. මෙම අරමුණු සඵල කර ගැනීම පිණිස අලුතින් පත්වීම් ලබන විනිශ්චයකාරවරුන්ට සිය ධුරවල වැඩ භාර ගැනීමේ දී විධිමත් පුහුණුවක් ලබාදීම අවශ්‍ය වනවාක් මෙන් ම ඔවුන් සිය ධුරය හොබවන සමස්ත වෘත්තීය කාලය පුරාම සිය අධ්‍යාපනය නොකඩවා ම කරගෙන යාම අවශ්‍ය වේ. යුක්තියේ ගුණාත්මකභාවය විනිශ්චයකාරවරයන් කොපමණ ප්‍රමාණයකට යහපත් මට්ටමින් සිටින්නේ ද යන කාරණය මත රඳා පවතී. නීතිය තිබීම පමණක් ප්‍රමාණවත් නොවේ. පසිඳලන යුක්තිය එය පසිඳලන විනිශ්චයකාරවරයා යහපත් තරමට ම යහපත් විය යුතුය. නීතියේ ආධිපත්‍යයට කැපවී සිටින ලෝකයේ සියලු ම රටවල් මෙම තත්ත්වය වටහාගෙන තිබෙන අතර, විනිශ්චයකාරවරයන් සඳහා පුහුණුවීම් සහ අධ්‍යාපන වැඩසටහන් පවත්වාගෙන යනු ලැබේ.

මෙම කාල පරිච්ඡේදය තුළ, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ශ්‍රේෂ්ඨාධිකරණ පරිශ්‍රයේ අංක 1308 දරන කාමරයේ ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයකු වූ ගරු කේ. විග්නරාජා මැතිතුමා ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලද අතර, එතුමා විසින් ගරු විනිසුරු ජේ.එෆ්.ඒ.සෝසා මැතිතුමා සමඟ එක්ව අධිකරණ නිලධරයන් සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ගරු කේ. විග්නරාජා මැතිතුමා ආයතනයේ සිය ධුරයෙන් නික්ම ගිය ඉක්බිතිව, අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිසුරුවරයකු වූ ගරු එස්.ජේ.ඩී.ද එස්. විජේරත්න මැතිතුමා 1986 වර්ෂයේ දී ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් වැඩ භාරගන්නා ලදී. ඉන්පසුව, අභියාචනාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයකු වූ ගරු පී.එච්.කේ.කුලතිලක මැතිතුමා 2002 වර්ෂයේ දී ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලද අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ සාමාජිකයකු වශයෙන් ද, මහාධිකරණ විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෙකු වශයෙන් ද, කටයුතු කිරීමෙන් ඉක්බිතිව එතුමා ලබා තිබූ හසල දැනුම සහ පළපුරුද්ද ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට මහඟු සම්පතක් වූ අතර, එතුමා අධිකරණ නිලධරයන්ට ගුරු ඇදුරුතුමෙකු විය.

අගවිනිසුරුවරයකු වූ ගරු ජී.පී.එස් ද සිල්වා මැතිතුමා විශ්‍රාම යාමෙන් පසුව, ගරු විනිසුරු සරත් එන්. සිල්වා මැතිතුමා 2000 වර්ෂයේ දී, අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කරන ලදී. අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ප්‍රගමනයේ දී වැරගැන්වූ සවිමත් ටැඹක් බවට පත්විය. කොළඹ 07, විජේරාම මාවතේ පිහිටි එතුමාගේ නිල නිවාසය විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වශයෙන් භාවිතා කිරීමට එතුමා විසින් අවසර ප්‍රදානය කරන ලද අතර, අධිකරණ නිලධරයන් සඳහා වන පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම පිණිස නීති සහ අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ අරමුදල් ලබාගැනීමට අවස්ථාව උදාකර දෙන ලදී.

ලෝක බැංකුවේ සහයෝගිතාව ඇතිව අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ නීති සහ අධිකරණ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ සහයෝගිතාව සහිතව අධිකරණ නිලධරයන් සඳහා විදේශීය ශිෂ්‍යත්ව ක්‍රමය ආරම්භ කිරීම මඟින් ගරු අගවිනිසුරු සරත් එන්. සිල්වා මැතිතුමා විසින් දිගුකාලීන අධිකරණ පුහුණු වැඩසටහන ආරම්භ කිරීමට මුල පිරීය. කාර්යක්ෂමය සහ ප්‍රවීණත්වයකින් යුතුව ආරවුල් විසඳීමට හැකි නූතන අධිකරණ පද්ධතියක් පිහිටුවීම මෙම ව්‍යාපෘතියේ එක් අරමුණක් බවට පත් වී තිබුණි. වානිජ නීතිය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් අලුතින් පත්වීම් ලද සහ සේවාස්ථ විනිශ්චයකාරවරයන් යන දෙකොටස ම ආවරණය වන පරිදි පුහුණු වැඩසටහන් සඳහා අරමුදල් සැපයීම සහ විස්තීරණ පුහුණු වැඩසටහන් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ ඒකාබද්ධ අංගයක් විය. මෙම ඉලක්කය සාක්ෂාත් කරගැනීම පිණිස වසරකට අධිකරණ සාමාජිකයන් තිදෙනෙකුට එල් එල් එම් උපාධිය ලබා ගැනීම සඳහා සමස්ත අධ්‍යයන පිරිවැය සඳහා එනම්, උපකාරක පංති, ප්‍රවාහන වියදම්, නවාතැන් පහසුකම් සහ සාධාරණ යැපුම් දීමනාවක් සඳහා මෙම ව්‍යාපෘතියෙන් අරමුදල් සම්පාදනය කරන ලදී.

අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විසින් අධිකරණ නිලධරයන් සහ උසාවි කාර්ය මණ්ඩලය සඳහා පරිගණක පුහුණු වැඩසටහනක් එවකට කොළඹ 07 විජේරාම මාවතේ පිහිටි එතුමාගේ නිල නිවසේ දී ආරම්භ කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ දී අධිකරණ අමාත්‍යාංශය විසින් නව ගොඩනැගිල්ලක් ඉදි කරන ලද අතර, ඒ අනුව, විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සඳහා එම ගොඩනැගිල්ලේම 5 වන මහල ද, 4 වන මහලේ කොටසක් විනිශ්චයකාරවරයන්ගේ නවාතැන් ගැනීම සඳහා ද, වෙන් කරන ලදී. අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විසින් ආයතනයට ලබාදුන් අනුග්‍රහය පිළිබඳව ආයතනය විසින් සිය කෘතඥතාව පළකර සිටින අතර, අග්‍රවිනිශ්චයකාර ධුරය හෙබ වූ 2000 සිට 2009 වර්ෂය තුළ ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් එතුමා විසින් අවංක සේවාවක් ඉටු කරන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සෑම විටක දී ම එතුමා ගෞරවයෙන් සිහිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ආරම්භක අධ්‍යක්ෂවරයා වූ විනිසුරු ගරු ජේ.එෆ්.ඒ. සෝසා මැතිතුමා ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් වසර 21 ක අගනා සේවයකින් පසුව වර්ෂ 2008 වර්ෂයේ දී විශ්‍රාම ගන්නා ලදී. එතුමා විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට මෙන් ම අධිකරණ නිලධරයන් සඳහා ද ප්‍රශංසනීය සේවාවක් ඉටු කරන ලද අතර, එතුමාගේ මෙහෙවර සදාකාලිකව අපගේ මතකයේ රැඳෙනු ඇත.

ගරු විනිසුරු ජේ.එෆ්.ඒ. සෝසා මැතිතුමා විශ්‍රාම යාමෙන් පසුව ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමික විනිශ්චයකාරවරයකු වූ ගරු නිශ්ශංක උදලාගම මැතිතුමා 2008 වර්ෂයේ දී ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලද අතර, එතුමා 2011 වර්ෂය වන තෙක් ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් සිය රාජකාරී කටයුතු ඉටු කරන ලදී. මෙම කාල පරිච්ඡේදය තුළ ගරු විනිසුරු නිශ්ශංක උදලාගම මැතිතුමා විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පළමු වෙබ් අඩවිය ආරම්භ කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණයේ,

අභියාචනාධිකරණයේ සහ මහාධිකරණවල විනිශ්චයකාරවරයන්ගේ සහයෝගීතාව ඇතිව අධිකරණ නිලධරයන් සඳහා අපරාධ, සිවිල්, වානිජ කාරණාවන්, නඩු කළමනාකරණය සහ ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම පිළිබඳ පාඨමාලා ග්‍රන්ථ 10 කට අධික ප්‍රමාණයක් පළ කිරීමේ දී, ගරු විනිසුරු ජේ. එෆ්.ඒ.සෝසා මැතිතුමා, ගරු විනිසුරු උදලාගම මැතිතුමා සහ ගරු විනිසුරු පී.එච්.ඒ.කුලතිලක මැතිතුමා විසින් අතීශයින් ම ඵලදායී කර්තව්‍යයක් ඉටු කරන ලදහ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වෙනුවෙන් ඔබලා විසින් කළ මෙහෙවරට අප සිය හෘදයාංගම ප්‍රණාමය පළ කිරීමට මෙය අවස්ථාවක් කරගන්නෙමු.

අග්‍රවිනිශ්චයකාර ගරු සරත් එන්. සිල්වා මැතිතුමා විශ්‍රාම යාමෙන් පසුව, විනිසුරු ගරු අශෝක ද සිල්වා මැතිතුමා 2009 වර්ෂයේ දී අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත් කරන ලදී. එතුමාගේ ධුර කාලයේ දී විනිසුරු ගරු පී.එච්.ඒ.කුලතිලක මැතිතුමා 2009 වර්ෂයේ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලදී. 2011 වර්ෂයේ දී එතුමා ශ්‍රේෂ්ඨාධිකරණයේ විශ්‍රාමලත් ගරු විනිසුරු ටී. බී. වීරසුරිය මැතිතුමා සමඟ සම- අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලදී. ගරු විනිසුරු ටී. බී. වීරසුරිය මැතිතුමා සහ ගරු විනිසුරු ගරු පී.එච්.කේ. කුලතිලක මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අභිවෘද්ධිය වෙනුවෙන් අගනා සේවයක් සිදු කරන ලද අතර, ඔවුන් උපරිමාධිකරණවල සේවය කිරීමෙන් ලත් අගනා පළපුරුද්ද සහ හසල දැනුම උපයෝගී කර ගනිමින් සිවිල් සහ අපරාධ අධිකරණවල සේවය කරන විනිශ්චයකාරවරයන් පුහුණු කිරීමට අගනා මෙහෙවරක් ඉටු කර ඇත. ශ්‍රී ලංකාවේ විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට මෙන් ම අධිකරණයට ඔවුන් විසින් ඉටු කළ සුවිසාල සේවය නිසා එතුමන්ලා වෙත බුහුමන් ප්‍රණාමය පුද කිරීම පිණිස ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය මෙය විශේෂ අවස්ථාවක් කොට ගනියි. අප විසින් එතුමන්ලා අපගේ කෘතහස්ත ගුරු ඇඳුරන් වශයෙන් සැම විටක දී ම සිහියට නැඟිය යුතුව ඇත.

අග්‍රවිනිශ්චයකාර ගරු අශෝක සිල්වා මැතිතුමා අධිකරණ විෂය පිළිබඳ අධ්‍යාපනය හා පුහුණුවීම් කෙරෙහි සුවිශේෂි අවධානයක් යොමු කළේය. අග්‍රවිනිශ්චයකාර ගරු අශෝක ද සිල්වා මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සහාය ලබාගෙන පුහුණු වැඩසටහන් සහ පුහුණුවල අන්තර්ගත කරුණු ප්‍රතිව්‍යුහගත කිරීමට ක්‍රියා කළේය. මහාධිකරණ විනිසුරන් සහ අධිකරණ නිලධාරීන් වෙනුවෙන් වැඩ මුළු ගණනාවක් පවත්වන ලදී. ඒ අනුව, එතුමා සම්මන්ත්‍රණ ගණනාවකට පෞද්ගලිකව ම සහභාගී වී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කටයුතුවලට සහාය ලබාදුණි. මෙම කාලයේ දී පුහුණු අත්පොත් ගණනාවක් පළකරන ලද අතර, අධිකරණ පුහුණුවීම් පවත්වාගෙන යාම පිණිස සම්පත් දායකයන් වශයෙන් තත්කාලයේ සේවයේ නිරත විනිශ්චයකාරවරයන්ගේ මෙන් ම විශ්‍රාමික විනිශ්චයකාරවරයන්ගේ සේවාව ලබා ගැනීමට ද අග්‍රවිනිශ්චයකාරවර ගරු අශෝක සිල්වා මැතිතුමා කටයුතු කළේය. පුහුණුව අවශ්‍ය වන විනිශ්චයකාරවරුන් පුහුණු කිරීම පිණිස මහාධිකරණ විනිසුරුවරුන්ට ආරාධනා කරන ලෙස ගරු අගවිනිසුරු අශෝක සිල්වා මැතිතුමා ආයතනයට උපදෙස් දුන්නේය.

මෙම කාලයේ දී ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය අධිකරණ අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ ස්ථාපිත කරන ලදී. නව ශ්‍රවණාගාරයක්, පරිගණක විද්‍යාගාරයක්, පුස්තකාලයක් සහ විනිශ්චයකාරවරයන් සඳහා නේවාසිකාගාර

සහිතව ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීමට අවශ්‍ය පියවර ගැනීම සම්බන්ධයෙන් එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වශයෙන් කටයුතු කළ සුභද ගම්ලත් මහතාට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සිය කෘතඥතාව පළකර සිටියි. එබැවින් අධිකරණ නිලධරයන් සඳහා නව විනිශ්චයකාරවරයන්ගේ ආයතනයක් ලබාදීමට එතුමා දරන ලද උත්සාහය පිළිබඳව ආයතනය විසින් නිබඳව ම සිය මතකය අවධි කරයි. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සඳහා අවශ්‍ය පරිගණක විද්‍යාගාරය, ශ්‍රවාණාගාරය, පුස්තකාලය සහ ගෘහ භාණ්ඩ ඇතුළු සියලු ම උපකරණ සැපයීමට ක්‍රියා කිරීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සිය ගෞරවය ප්‍රදානය කර සිටියි.

අග්‍රවිනිශ්චයකාර ගරු අශෝක ද සිල්වා මැතිතුමා විශ්‍රාම ගැනීමෙන් පසුව ගරු විනිසුරු ශිරාණි ඒ. බණ්ඩාරනායක මැතිණිය 2011 වර්ෂයේ දී අග්‍රවිනිශ්චයකාර ධුරයට පත් කරන ලද අතර, එතුමිය ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිනිය ලෙස පත් වූවාය. ගරු විනිසුරු ටී.බී.වීරසූරිය මැතිතුමා සහ ගරු විනිසුරු පී.එච්.කේ.කුලතිලක මැතිතුමා ද, 2012 මැයි මාසය වන තෙක් ආයතනයේ සම අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු කළහ. ඉන් අනතුරුව ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් මහාධිකරණ විනිසුරු ධුරය හොබවමින් සිටි ගරු රුවන් ප්‍රනාන්දු මැතිතුමා 2012 ජුනි මාසයේ දී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරන ලද අතර, මහේස්ත්‍රාත්වරයකු වශයෙන් කටයුතු කරන මහී විජේවීර මැතිතුමා ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරක වශයෙන් පත් කරන ලදී.

අග්‍රවිනිශ්චයකාර ගරු ශිරාණි ඒ. බණ්ඩාරනායක මැතිණිය විසින් ප්‍රධානත්වය දරන ලද කළමනාකරණ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කටයුතු සඳහා සහයෝගය ලබා දුන් අතර, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අභිවෘද්ධිය පතා ඉතා වැදගත් දායකත්වයක් සපයන ලදී. මෙම කාලයේ දී, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ගණකාධිකාරීවරයා වැඩ බැලීමේ පදනම මත ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ගණකාධිකාරී වශයෙන් පත් කරන ලදී. එමෙන් ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ඉටු කිරීම පිණිස අධිකරණ රෙජිස්ට්‍රාර්වරයකු සහ කළමනාකරණ සහකාරවරුන් තිදෙනෙකු ද පත් කරන ලදී. එවකට අධිකරණ අමාත්‍යාංශයේ සේවයේ නියුතුව සිටි කණිෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට පත් කිරීමට කටයුතු කළ එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ධුරය හෙබවූ සුභද ගම්ලත් මහතාට ද, මෙහි දී ආයතනය විසින් සිය කෘතඥතාවය පළකර සිටියි. 2012 වර්ෂයේ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලද අතර, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය රෙගුලාසිවලට යටත්ව ආදායම සහ වියදම සම්බන්ධයෙන් බලය අභිනියෝජනය කිරීම පිණිස අනුමැතිය ද ලබාගෙන ඇත. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් සිය වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. එමෙන් ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සේවක සංඛ්‍යාව සකස් කරන ලද අතර, ආයතනයේ පුහුණු වැඩසටහන් කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරු දක්වා ව්‍යාප්ත කරන ලදී. එමෙන් ම, මනාව සංවිධිත නූතන පුහුණු වැඩසටහන් සහ පර්යේෂණ පහසුකම් සහිත ආයතනයක් බවට පත් කිරීම පිණිස මෙම කාලයේ දී පුහුණු

වැඩසටහන් ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කරන ලද අතර, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පහසුකම් නවීකරණය කිරීමට ද පියවර ගන්නා ලදී.

මෙම කාලයේ දී ආයතනයේ ලේකම් කාර්යාලය පිහිටුවීම පිණිස සුදුසු ස්ථානයක් සොයා ගැනීම, පුහුණු වැඩ සටහන් ව්‍යාප්ත කිරීම, Wi-Fi පහසුකම් සඳහා මනාව සැදුම්ලත් පරිගණක විද්‍යාගාරයකින් සංගෘහිත පුස්තකාලයක් පිහිටුවීම පිණිස පුස්තකාල පහසුකම් වැඩිදියුණු කිරීම, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායනයේ (ICTA) සහාය ඇතිව වෙබ් අඩවිය නැවත සක්‍රීය කිරීම, උපරිමාධිකරණවල වාර්තා නොකළ නඩු තීන්දු රැස්කිරීම, විනිසුරුවරයන් සඳහා ආයතනය තුළ නේවාසික පහසුකම් ලබාදීම, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ ඉල්ලීමට අනුව අධිකරණ නිලධරයන් සඳහා පුහුණු අත්පොතක් වැඩිදියුණු කිරීම පිණිස වැඩ කටයුතු ආරම්භ කිරීම, අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, පරිගණක සර්වරය වැනි අවශ්‍ය භෞතික සම්පතක් සැපයීම, පරිගණක මුද්‍රිත පිටපත් සහ ජායා පිටපත් පහසුකම් ආරම්භ කිරීම සහ රාජ්‍ය පරිපාලන සහ මුල්‍ය චක්‍රලේඛවල නියමයන්ට අනුකූලව පරිපාලන කාරණාවන් සම්බන්ධව ක්‍රියාකිරීම සඳහා ප්‍රමුඛස්ථානය ලබාදීම සිදුවී ඇත'

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය මේ සම්බන්ධයෙන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් වෙත සිය ප්‍රණාමය පළ කර සිටින අතර, මේ සම්බන්ධයෙන් ඉටු කළ සේවය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ අධ්‍යයන සම්බන්ධීකාරක මහී විජේවීර මහතාට මෙන් ම ආයතනයේ රෙජිස්ට්‍රාර්වරයා වශයෙන් කටයුතු කළ ඥානපාල මහතා ඇතුළුව ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලයට සිය අවංක කෘතඥතාවය පළ කර සිටිනු ලැබේ.

2013 ජනවාරි මාසයේ දී ගරු මොහාන් පීරිස් මැතිතුමා ශ්‍රී ලංකාවේ අග්‍රවිනිශ්චයකාරවරයා වශයෙන් පත්වීමෙන් අනතුරුව, එතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා බවට පත්විය. අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමා මුල පටන් ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කටයුතුවලට සිය අවංක කැපවීම සහ දායකත්වය පෙන්නුම් කළ අතර, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රගතිය තකා නොසෙල්වී කටයුතු කළ සවිමත් ටැඹක් බවට පත්විය. 2013 අප්‍රේල් මාසයේ දී ආයතනයේ කාර්යාලය පවත්වාගෙන යාම පිණිස අධිකරණ අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ නව කොටසක් හිමි වූ අතර, ඒ සඳහා සපයන ලද දායකත්වය සම්බන්ධයෙන් ආයතනය විසින් අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමාට ස්තුතිය ප්‍රකාශ කර සිටිනු ලැබේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්යාලය වශයෙන් භාවිතා කිරීමට අධිකරණ අමාත්‍යාංශයේ නව ගොඩනැගිල්ලේ කොටසක් සැපයීම සම්බන්ධයෙන් එවකට අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරිය වශයෙන් කටයුතු කළ කමලිනි ද සිල්වා මහත්මියට ආයතනය සිය ස්තුතිය පළ කර සිටිනු ලැබේ.

අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සේවක සංඛ්‍යාව සේවකයන් 09 සිට 23 දක්වා වැඩි කරන ලද අතර, විනිශ්චයකාරවරයන් සමඟ ස්වකීය දැනුම සහ අත්දැකීම් බෙදා හදා ගැනීම පිණිස විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණතාවක් ලබා ඇති විශිෂ්ඨයන් සහ වෘත්තීමය වශයෙන් සුදුසුකම් ලබා ඇති නීති ක්ෂේත්‍රයේ විශිෂ්ඨයන්, විද්වතුන් සහ විශේෂඥවරුන් වෙත ආරාධනා කරන ලදී. ශ්‍රී ලංකා

විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ දී විනිශ්චයකාරවරුන් ඇමතීම පිණිස විදේශීය විනිශ්චයකාරවරුන්ට සහ නීති ක්ෂේත්‍රයේ විශේෂඥයින්ට නිතිපතා ආරාධනා කිරීමට අග්‍රවිනිශ්චයකාර ගරු මොහාන් පිරිස් මහතා අමතක නොකළ අතර, ඒ මගින් ඔවුන්ගේ දැනුම සහ පළපුරුද්ද බෙදා හදා ගැනීමට අවකාශ විවර කළේය. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මෙන් ම විවිධ ස්ථානවල පවත්වන ලද බොහෝ සම්මන්ත්‍රණ, දේශන සහ විවිධ වැඩසටහන් සඳහා අග්‍රවිනිශ්චයකාරවරු ගරු මොහාන් පීරිස් මැතිතුමා පෞද්ගලිකව ම සහභාගී වූ අතර, ඔහුගේ දැනුම සහ පළපුරුද්ද විනිශ්චයකාරවරයන් සමඟ බෙදා හදා ගැනීම කළේය. මෙම කාලය තුළ සාක්ෂි නීතිය සහ සිවිල් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ විනිශ්චයාසන පොත යාවත්කාලීන කිරීම පිණිස කමිටු දෙකක් පත් කරන ලදී.

අග්‍ර විනිශ්චයකාර ගරු මොහාන් පීරිස් මැතිතුමා සිය ධුරයෙහි වැඩ භාර ගැනීමෙන් පසුව විශේෂයෙන් ම නඩු කළමනාකරණය, අධිකරණ කළමනාකරණය, අධිකරණ ආචාර ධර්ම පිළිබඳව විනිශ්චයකාරවරුන් දෙසීයකට අධික පිරිසකට මලයාසියාව, ඉන්දියාව, සිංගප්පුරුව වැනි රටවල විදේශ පුහුණුව ලබා දී ඇත. මෙම කාලය තුළ දී ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරකවරයාගේ තත්වයෙන් ලක්මාල් වික්‍රමසූරිය මහතාගේ සේවය ලබා ගන්නා ලද අතර, එතුමා විනිශ්චයකාරවරුන් සඳහා විදේශීය පුහුණු අවස්ථා සොයා ගැනීම පිණිස කැපවී කටයුතු කරන ලද අතර, ඒ අනුව ආයතනය විසින් දියත් කරන ලද විදේශීය පුහුණු වැඩ සටහන් සියල්ලක්ම සංවිධානය කරන ලදී. එබැවින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වෙනුවෙන් සියලු ම විදේශීය පුහුණු වැඩ සටහන් සංවිධානය කිරීමේ දී සහ සම්බන්ධීකරණය කිරීමේ දී ඒ මහතා විසින් දක්වන ලද කැපවීමට සහ සේවාවට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය ඒ මහතාට ස්තුතිය පළ කිරීමට මෙය අවස්ථාවක් කරගනු ලැබේ.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ ප්‍රගතිය පිණිස සම්පත් දායකයන් වශයෙන් මෙන් ම ආයතනයේ අනෙකුත් වැඩ කටයුතුවලට නිරන්තරයෙන් ම දැක්වූ සහයෝගයට උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන්ට සහ මහාධිකරණ විනිශ්චයාධිකාරවරයන්ට, අධ්‍යයන ප්‍රජාවට මෙන් ම විවිධ වෘත්තිකයින්ට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සිය අවංක කෘතඥතාවය පළ කර සිටිනු ලැබේ. එමෙන් ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ පුහුණු වැඩසටහන්වලට සහයෝගය ලබා දීමේ දී, ප්‍රධාන පෙළේ භූමිකාවක නිරත වෙමින් ඉමහත් සෙතක් සලසන ලද අධිකරණ සේවා කොමිෂන් සභාවේ හිටපු ලේකම් සිසිර රත්නායක මහතා මෙහි දී විශේෂයෙන් ම කෘතඥපූර්වකව සඳහන් කළ යුතුව ඇත.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය වර්තමානයේ දී අධිකරණ පුහුණුව සඳහා වන අන්තර්ජාතික ආයතනයේ (IOJT) සාමාජිකයකු වශයෙන් කටයුතු කරයි. අධිකරණ නිලධාරීන් සඳහා නීති සහ අධිකරණ තොරතුරු ප්‍රචලිත කිරීම අරබයා වෙබ් අඩවියක් සහ ඊ-පුස්තකාලයක් අද වන විට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සතුව පවතී. එමෙන් ම යාපනය, තංගල්ල මහාධිකරණ මෙන් ම අග්‍රවිනිශ්චයකාරයාගේ නිළ මැදිරිය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයට සම්බන්ධ කරන වීඩියෝ

සම්මේලන පහසුකම් (video conferencing facility) ද ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සතුව පවතී. එමෙන් ම පළමු අන්තර්ජාතික දත්ත සංහිතාව වන "මනුපත්‍ර" (Manupatra) නමැති ඉන්දියාවේ වෙබ් අඩවිය ද ආයතනය විසින් මිළ දී ගෙන තිබෙන අතර, මෙම වෙබ් අඩවිය නිසා ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණය, මහාධිකරණය, ඇමෙරිකා එක්සත් ජනපදයේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද නඩු තීන්දු මෙන් ම සාමී මන්ත්‍රී මණ්ඩලයේ නඩු තීන්දුවලට ප්‍රවේශ විමට ද, අවස්ථාව උදා කරගෙන ඇත. ශ්‍රී ලංකාවේ අධිකරණ නිලධරයන් පුහුණු කිරීමේ දී සහ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයට ඉලෙක්ට්‍රොනික පුහුණු මෙවලම් ඇතුළුව පුහුණු අත්පොත් ලබාදීම සම්බන්ධයෙන් ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් අධිකරණ මධ්‍යස්ථානය, මලයාසියාවේ විනිශ්චයකාරවරුන්ගේ ආයතනය, සිංගප්පුරුවේ විනිශ්චයකාරවරුන්ගේ ආයතනය සහ ඉන්දියාවේ අධිකරණ විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ලබාදුන් සහයෝගය ආයතනය විසින් වාර්තා කරගෙන ඇත.

2015 ජනවාරි මාසයේ දී ගරු විනිසුරු කේ. ශ්‍රී පවන් මැතිතුමා අගවිනිසුරු වශයෙන් පත්කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් එතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කලමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා බවට පත් විය. අඛණ්ඩ අධිකරණ පුහුණුවීම් හරහා විනිශ්චයකාරවරයන්ගේ වෘත්තීය ප්‍රමිතිය ඉහල නැංවීම කෙරෙහි අගවිනිසුරු කේ.ශ්‍රී පවන් මැතිතුමා අවධානය යොමු කළ අතර, විනිශ්චයකාරවරයන් සඳහා සිවිල් නීති අංශයේ පුහුණුවීම් පැවැත්වීම පිණිස ගරු විනිසුරු ටී.බී.වීරසුරිය මැතිතුමා උපදේශකවරයෙකු වශයෙන් පත් කරන ලදී. මීට අමතරව, මහාධිකරණ විනිශ්චයකාරවරයන්, අධිකරණ නිලධාරීන් සහ කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරුන් සඳහා අත්‍යාවශ්‍ය වන පුහුණු වීම් ලබා දීම පිණිස ගරු විනිසුරු පී.එච්.කේ.කුලතිලක මැතිතුමා, ගරු විනිසුරු සලීම් මාර්සුෆ් මැතිතුමා, ගරු විනිසුරු පී.ඒ. රත්නායක මැතිතුමා, ගරු විනිසුරු සුරේෂ් චන්ද්‍ර මැතිතුමා සහ ගරු විනිසුරු ඒ.ඩබ්ලිව්.ඒ සලාම් මැතිතුමා වැනි විශ්‍රාමික විනිසුරුතුමන්ලා වෙත ආරාධනා කිරීමට නොපැකිලිව කටයුතු කළේය.

විශ්ව විද්‍යාල විද්වතුන්, වෛද්‍ය වෘත්තිකයන්, තාක්ෂණික විශේෂඥයන්, වෝහාරික විද්‍යාඥයන්, බුද්ධිමය දේපළ නීතිය පිළිබඳ විශේෂඥයන්, වෙළඳ සහ මූල්‍ය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥයන් වැනි අනේකවිධ ක්ෂේත්වල නියැලී සිටින දේශීය මෙන් ම විදේශීය සම්පත් දායකයන්ගේ දැනුම සහ පළපුරුද්ද විනිශ්චයකාරවරයන් සමඟ හුවමාරු කරගැනීම පිණිස මෙම කාලසීමාව තුළ දී ගරු අගවිනිසුරු ශ්‍රී පවන් මැතිතුමාගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් එකී විද්වතුන් වෙත ආරාධනා කරන ලදී. මෙහි දී NATA පනත ක්‍රියාත්මක කිරීම ප්‍රකාරව එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ සහයෝගීතාව ඇතිව චෙක්පත්‍ර සහ ගණුදෙනු පද්ධති යටතේ ගැනෙන බැංකු පරිවයන්, පරිගණක අපරාධ සහ විද්‍යුත් තාක්ෂණය යනා දී විෂයන් ආවරණය විය. මීට අමතරව කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරුන් ඉලක්ක කරගෙන තනාපති වරප්‍රසාද පනත සහ රාජ්‍ය මුක්තිය පිළිබඳ සම්බන්ධයෙන් එක් වැඩමුළුවක් පවත්වන ලදී. ගරු අගවිනිසුරු කේ. ශ්‍රී පවන් මැතිතුමා මෙවැනි වැඩමුළු ගණනාවකට පෞද්ගලිකව ම සහභාගි වෙමින් එහි දී ප්‍රධාන දේශනය ඉදිරිපත් කරන ලදී.

විනිශ්චයකාරවරයන්ගේ අත්පොත යාවත්කාලීන කිරීම පිණිස අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් ගරු විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුතුව එක් කමිටුවක් ද, සාක්ෂි පිළිබඳව විනිශ්චයාසන පොත යාවත්කාලීන කිරීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයාසනය හොබවමින් සිටි ගරු විනිශ්චයකාරවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුතුව එක් කමිටුවක් ද, ගරු අග විනිසුරු කේ. ශ්‍රී පවන් මැතිතුමාගේ සභාපතිත්වය යටතේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලදී. මෙ කාලසීමාව තුළ දී ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සඳහා ලේකම්වරයෙකු, පුස්තකාලයාධිපතිවරයෙකු, දෘඪාංග සහ මෘදුකාංග තාක්ෂණික නිලධාරීවරයන්, කළමනාකරණ සහකාරවරුන් කිහිප දෙනෙකු, ගෘහ පාලකවරයෙකු සහ රියදුරෙකු ද බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

එමෙන් ම, අධිකරණ පරිපාලනය සහ ගිණුම්කරණ කාර්ය පටිපාටි පිළිබඳව අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන්ට පුහුණුවක් ලබාදීමට ද ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් කටයුතු කරන ලදී. මෙම කාලය තුළ දී ම අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් 143 දෙනෙකු සඳහා "අධිකරණ පරිපාලනය, ආයතන සංග්‍රහය සහ අධිකරණ ගිණුම්කරණ පරිචයන්" පිළිබඳව වැඩමුළු 3ක් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පවත්වන ලදී. තව ද, මෙම කාලයේ දී මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත පිළිබඳව කාති විනිසුරුවරුන් 53 දෙනෙකු සඳහා ද වැඩමුළුවක් පවත්වන ලදී.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් 2014 වර්ෂයේ දී මිලටගත් දී මනුපත්‍ර නෛතික දත්ත සංහිතාවට (Manupatra Legal Database) අමතරව, මෙම කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් එකී ආයතනයේ පුස්තකාලය වෙත වෙස්ට්ලෝ නෛතික දත්ත සංහිතාව (Westlaw Legal Database) මිලට ගන්නා ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ සියළුම විනිශ්චයකාරතුමන්ලා සහ කොළඹ මහාධිකරණ විනිශ්චයකාරතුමන්ලා වෙත තනි පුද්ගල රහස්‍ය පද සපයන ලදී. කොළඹින් බැහැර අධිකරණවල විනිසුරුවරුන් විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය හරහා සිදුකරන ලද ඉල්ලීමකට පසුව, මෙම පහසුකම සති දෙකක කාලසීමාවක් ඇතුළත එක් අවස්ථාවක දී කොළඹින් බැහැර සියළුම අධිකරණවල විනිසුරුවරුන් වෙත ව්‍යාප්ත කරන ලදී.

එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහන සහ ලංකා බෙල් සොලියුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ සහයෝගීතාව ඇතිව, විනිශ්චයකාරවරයන්ගේ සුභසිද්ධිය පිණිස පර්යේෂණ සහ බහු සම්බන්ධතා පහසුකමක් සහිතව විනිසුරු නීති දත්ත සංහිතාවක් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමැතිය ප්‍රදානය කරන ලදී. මෙම නීති දත්ත සංහිතාව සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සහ එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහනේ කොන්ත්‍රාත්කරුවකු අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී. මෙම ව්‍යාපෘතිය වනාහි 2016 අයවැය

යෝජනා යටතේ අධිකරණ අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සහ එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහන විසින් ක්‍රියාත්මක කරන ඒකාබද්ධ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ ආධාර වැඩසටහන විසින් උපදේශකවරයෙකු වශයෙන් අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් ගරු විනිසුරුවරයෙකු, නීතිඥවරුන් සහ නීති සිසුන් දැනටමත් බඳවාගෙන ඇත. ශ්‍රී ලංකා නීති වාර්තාවල, නව නීති වාර්තාවල, නීතිඥ සංගමයේ නීති වාර්තාවල සහ ශ්‍රීස්කාන්ත නීති වාර්තාවල වාර්තා කර ඇති නඩු තීන්දු පරිශීලනය කිරීම සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් අධිකරණ අමාත්‍යාංශයේ, නීතිඥ සංගමයේ සහ ශ්‍රී ස්කාන්ත නීති වාර්තාවල සංස්කාරකවරයාගේ අවසරය ලබාගෙන ඇත.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් විනිශ්චයකාරවරයන් 151 දෙනෙකු සහ කම්කරු විනිශ්චයාධිකාරිවල සභාපතිවරුන් 30 දෙනෙකු විදේශ පුහුණු වීම් සඳහා විදේශ රටවලට යැවීම මෙම කාලය තුළ දී ලබාගත් එක් සුවිශේෂී ජයග්‍රහණයක් වේ. මෙම විදේශ පුහුණු වීම් නවදිල්ලි අධිකරණ ඇකඩමිය, ඉන්දියාවේ බෝපාල් නුවර පිහිටි ජාතික අධිකරණ ඇකඩමිය සහ මලයාසියාවේ අධිකරණ සහ නීති පුහුණු ආයතනය විසින් පවත්වන ලදි.

මෙම කාලය තුළ දී, ගරු අගවිනිසුරු ශ්‍රී පවන් මැතිතුමාගේ සභාපතිත්වය යටතේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ලබාගත් දෙවන සුවිශේෂී ජයග්‍රහණය වන්නේ උපරිමාධිකරණවල සේවයේ නියුතු සියළු ම විනිශ්චයකාරවරයන් සඳහා මෙන් ම ස්ථිර සේවයේ නියුතු අනෙකුත් සියළු ම විනිශ්චයකාරවරයන් සඳහා සහ කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරුන් සඳහා ද ලැප්ටොප් පරිගණක 294 ක් බෙදා දීමයි. ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට ලබාගැනීමට ඉඩප්‍රස්ථාව සලසා තිබෙන අරමුදල්වලින් අධිකරණ අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් මෙම පරිගණක මිලදී ගෙන ඇත.

2017 වසරේ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය "SLJI NET" - "ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මාර්ගගත නීති තොරතුරු ජාලය" දියත් කරන ලදී. එය නීතිමය තොරතුරු පිළිබඳ පළමු විනිසුරුවරුන්ගේ මාර්ගගත දත්ත සංහිතාව වේ. "SLJI NET" මඟින් වැදගත් නඩු නීති සහ නීතිමය තොරතුරු විෂය අනුව ශ්‍රී ලංකාවේ විනිසුරුවරුන්ට පමණක් ප්‍රවේශය සපයයි. "SLJI NET" ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ සහ ශ්‍රී ලංකා මහාධිකරණවල වාර්තා කර ඇති සහ වාර්තා නොකළ නඩු තීන්දු, පනත්, විදේශ නඩු තීන්දු, වාර්තා සහ පුවත් ලිපි වෙත විෂයානුබද්ධ ප්‍රවේශය සඳහා විනිසුරුවරුන්ට පරිශීලක-හිතකාමී දත්ත ගබඩාවක් සඳහා ආධාරක මෙවලමක් වීමට අදහස් කරයි. එය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආධාර වැඩසටහනේ සහාය ඇතිව ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පර්යේෂණ අංශය මඟින් ශ්‍රී ලංකාවේ විනිසුරුවරුන්ට විෂයානුබද්ධ නීතිමය දත්ත සංහිතාවකට පිවිසීම පිණිස සඳහා නිර්මාණය කර ඇත.

ගරු එම්.ආර්.සී. ප්‍රනාන්දු මැතිතුමාගේ ඉල්ලා අස්වීමෙන් පසුව, 2017 වර්ෂයේ දී, ගරු විනිශ්චයකාර ඊ.ඒ.ජී.ආර්. අමරසේකර මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සභාපති වශයෙන් පත්කරන ලදී. 2018 වසරේදී, ගරු විනිසුරු ජනක් ද සිල්වා මහතා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නියෝජ්‍ය

අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. ගරු විනිසුරු ඊ.ඒ.ජී.ආර් අමරසේකර මහතා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් පසුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකාරණ මණ්ඩලය විසින් ගරු විනිසුරු ජනක් ද සිල්වා මහතා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. ඉන්පසුව, මහාධිකරණ විනිසුරු ගරු එම්.පී.ඩී සිල්වා මහතා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරයයට පත්කරන ලදී. එම වසරේ දී ම, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරක ලෙස ඩී.එම්.ඒ සෙනෙවිරත්න මහතා පත් කරන ලදී.

2019 වර්ෂයේ දී, ගරු විනිසුරු ජනක් ද සිල්වා මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්වීමෙන් පසුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකාරණ මණ්ඩලය විසින් ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරු එල්.ටී.බී. දෙහිදෙණිය මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ ධුරයට පත්කරන ලදී.

2020 වර්ෂයේ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමණාකරන මණ්ඩලය විසින් ගරු ෆ්‍රෑන්ක් ගුණවර්ධන මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ධුරයට පත්කරන ලදී. ගරු එල්.ටී.බී. දෙහිදෙණිය මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්වීම භාරදීමෙන් පසුව, 2021 වර්ෂයේ දී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකාරණ මණ්ඩලය විසින් ගරු ෆ්‍රෑන්ක් ගුණවර්ධන මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ වැඩබලන අධ්‍යක්ෂ ධුරයට පත්කරන ලදී.

2022 වර්ෂයේදී, ගරු විනිසුරු මහින්ද සමයවර්ධන මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයෙේ අධයක්ෂ ධුරයට පත්වන ලදී. එමෙන්ම, ගරු ලක්මාල් වීරසූරිය මැතිතුමා මෙම ආයතනයේ නියෝජ්‍ය අධයක්ෂ ධුරයට පත්වන ලදි. 2023 වර්ෂයේදී, ගීතානි විජේසිංහ මිය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරක ලෙස පත් කරන ලදී. මෙයට අමතරව, ගරු විනිසුරු එල්.ටී.බී. දෙහිදෙනිය මැතිතුමා විශ්‍රාම යාම හේතුවෙන්, ගරු විනිසුරු ඊ.ඒ.ජී.ආර්. අමරසේකර මැතිතුමා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. ගරු විනිසුරු බුවනෙක අළුවිහාරේ මැතිතුමා විශ්‍රාම ගැනීමෙන් පසුව, ජනාධිපති නීතිඥ ගරු විනිසුරු ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. එපමණක් නොව, අභියාචනාධිකරණයේ හිටපු ගරු සභාපති විනිසුරු ඒ.ඩබ්ලිව්.ඒ. සලාම් මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ උපදේශකයෙකු ලෙස පත් කරන ලදී..

2024 දී, ඩී.එම්. ජයරුවන් දිසානායක මයා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරක ලෙස පත් කරන ලද අතර ඔහු මෙම ආයතනයෙහි උන්නතිය සඳහා ඉමහත් කැපවීමක් කළේය. ගරු විනිසුරු විජිත් කුමාර මලල්ගොඩ මැතිතුමා විශ්‍රාමයෑමෙන් පසු, ගරු විනිසුරු ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලද

අතර, ගරු විනිසුරු ප්‍රියන්ත ජයවර්ධන මැතිතුමා විශ්‍රාම විශ්‍රාමයෑමෙන් පසු ජනාධිපති නීතිඥ ගරු විනිසුරු මුර්දු එන්.බී. ප්‍රනාන්දු මැතිණිය එම තනතුරට පත් කරන ලදී. පසුකාලීනව අගවිනිසුරු ජනාධිපති නීතිඥ ජයන්ත ජයසූරිය මහතා විශ්‍රාම යාම හේතුවෙන්, නව අගවිනිසුරු ගරු මුර්දු එන්.බී. ප්‍රනාන්දු මැතිණිය කළමනාකරණ මණ්ඩලයේ සභාපති ධූරයට පත් කරන ලදී. ඒ අනුව, ගරු විනිසුරු පී. පද්මන් සූරසේන මැතිතුමා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. තවද, අභියාචනාධිකරණයේ හිටපු ගරු විනිසුරු ආචාර්ය රුවන් ප්‍රනාන්දු මැතිතුමා අභියාචනාධිකරණයේ හිටපු ගරු සභාපති විනිසුරු ඒ.ඩබ්ලිව්.ඒ. සලාම් මැතිතුමාගේ උපදේශක කාලයෙන් පසු ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ උපදේශකයෙකු ලෙස පත් කරන ලදී.

2024 වර්ෂයේදී, සියලු පාර්ශවකරුවන් සමඟ පැවති රැස්වීමකින් පසුව, 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතන පනතේ 08 වන වගන්තිය මගින් නියම කර ඇති පරිදි වෙනම අරමුදලක් නිර්මාණය කිරීම සඳහා අඩිතාලම දමන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයෙහි ස්වාධීනත්වය ස්ථාපිත කිරීම සඳහා මෙය පදනම විය. කළමනාකරණ මණ්ඩලය විසින්, විශේෂයෙන්ම 2024 වර්ෂයේදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඌ (1) වගන්තිය සහ 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතන පනතේ 5 වන වගන්තිය දක්වා සිටිමින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය අධිකරණ සේවා කොමිෂන් සභාවේ එකම පුහුණු අංශය බව නැවත නැවතත් අවධාරණය කරන ලදි. අධිකරණ සේවා කොමිෂන් සභාවට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විනිසුරුවරුන් පුහුණු කිරීම සම්බන්ධයෙන් නීති සම්පාදනය කිරීමට බලය පවරා ඇත. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතේ 5 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකාවේ අධිකරණ පුහුණු කටයුතු සිදුකරීමට ව්‍යවස්ථාපිතව බලය පවරන ලද එකම ආයතනය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයයි. අධිකරණ සේවා කොමිෂන් සභාව ශ්‍රී ලංකා විනිසුරුවරුන්ගේ ආයතනය විසින් පුහුණුව සඳහා විනිසුරුවරුන් යොමු කරනු ලබන අතර විනිසුරුවරුන්ගේ අනෙකුත් උසස් අධ්‍යයන කටයුතු සඳහා අරමුදල් සපයයි.

තවද, 2024 වර්ෂයේදී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ සේවක සංඛ්‍යාව වැඩි දියුණු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව, අභ්‍යන්තර විගණක, ඇගයීම් සහ අධීක්ෂණ නිලධාරී, පරිපාලන නිලධාරී, ලඝුලේඛක/යතුරුලේඛක, භාෂා පරිවර්තක සහ මූල්‍ය සහකාර යන තනතුරු නිර්මාණය කරන ලදී. ඊට අමතරව, විනිශ්චයකාරවරයන්ගේ ආයතනයෙහි කාර්ය මණ්ඩලය සහ උපදේශකයින් රඳවා තබා ගැනීම සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන ලදී. තවද, අර්බුදය අතරතුර රජය විසින් පනවන ලද සීමාවන් ලිහිල් කිරීමත් සමඟ, වසර තුළ ආයතනයෙහි කාර්ය මණ්ඩල බඳවා ගැනීම් 9 සිට 20 දක්වා වැඩි කරන ලදී. පරිගණක, ලැප්ටොප්, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ප්‍රක්ෂේපන සහ තිර (screen) වැනි උපකරණ සැපයීමේදී යුනිසෙෆ් හි සහාය ද අගය කළ යුතුය.

ගරු අගවිනිසුරු මුර්දු එන්. බී. ප්‍රනාන්දු මැතිතුමිය විශ්‍රාම ගැනීමෙන් පසුව, 2025 වසරේදී ගරු විනිසුරු පී. පද්මන් සූරසේන මැතිතුමා ශ්‍රී ලංකාවේ අග්‍රවිනිශ්චයකාරවරයා ලෙස පත් කරන ලද අතර, එම ධුරයේ බලතල ප්‍රකාරව, ඔහු ස්වයංක්‍රීයවම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා බවට පත් විය. ගරු විනිශ්චයකාර ඊ. ඒ. ජී. ආර්. අමරසේකර මහතා විශ්‍රාම ගැනීමට මත, ගරු විනිසුරු මහින්ද සමයවර්ධන මැතිතුමා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. තවද, හිටපු අග්‍රවිනිශ්චයකාරවරියගේ විශ්‍රාම ගැනීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා ගරු විනිසුරු අර්ජුන ඔබේසේකර මැතිතුමා ද කළමනාකරණ මණ්ඩලය වෙත පත් කරනු ලැබීය.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ, ගරු විනිසුරු මහින්ද සමයවර්ධන මැතිතුමා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමත් සමඟ, ගරු විනිසුරු සම්පත් බී. අබේකෝන් මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කරන ලදී. මීට අමතරව, ජයරුවන් දිසානායක මහතා අධිකරණ සේවා කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා ලෙස පත් වීමෙන් පසුව, ටී. ඒ. ඩී. සී. කේ. රත්නායක මහත්මිය එම ආයතනයේ අධ්‍යයන සම්බන්ධීකාරක ලෙස පත් කරනු ලැබීය. ගරු ඒ. එල්. බී. වික්‍රමසූරිය මැතිතුමා විශ්‍රාම ගැනීමෙන් පසුව, ගරු ජී. එල්. ප්‍රියන්ත මැතිතුමා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා ලෙස තාවකාලිකව පත් කරන ලදී.

2025 දෙසැම්බර් මාසයේදී, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ කාර්ය මණ්ඩලයට අභ්‍යන්තර විගණකවරයෙකු, අධීක්ෂණ සහ ඇගයීම් නිලධාරියෙකු, පර්යේෂණ නිලධාරියෙකු, පරිපාලන නිලධාරියෙකු සහ කළමනාකරණ සහකාරවරුන් තිදෙනෙකු බඳවා ගනිමින් පත්වීම් ලබා දෙන ලදී

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ට සහ එහි කාර්ය මණ්ඩලයට, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමාට සහ කාර්ය මණ්ඩලයට භාණ්ඩාගාර ලේකම්ට සහ කාර්ය මණ්ඩලයට; විගණකාධිපතිට සහ කාර්ය මණ්ඩලයට; මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාර්යාලයට (UNODC); CEELI ආයතනයට, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපද නියෝජිතායතනය (USAID), එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනට (UNDP), JURE ව්‍යාපෘතිය යටතේ වන එක්සත් ජාතීන්ගේ ළමා අරමුදලට (UNICEF), ජාත්‍යන්තර සාමය සහ නීතියේ පාලනය සඳහා වන මැක්ස් ප්ලෑන්ක් පදනමට,ආසියානු සංවර්ධන බැංකුවට,US Department of Justice ආයතනයට,ජාත්‍යන්තර නීතිවේදීන්ගේ කොමිසමට (ICJ), ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානයට, CCC -ICLP ජාත්‍යන්තර ADR මධ්‍යස්ථානයට, ඉන්දියාවේ බෝපාල් නුවර පිහිටි ජාතික අධිකරණ ඇකඩමිය, ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සහ අනෙකුත් අරමුදල් සපයන ආයතනවලට මෙන්ම ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය මණ්ඩලයට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සිය ස්තුතිය පුදකර සිටියි.

(History from 1985-1991 Courtesy Judges' Journal Vol. 1)

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රධාන උපායමාර්ගික අරමුණු

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ:

1. අධිකරණ නිලධරයන් විසින් අධිකරණමය සහ නෛතික කාරණා සම්බන්ධයෙන් ස්වකීය මතයන් සහ අදහස් හුවමාරු කරගැනීම සඳහා පහසුකම් සැලැස්වීම;
2. අධිකරණ නිලධරයන්ගේ වෘත්තීය ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීමේ සහ ඔවුන්ගේ දැනුම සහ කෞශල්‍යය වර්ධනය කිරීමේ අදහසින් රැස්වීම්, සම්මේලන, දේශන, වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධාන කිරීම සහ පැවැත්වීම;
3. යුක්තිය පසිදලීම පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් පුහුණුවීම් සහ පර්යේෂණ පාඨමාලා සකස් කිරීම සහ පැවැත්වීම;
4. අධිකරණ නිලධරයන් සඳහා පුස්තකාල පහසුකම් හා වෙනත් අධ්‍යාපනික උපකරණ සැපයීම.

- **ප්‍රධාන කාර්ය සාධන ඉලක්ක**

1.1 මූල්‍ය කාර්ය සාධන ඉලක්ක

- මුදල් රෙගුලාසි සහ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව අනුමත වාර්ෂික අයවැය ප්‍රතිපාදන 100%ක් උපයෝජනය කර ගැනීම.
- ප්‍රතිපාදන වෙන්කිරීම් සහ ගෙවීම්:
  මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන් වෙත පශ්චාත් උපාධි අනුග්‍රහයන් ලබාදීම සඳහා රුපියල් මිලියන 4.2 ක් සහ
  කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් වෙත ලබාදෙන පශ්චාත් උපාධි අනුග්‍රහයන් සඳහා රුපියල් මිලියන 0.5 ක් වශයෙන්
- අනුමත සීමාවන් තුළ පරිපාලන පොදු කාර්ය පිරිවැය පවත්වා ගැනීම, මූලික පුහුණුව සහ ධාරිතා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා උපරිම වෙන් කිරීමක් සහතික කිරීම.
- පුහුණු වැඩසටහන්, ප්‍රකාශන සහ අනුග්‍රාහකත්වයන්ට අදාළ ගෙවීම් කාලෝචිත ලෙස (දින 30ක් ඇතුළත) පියවීම සහතික කිරීම.
- පහත සඳහන් දෑ සාක්ෂාත් කර ගැනීම සඳහා අභ්‍යන්තර මූල්‍ය පාලනයන් ශක්තිමත් කිරීම:
  සුවිශේෂී වැදගත්කමක් ඇති විගණන විමසීම් නොමැතිවීම.
  මූල්‍ය රෙගුලාසි, අදාළ චක්‍රලේඛ සහ අනෙකුත් අදාළ රෙගුලාසි වලට පූර්ණ ලෙස අනුකූල වීම.
- වෙන් කරන ලද අයවැය ඉක්මවා නොයා සියලුම සැලසුම් කළ පුහුණු වැඩසටහන් සඳහා සහාය වීම සඳහා පවතින අරමුදල් භාවිතා කිරීම සහ ප්‍රශස්ත කිරීම.

1.2 සංවර්ධන කාර්ය සාධන ඉලක්ක

- සමස්තයක් ලෙස
  - මහාධිකරණ විනිසුරුවරුන්, අධිකරණ නිලධාරීන් සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් සඳහා පුහුණු වැඩසටහන් 24 ක් පැවැත්වීම.
  - අලුතින් බඳවාගත් අධිකරණ නිලධාරීන් සඳහා වන අධිකරණ සේවාරම්භක පුහුණු වැඩසටහන්වල සැසි 84 ක් පැවැත්වීම.
- නව නීතීන්හි වර්ධනයන්, ඩිජිටල් පරිවර්තනය සහ අධිකරණ ආචාර ධර්ම පිළිබිඹු කරන යාවත්කාලීන පුහුණු විෂයමාලා සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම.
- පහත සඳහන් පාර්ශවයන් සඳහා පශ්චාත් උපාධි ශාස්ත්‍රීය ප්‍රගමන අවස්ථා ලබා දීම:
  - මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන්.
  - කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්.
- පහත සඳහන් ක්‍රමවේදයන් ඔස්සේ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම:
  - මූලාශ්‍ර ද්‍රව්‍ය (resource materials) සහ පුහුණු මොඩියුලයන් වැඩිදියුණු කිරීම.
  - පර්යේෂණ මත පදනම් වූ අධිකරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම
  - ආයතනික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.
- බරිත කාර්ය සාධන දර්ශක මත පදනම්ව, 100% ට වැඩි සමස්ත භෞතික ප්‍රගතියක් ලබා ගැනීම
- පහතින් දැක්වෙන ප්‍රමුඛතා ක්ෂේත්‍රවල වෘත්තීය නිපුණතා සංවර්ධනය පුළුල් කිරීම:
  - වාණිජ නීතිය
  - කම්කරු නීතිය
  - අපරාධ යුක්තිය ප්‍රතිසංස්කරණ
  - නඩු ප්‍රවාහ කළමනාකරණය
  - අධිකරණ ආචාර ධර්ම සහ ඒකාබද්ධතාවය

1.3 මෙහෙයුම් ඉලක්ක

1.3.1 ප්‍රතිදාන මට්ටමේ ඉලක්ක

- සැලසුම් කළ පුහුණු වැඩසටහන් 100%ක් සම්පූර්ණ කිරීම.
- එක් වැඩසටහනකට නම් කරන ලද අධිකරණ නිලධාරීන්ගේ අවම පැමිණීමේ අනුපාතය 90% ක් සහතික කිරීම.
- සෑම සේවාරම්භක වැඩසටහන්ම කාලෝචිත ලෙස (නියමිත කාර්තු ඇතුළත) නිම කිරීම සහතික කිරීම.

1.3.2 ප්‍රතිඵල මට්ටමේ ඉලක්ක

- අධිකරණ දැනුම සහ නිපුණතා වැඩි දියුණු කිරීම

- ව්‍යුහගත සේවාරම්භක පුහුණුව තුළින් අධිකරණ වගකීම් සඳහා අලුතින් පත් කරන ලද අධිකරණ නිලධාරීන්ගේ සූදානම වැඩි දියුණු කිරීම.
- සුදුසුකම් ලත් අධිකරණ නිලධාරීන් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නියැලීම් වැඩි කිරීම.
- පහත සඳහන් දෑ සඳහා දායක වීම
  - තීන්දු ප්‍රකාශවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම
  - කාර්ය පටිපාටික දෝෂ (procedural errors) අවම කිරීම
  - අධිකරණ ස්වාතන්ත්‍රියභාවය ශක්තිමත් කිරීම

1.3.3 ආයතනික කාර්ය සාධන දර්ශක

- සිව්වන කාර්තුව (Q4) අවසන් වන විට සමස්ත බරිත භෞතික ප්‍රගතිය 100% ඉක්මවා ළඟා කර ගැනීම.
- වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාව වාර්ෂික සැලැස්මෙන් 95% කට වඩා ඉහළ මට්ටමක පවත්වා ගැනීම.
- සියලුම ක්‍රියාකාරකම් අනුමත වාර්ෂික කාලරාමුව (පළමු කාර්තුවේ සිට සිව්වන කාර්තුව දක්වා / Q1–Q4) තුළ අවසන් කිරීම සහතික කිරීම.
- වලංගු පරිපාලනමය හේතු දැක්වීමකින් තොරව, සැලසුම් කරන ලද වැඩසටහන් අවලංගු වීම් ශූන්‍ය (0%) මට්ටමක පවත්වා ගැනීම

- **ජාතික ප්‍රතිපත්ති සමඟ අනුකූලතාවයක් දැක්වීම**

ශ්‍රී ලංකා **විනිශ්චයකාරවරයන්ගේ** ආයතනයේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම්, නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම, යහපාලනය ප්‍රවර්ධනය කිරීම සහ යුක්තිය පසිඳලීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගත් ජාතික ප්‍රතිපත්ති රාමුවන් සහ උපායමාර්ගික ප්‍රමුඛතාවන් සමඟ අනුකූල වේ. තම කාර්යභාරය ඉටු කිරීමේදී, මෙම ආයතනය පහත සඳහන් උපායමාර්ගික මැදිහත්වීම් හරහා ජාතික සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වේ:

1. **නීතියේ ආධිපත්‍යය සහ ව්‍යවස්ථාපිත පාලනය ප්‍රවර්ධනය කිරීම**

   ආයතනයේ අධිකරණ අධ්‍යාපන වැඩසටහන් මඟින් ව්‍යවස්ථාපිත වටිනාකම්, අධිකරණයේ ස්වාධීනත්වය, බලතල බෙදීම සහ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තහවුරු කරනු ලබයි. එමඟින්, ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ නීතියේ ආධිපත්‍යය සුරැකීම සඳහා වන ජාතික කැපවීම්වලට ආයතනය සහයෝගය දක්වයි.

2. **යහපාලනය සහ මහජන විශ්වාසය ශක්තිමත් කිරීම**

   අධිකරණයේ අඛණ්ඩතාව, වගවීම, විනිවිදභාවය සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම මඟින්, මෙම ආයතනය යහපාලනය, දූෂණ විරෝධය සහ රාජ්‍ය ආයතන කෙරෙහි මහජන විශ්වාසය ඉහළ නැංවීම පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සමඟ තම ක්‍රියාකාරකම් අනුකූල කර ගනියි.

3. **යුක්තිය සඳහා ඇති ප්‍රවේශය පුළුල් කිරීම**

   නඩු කළමනාකරණය, විකල්ප ආරවුල් විසඳීමේ ක්‍රමවේද (ADR), කාර්ය පටිපාටික කාර්යක්ෂමතාව සහ කඩිනම් විනිශ්චය පිළිබඳ පුහුණු මුලපිරීම් මඟින්, ගොඩගැසී ඇති නඩු ප්‍රමාණය අවම කිරීමටත් යුක්තිය සඳහා ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීමටත් දායක වේ. මෙය කාලෝචිත සහ ඵලදායී ලෙස යුක්තිය පසඳලීම් සහතික කිරීමේ ජාතික ප්‍රමුඛතාවලට අනුකූල වේ.

4. **රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය**

   අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් හරහා, රාජ්‍ය අංශය තුළ සිටින අධිකරණ නිලධාරීන්ගේ නිපුනතාව, වෘත්තීයභාවය සහ ආයතනික ධාරිතාව ශක්තිමත් කරමින්, මෙම ආයතනය ජාතික මානව සම්පත් සංවර්ධන උපායමාර්ග සඳහා දායකත්වය සපයයි.

5. **අධිකරණ ප්‍රතිසංස්කරණ සහ ආයතනික ශක්තිමත් කිරීම්**

   නව නෛතික ගැටලු, උසාවි නවීකරණය සහ කාර්යසාධනය ඉහළ නැංවීම පිළිබඳ පර්යේෂණ, ප්‍රතිපත්තිමය සංවාද සහ විශේෂිත පුහුණු කිරීම් මඟින් මෙම ආයතනය ජාතික ප්‍රතිසංස්කරණ

මූලපිරීම්වලට සහය දක්වන අතර, එමඟින් සමස්ත අධිකරණ ආයතන ශක්තිමත් කිරීම සඳහා දායක වේ.

6. අධිකරණ ක්ෂේත්‍රය ඩිජිටල්කරණය සහ තාක්ෂණය භාවිතය

රාජ්‍ය අංශයේ සේවා සැපයීම නවීකරණය කිරීම සහ අධිකරණ පද්ධතිය තුළ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කරගත් ජාතික ඩිජිටල් පරිවර්තන ප්‍රතිපත්තිවලට අනුකූලව, අධිකරණයන්හි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

7. ස්ත්‍රී පුරුෂ සමාජභාව සමානාත්මතාව සහ සමාජීය ඇතුලත්භාවය (Social Inclusion)

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, ළමා ආරක්ෂණය සහ අවදානමට ලක්විය හැකි මෙන්ම ආන්තික කණ්ඩායම්වල අයිතිවාසිකම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින්, ආයතනය සිය පුහුණු විෂයමාලා සඳහා සමානාත්මතාවය, වෙනස් කොට නොසැලකීම සහ සියල්ලන් ඇතුළත් කරගැනීමේ මූලධර්ම සමෝධානය කරයි.

8. ජාත්‍යන්තර බැඳීම් සහ හොඳම භාවිතයන් (Best Practices) අනුගමනය කිරීම

ජාත්‍යන්තර නීති ප්‍රමිතීන්, සංසන්දනාත්මක නීති අධ්‍යයන සහ ගෝලීය වශයෙන් පිළිගත් හොඳම භාවිතයන් සිය වැඩසටහන්වලට ඇතුළත් කිරීම මඟින්, ජාත්‍යන්තර ගිවිසුම් සහ සම්මුතීන් යටතේ ශ්‍රී ලංකාව සතු බැඳීම් ඉටු කිරීමට ආයතනය සහය වන අතරම, ඒවා ජාතික නීති රාමුව තුළ ක්‍රියාත්මක කිරීම සහතික කරයි.

9. තිරසාර සංවර්ධනය සහ පාරිසරික පාලනය


පරිසර නීතිය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්, පරිසර ආරක්ෂණය, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇති ජාතික ප්‍රතිපත්ති සඳහා දායක වේ.

10. හවුල්කාරිත්වයන් හරහා ධාරිතා වර්ධනය

ආයතනික තිරසාරභාවය සහ දැනුම හුවමාරු කර ගැනීම ඉහළ නැංවීම සඳහා, ජාතික සහ ජාත්‍යන්තර ආයතන, විශ්වවිද්‍යාල, වෘත්තීය ආයතන සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරනු ලබන්නේ, අන්තර්-ආයතනික සහයෝගීතාව සහ ධාරිතා සංවර්ධනය පිළිබඳ රජයේ ප්‍රතිපත්තියට අනුකූලවය.

සංවිධාන ව්‍යුහය

- **සංවිධාන සටහන**



- **ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහ එක් එක් අංශවල භූමිකාවන් සහ වගකීම්**

  - **ජ්‍යෙෂ්ඨ කළමනාකරණය - භූමිකාවන් සහ වගකීම්**

උපායමාර්ගික නායකත්වය සැපයීම, ඵලදායී පාලනය සහතික කිරීම සහ ආයතනයේ අධ්‍යයන හා පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය,සාමූහිකව වගකිව යුතුය. ඔවුන්ගේ ප්‍රධාන භූමිකාවන් සහ වගකීම් අතරට පහත සඳහන් දැ ඇතුළත් වේ:

- ආයතනයේ, දැක්ම, මෙහෙවර සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපායමාර්ගික මඟ පෙන්වීම සහ නායකත්වය සැපයීම.
- අධිකරණ අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් ඵලදායී ලෙස සැලසුම් කිරීම, සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම සහතික කිරීම.
- අදාළ නීති, රෙගුලාසි සහ ප්‍රතිපත්තිවලට අනුකූලව ආයතනයේ සමස්ත පරිපාලනය සහ එදිනෙදා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- මනා මූල්‍ය කළමනාකරණය, අයවැය පාලනය සහ රජයේ මූල්‍ය රෙගුලාසි සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහතික කිරීම.
- අනුමත ප්‍රතිපත්ති, තීරණ සහ උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීමෙන් කළමනාකරණ මණ්ඩලයට සහාය වීම.
- සියලුම පුහුණු සහ ධාරිතා වර්ධන වැඩසටහන්වලදී අධ්‍යයන ගුණාත්මකභාවය, අදාළත්වය සහ අඛණ්ඩතාව පිළිබඳ ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම.
- ඵලදායී ලෙස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා විනිසුරුවන්, ශාස්ත්‍රඥයින්, සම්පත්දායකයින්, උපදේශකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කිරීම.
- අධිකරණ අධ්‍යාපනයේ පර්යේෂණ, විෂයමාලා සංවර්ධනය, නවෝත්පාදන සහ හොඳම භාවිතයන් අනුගමනය කිරීම ප්‍රවර්ධනය කිරීම.
- ආයතනික ක්‍රියාවලීන් සහ තීරණ ගැනීමේදී විනිවිදභාවය, වගවීම සහ යහපාලනය සහතික කිරීම.
- කාර්යක්ෂම සේවාවක් සැපයීම සහතික කිරීම සඳහා මානව සම්පත් කළමනාකරණය, කාර්ය මණ්ඩල අධීක්ෂණය සහ කාර්ය සාධන අධීක්ෂණ කටයුතු පාලනය කිරීම
- අවශ්‍ය පරිදි ජාතික හා ජාත්‍යන්තර සංසද, සහයෝගිතා සහ වෘත්තීය කටයුතුවලදී ආයතනය නියෝජනය කිරීම.
- ආයතනික වාර්තා, ඇගයීම් සහ නිර්දේශ සකස් කිරීම, සමාලෝචනය කිරීම සහ අදාළ බලධාරීන්ට ඉදිරිපත් කිරීම.
- ප්‍රතිපත්ති සංවර්ධනය, ආයතනික ශක්තිමත් කිරීම් සහ දිගුකාලීන ධාරිතා ගොඩනැගීම් කටයුතු පිළිබඳව උපදෙස් දීම.

❖ **පරිපාලන අංශය - කාර්යභාරයන් සහ වගකීම්**

ශ්‍රී ලංකා **විනිශ්චයකාරවරයන්ගේ** ආයතනයේ පරිපාලන අංශය, ආයතනික කටයුතු සුමටව පවත්වාගෙන යාම තහවුරු කිරීම, අධිකරණ පුහුණු වැඩසටහන් සඳහා සහය දැක්වීම, කාර්යාලීය යටිතල පහසුකම් නඩත්තු කිරීම සහ අභ්‍යන්තර මෙන්ම බාහිර පාර්ශවකරුවන් වෙත කාර්යක්ෂම සේවාවන් සැපයීම සම්බන්ධයෙන් වගකීම දරනු ලබයි. මෙම අංශය අධීක්ෂණ සහ ඇගයීම් නිලධාරී, පරිපාලන නිලධාරී, කළමනාකරණ සහකාරවරුන්, පොත් බඳින්නන්, රියදුරන්, කාර්යාල කාර්ය සහායකයින් සහ අනෙකුත් සහායක කාර්ය මණ්ඩල තනතුරුවලින් සමන්විත වේ.

1. පරිපාලන කළමනාකරණය සහ අධීක්ෂණය

- පරිපාලන කාර්යාලයේ දෛනික කටයුතු සංවිධානය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- පරිපාලන සහ සහායක කාර්ය මණ්ඩලයේ රාජකාරි පැවරීම, නිරීක්ෂණය කිරීම සහ සමාලෝචනය කිරීම.
- ආයතනික නීති, රෙගුලාසි, ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටිවලට අනුකූලතාව පවත්වා ගැනීම.
- සේවා සැපයීම ඉහළ නැංවීම සඳහා ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සහ නවීකරණ මුලපිරීම් ක්‍රියාත්මක කිරීම.
- ආයතනික වාර්තා පවත්වා ගැනීම, නිවේදන, වාර්තා සහ අනෙකුත් නිල ලේඛන සකස් කිරීම.
- කාර්යාලීය සම්පත්, අරමුදල් සහ වත්කම්වල ආරක්ෂාව, සුරක්ෂිතතාව සහ නිසි පරිහරණය සහතික කිරීම.
- කාර්යාල පරිශ්‍රය තුළ සනීපතා සිදු කරනු ලබන පිරිසිදු කිරීම්, සනීපාරක්ෂක සහ ඩෙංගු මර්දන කටයුතු අධීක්ෂණය කිරීම.
- සේවා අවශ්‍යතා මත සති අන්තවල හෝ රජයේ නිවාඩු දිනවල රාජකාරිය සඳහා වාර්තා කිරීම.

2. ප්‍රසම්පාදන, ඉන්වෙන්ටරි (තොග) සහ වත්කම් කළමනාකරණය

- කාර්යාලීය උපකරණ, පරිභෝජන ද්‍රව්‍ය සහ සුළු මිලදී ගැනීම් සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- ඉන්වෙන්ටරි ලේඛන (Inventory Registers), භාණ්ඩ ලැබීම් සටහන් (GRN) සහ පරිභෝජන ද්‍රව්‍ය ලේඛන පවත්වාගෙන යාම.
- වාර්ෂික භෞතික තොග සත්‍යාපනය සහ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල (Board of Survey) කටයුතු සැලසුම් කිරීම සහ පැවැත්වීම.
- පහත සඳහන් දෑ ඇතුළත් ආයතනික වත්කම් නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ සේවා ගිවිසුම් සම්බන්ධීකරණය කිරීම:
    - පරිගණක, මුද්‍රණ යන්ත්‍ර (printers), වායුසමීකරණ යන්ත්‍ර සහ ඡායා පිටපත් යන්ත්‍ර
    - වාහන

- ගොඩනැඟිලි සහ ශ්‍රවණාගාරය

- කල් ඉකුත් වූ/භාවිතයෙන් ඉවත් කළ භාණ්ඩ වෙන්දේසි කිරීම ඇතුළු බැහැර කිරීමේ කටයුතු හැසිරවීම.
- වාහන ධාවන සටහන් (log records) සමාලෝචනය කිරීම සහ ඉන්ධන ලබා ගැනීම් මෙන්ම නඩත්තු අවශ්‍යතා සම්බන්ධීකරණය කිරීම.

3. අධිකරණ පුහුණු සහ සමුළු සඳහා සහාය වීම

- විනිසුරුවරුන් සඳහා වන සමුළු, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් (මාර්ගගත සැසි ද ඇතුළුව) සංවිධානය කිරීම.
- ආරාධනා පත්‍ර, පැමිණීමේ ලේඛන සකස් කිරීම සහ විනිසුරුවරුන්ගේ සහභාගීත්වය පිළිබඳ යාවත්කාලීන වාර්තා පවත්වා ගැනීම.
- අදාළ සියලුම ලේඛන පවත්වා ගනිමින්, විනිසුරුවරුන් සහ සම්පත්දායකයින් සඳහා වන දීමනා සහ ගෙවීම් කටයුතු සූදානම් කිරීම.
- උත්සව සඳහා ස්ථානය සූදානම් කිරීම, සංග්‍රහ කටයුතු, ප්‍රවාහනය සහ නවාතැන් පහසුකම් ඇතුළු සැපයුම් (logistical) සහාය ලබා දීම.
- අවශ්‍යතාවය පරිදි , සති අන්ත ද ඇතුළුව දෙමුහුණු (hybrid), ආයතන පරිශ්‍රය තුළ (on-site) සහ ආයතනයෙන් බැහැර (off-site) වැඩමුළු හෝ සමුළු සඳහා සහාය වීම.

4. අධීක්ෂණය, ඇගයීම සහ වාර්තාකරණය

- ආයතනික වැඩසටහන්, ව්‍යාපෘති සහ ප්‍රතිපත්තිවල ඵලදායීතාව සහ ප්‍රතිඵල අධීක්ෂණය හා ඇගයීම.
- තීරණ ගැනීම සඳහා සංඛ්‍යානමය සහ මෙහෙයුම් දත්ත රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ අර්ථකථනය කිරීම.
- දත්ත ගබඩා කිරීමේ පද්ධති සහ සංඛ්‍යානමය වාර්තාකරණ ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම.
- වැඩසටහන්වල කාර්යසාධනය, ආයතනික ක්‍රියාකාරකම් සහ සේවා ගුණාත්මකභාවය පිළිබඳ වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.
- කාර්යාලීය සම්පත්වලට ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීම සහ ඒවා අවම කිරීමට පියවර ගැනීම.

5. පහසුකම් සහ යටිතල පහසුකම් කළමනාකරණය

- කාර්යාලීය යටිතල පහසුකම්, විනිසුරුවරුන්ගේ නිල නිවස (judges' bungalow) සහ ඒ හා අනුබද්ධ පහසුකම්වල නඩත්තු, අලුත්වැඩියා සහ පවත්වාගෙන යාමේ කටයුතු අධීක්ෂණය කිරීම.

- යතුරු, ආරක්ෂක ප්‍රවේශයන් (security access) සහ ආයතනික පරිශ්‍රයන් මෙන්ම උපකරණ නිසි ලෙස පරිහරණය කිරීම කළමනාකරණය කිරීම.
- කාර්යාලයේ සහ නවාතැන් පහසුකම්වල සනීපාරක්ෂාව, සෞඛ්‍යාරක්ෂිත බව සහ පිරිසිදුකම සහතික කිරීම.
- නල පද්ධති (plumbing), විදුලි පද්ධති සහ ඒ හා සබැඳි ක්ෂේත්‍රවල සුළු අලුත්වැඩියාවන් කාර්යක්ෂමව සිදු කිරීම.
- අදාළ අංශ සමඟ සහයෝගීතාවයෙන් යුතුව ශ්‍රව්‍ය දෘශ්‍ය, තොරතුරු තාක්ෂණ (IT) සහ අනෙකුත් උපකරණ සඳහා තාක්ෂණික සහ සහායක සේවාවන් සම්බන්ධීකරණය කිරීම.

6. ප්‍රවාහනය සහ සැපයුම් (Logistic) සහාය

- අධ්‍යක්ෂවරුන්, කාර්ය මණ්ඩලය, විනිසුරුවරුන් සහ පැමිණෙන සම්පත්දායකයින් සඳහා නිල ප්‍රවාහන පහසුකම් සැලසීම.
- වාහන ධාවන පොත් (logbooks) පවත්වාගෙන යාම සහ ගිණුම් අංශය හා රජයේ විගණන අධිකාරිය වෙත මාසික වාර්තා ඉදිරිපත් කිරීම.
- ආයතනික වාහන සේවා කිරීම, නඩත්තු කිරීම සහ රක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විවිධ උත්සව, වැඩමුළු සහ නිල සංචාර සඳහා වන ප්‍රවාහන කටයුතු කාර්යක්ෂමව සහ කාලෝචිතව සිදුවන බව සහතික කිරීම.

7. කාර්යාලීය සහායක සේවා

- බාහිර ආයතන වෙත හෝ තැපෑල මඟින් නිල ලේඛන යැවීමේ කටයුතු හැසිරවීම.
- විනිසුරුවරුන්ගේ පුද්ගලික දත්ත සහ පැමිණීමේ වාර්තා ඇතුළුව පුද්ගලික සහ නිල ලිපිගොනු පවත්වාගෙන යාම.
- අවශ්‍යතාවය පරිදි ඡායා පිටපත් කිරීම, පොත් බැඳීම (book binding), පුස්තකාල සහ ලේඛන ආශ්‍රිත සේවාවන් සඳහා සහාය වීම.
- ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල නිලධාරීන් (උදා: ප්‍රධාන කාර්යාල සහායක) නොමැති අවස්ථාවලදී සියලුම කාර්යාලීය සහායක රාජකාරිවල නිරත වීම.
- විනිසුරුවරුන්ගේ නිල නිවසේ සහ අනෙකුත් ආයතනික පහසුකම්වල පරිපාලනමය කටයුතු සඳහා සහාය වීම.

8. අනෙකුත් වගකීම්

- අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ ශාස්ත්‍රීය සම්බන්ධීකාරක විසින් පවරනු ලබන ඕනෑම අතිරේක රාජකාරියක් ඉටු කිරීම.

- සති අන්ත, නිවාඩු දින හෝ විශේෂ උත්සව පැවැත්වෙන අවස්ථාවන්හිදී පරිපාලන සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම.
- ආයතනික වැඩසටහන් සහ කළමනාකරණ අරමුණු සඳහා කාර්යක්ෂමව හා ක්‍රමවත්ව සහාය වීම.

❖ **විගණන අංශය - කාර්යභාරයන් සහ වගකීම්**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ විගණන අංශය, අභ්‍යන්තර විගණකවරයාගේ (2025.12.05 දින පත් කරන ලද) ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වන අතර, ආයතනය තුළ මනා මූල්‍ය කළමනාකරණය, රෙගුලාසිවලට අනුකූල වීම, ඵලදායී අභ්‍යන්තර පාලනයන් සහ යහපාලනය සහතික කිරීම සඳහා වගකීම දරයි. මෙම අංශය ස්වාධීනව කටයුතු කරන අතර ආයතනික වගවීම ශක්තිමත් කිරීම සඳහා අපක්ෂපාතී සහතිකකරණ සහ උපදෙස් සේවා සපයයි.

1. අභ්‍යන්තර විගණන සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීම

- ආයතනික අරමුණු සහ අවදානම් ප්‍රමුඛතාවලට අනුකූලව වාර්ෂික අභ්‍යන්තර විගණන විෂය පථය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය, මෙහෙයුම් සහ පරිපාලන කාර්යයන් ආවරණය වන පරිදි අනුමත අභ්‍යන්තර විගණන සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- අවදානම් මත පදනම් වූ අභ්‍යන්තර විගණන වැඩසටහන් සකස් කිරීම සහ ප්‍රධාන ආයතනික ක්ෂේත්‍රයන් ක්‍රමානුකූලව ආවරණය වන බව සහතික කිරීම.

2. අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීම

- ආයතනය තුළ ඇති අභ්‍යන්තර පාලන යාන්ත්‍රණවල ප්‍රමාණවත්භාවය සහ ඵලදායීතාවය පරීක්ෂා කිරීම සහ ඇගයීම.
- මූල්‍ය හා පරිපාලන පාලනයන්හි පවතින දුර්වලතා, අඩුපාඩු සහ හිඩැස් හඳුනා ගැනීම.
- අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සඳහා නිවැරදි කිරීමේ පියවරයන් නිර්දේශ කිරීම.
- කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා පාලන ක්‍රියා පටිපාටි වරින් වර සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම.

3. නියාමන සහ නෛතික අනුකූලතාවය සමාලෝචනය කිරීම

- අදාළ වන රාජ්‍ය අංශයේ නීති, රෙගුලාසි සහ චක්‍රලේඛ පිළිබඳව නිරන්තරයෙන් යාවත්කාලීන වීම (මීට පහත සඳහන් දෑ ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ):
    - ජාතික විගණන පනත
    - ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි (මු.රෙ.)
    - ආයතන සංග්‍රහය

- අදාළ මහා භාණ්ඩාගාර සහ අමාත්‍යාංශ චක්‍රලේඛ
- ආයතනික කටයුතු දැනට පවතින නීතිමය සහ නියාමන රාමුවලට අනුකූලව සිදු කෙරෙන්නේද යන්න පරීක්ෂා කිරීම.
- අනුකූල නොවන අවස්ථා වාර්තා කිරීම සහ පිළියම් යෙදීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.

4. වාර්තාකරණය සහ උපදේශන කාර්යයන්

- වරින් වර අභ්‍යන්තර විගණන වාර්තා සකස් කිරීම සහ ඒවායේ නිගමන හා නිර්දේශයන් කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කිරීම.
- බාහිර අධීක්ෂණ ආයතන විසින් ඉල්ලා සිටින පරිදි විශේෂ විගණන වාර්තා සැපයීම.
- පාලනය, අවදානම් කළමනාකරණය සහ පාලන ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා කළමනාකාරිත්වයට සහාය වීම.
- විගණන නිර්දේශ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරම් කිරීම.

5. විගණන කමිටු සම්බන්ධීකරණය

- ආයතනයේ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සංවිධානය කිරීම සහ පැවැත්වීම.
- විගණන සොයාගැනීම්, අවදානම් ඇගයීම් සහ ප්‍රගති වාර්තා කමිටුව වෙත ඉදිරිපත් කිරීම.
- විගණන කමිටු කටයුතුවල නිසි ලේඛනගත කිරීම් සහ වාර්තා (minutes) පවත්වාගෙන යාම.

6. බාහිර විගණන සම්බන්ධීකරණය සහ විමසුම් කළමනාකරණය

- බාහිර විගණන ආයතන සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම සහ අවශ්‍ය ලේඛන හා පැහැදිලි කිරීම් ලබා දීම.
- විගණන විමසුම් සහ නිරීක්ෂණ සඳහා නියමිත වේලාවට සහ සවිස්තරාත්මකව පිළිතුරු සැපයීම.
- බාහිර විගණකවරුන් විසින් නිකුත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

7. ආයතනික සහාය සහ පරිපාලන වගකීම්

- සේවා අවශ්‍යතා මත පදනම්ව, අවශ්‍ය පරිදි සති අන්ත සහ රජයේ නිවාඩු දිනවල රාජකාරිය සඳහා වාර්තා කිරීම.
- ප්‍රධාන විගණන කාර්යයට අදාළව ප්‍රධාන විධායක නිලධාරී/මාර්ෂල් විසින් පවරනු ලබන රාජකාරි ඉටු කිරීම.
- ආයතනික පාලනයට සහාය වීම සඳහා අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ අධ්‍යයන සම්බන්ධීකාරක විසින් පවරනු ලබන අතිරේක වගකීම් ඉටු කිරීම.

❖ **තොරතුරු තාක්ෂණ (IT) අංශය - කාර්යභාරයන් සහ වගකීම්**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ තොරතුරු තාක්ෂණ අංශය, ආයතනයේ තොරතුරු තාක්ෂණ පද්ධති සහ ඩිජිටල් යටිතල පහසුකම් අඛණ්ඩව, ආරක්ෂිතව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා වගකිව යුතු මෘදුකාංග සහ දෘඩාංග තාක්ෂණ ශිල්පීන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. මෙම අංශය මගින් පුහුණු වැඩසටහන්, වැඩමුළු, අධිකරණ තොරතුරු පද්ධති සහ ආයතනික සන්නිවේදන වේදිකාවන් සඳහා සහය දක්වනු ලබයි.

1. වෙබ් අඩවි සංවර්ධනය සහ ආරක්ෂාව

- ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම, නඩත්තු කිරීම සහ තවදුරටත් සංවර්ධනය කිරීම.
- නිතිපතා නිරීක්ෂණය කිරීම, අවදානම් පරීක්ෂාවන් (vulnerability checks), දත්ත උපස්ථ කිරීම් (backups) සහ සයිබර් ආරක්ෂණයේ හොඳම භාවිතයන් ක්‍රියාත්මක කිරීම මගින් වෙබ් අඩවියේ ආරක්ෂාව තහවුරු කිරීම.
- පුහුණු කාලසටහන්, ප්‍රකාශන, නිවේදන සහ ආයතනික තොරතුරු නියමිත වේලාවට යාවත්කාලීන කිරීම සහතික කිරීම.
- ආරක්ෂිත වෙබ් සේවාදායක පහසුකම් (hosting), Domain නාම කළමනාකරණය සහ ප්‍රවේශ පාලනයන් (access controls) නඩත්තු කිරීම.

2. ජාල පරිපාලනය (Network Administration)

- ප්‍රාදේශීය ජාලය (LAN) සහ අන්තර්ජාල සම්බන්ධතාවය පරිපාලනය කිරීම සහ නිරීක්ෂණය කිරීම.
- කාර්ය මණ්ඩලය සහ වැඩසටහන් සඳහා සහභාගී වන්නන් වෙනුවෙන් ආරක්ෂිත සහ බාධාවකින් තොර ජාල ප්‍රවේශයක් සහතික කිරීම.
- ෆයර්වෝල් (firewall), රවුටර (routers), ස්විච (switches) සහ රැහැන් රහිත ප්‍රවේශ පද්ධති (wireless access systems) නිරීක්ෂණය කිරීම.
- අනවසර ප්‍රවේශයන් වැලැක්වීම සඳහා මූලික ජාල ආරක්ෂණ පියවරයන් ක්‍රියාත්මක කිරීම.

3. පරිගණක පද්ධති සහ පර්යන්ත උපාංග නඩත්තු කිරීම

- පහත සඳහන් උපාංගවල නිසි ක්‍රියාකාරිත්වය සහ දෛනික නඩත්තු කටයුතු සහතික කිරීම:
    - ඩෙස්ක්ටොප් සහ ලැප්ටොප් පරිගණක
    - මුද්‍රණ යන්ත්‍ර (Printers) සහ අනුපිටපත් යන්ත්‍ර
    - ස්කෑනර් යන්ත්‍ර
    - ප්‍රක්ෂේපක (Projectors)
    - දුරකථන සහ සන්නිවේදන උපාංග

- දෘඩාංග සහ මෘදුකාංග ගැටලු කාලෝචිත ලෙස හඳුනාගෙන ඒවා නිරාකරණය කිරීම.
- සියලුම ආයතනික උපකරණ සඳහා සේවා වාර්තා (service records) පවත්වාගෙන යාම.

4. ස්ථාපනයන් සහ පද්ධති පරිපාලනය

- ආයතනික භාවිතය සඳහා අවශ්‍ය දෘඩාංග සහ මෘදුකාංග ස්ථාපනය කිරීම සහ වින්‍යාස කිරීම
- මෙහෙයුම් පද්ධති , ප්‍රති-වයිරස මෘදුකාංග, සහ යෙදුම් මෘදුකාංග (application software) නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම.
- පහත සඳහන් දෑ ඇතුළුව ආයතනික ඊමේල් පද්ධති කළමනාකරණය කිරීම:
    - නිල ඊමේල් ගිණුම් සැකසීම සහ යාවත්කාලීන කිරීම.
    - ඊමේල්සේවාවන්හි ආරක්ෂාව සහ නිසි ක්‍රියාකාරීත්වය සහතික කිරීම.
- දත්ත උපස්ථයන් (data backups) පවත්වාගෙන යාම සහ පද්ධතියේ අඛණ්ඩතාව සහතික කිරීම.

5. සම්මන්ත්‍රණ, වැඩමුළු සහ මාර්ගගත වැඩසටහන් සඳහා සහය දැක්වීම

- ආයතනය විසින් පවත්වනු ලබන භෞතික සහ අතථ්‍ය (virtual) සම්මන්ත්‍රණ, දේශන සහ මාර්ගගත වැඩමුළු සඳහා පූර්ණ තාක්ෂණික සහය ලබා දීම.
- වීඩියෝ සම්මන්ත්‍රණ වේදිකා (video conferencing platforms) සහ ඒ ආශ්‍රිත ශ්‍රව්‍ය-දෘශ්‍ය පද්ධති සකස් කිරීම සහ කළමනාකරණය කිරීම.
- දෙමුහුන් (hybrid) සහ මාර්ගගත පුහුණු වැඩසටහන් සුමටව පවත්වාගෙන යාම සහතික කිරීම.
- වැඩසටහන් අතරතුර සිදුවන තාක්ෂණික දෝෂ එසැණින් නිරාකරණය කිරීම (real-time troubleshooting).

6. තාක්ෂණික උපකරණ කළමනාකරණය සහ ලේඛනගත කිරීම

- බිඳවැටීමකදී වහාම තාක්ෂණික සහය ලබා දීම.
- අලුත්වැඩියා කිරීම්, සේවා සැපයීම් සහ නඩත්තු කටයුතුවලට අදාළ සවිස්තරාත්මක ලේඛන සහ සේවා සටහන් (service logs) පවත්වාගෙන යාම.
- අවශ්‍ය අවස්ථාවලදී බාහිර සේවා සපයන්නන් සමඟ සම්බන්ධීකරණය කිරීම.

7. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනික වෙබ් අඩවිය සහ නීති දත්ත සංහිතාව (SLJI Net) සඳහා සහය දැක්වීම

- SLJI Net සහ නීති දත්ත සංහිතාවේ (Legal Database) ඵලදායී ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා තාක්ෂණික මගපෙන්වීම් සහ පද්ධති සහය ලබා දීම.

- පද්ධති යාවත්කාලීන කිරීම්, තාක්ෂණික දෝෂ නිරාකරණය කිරීම් සහ පරිශීලක සහය සඳහා උපකාර කිරීම.
- ජාලයේ ආරක්ෂිත ප්‍රවේශය සහ මෙහෙයුම් අඛණ්ඩතාව සහතික කිරීම.

8. ශ්‍රව්‍ය-දෘශ්‍ය සහ ඉලෙක්ට්‍රොනික පහසුකම් කළමනාකරණය

- බාහිර වැඩමුළු සහ විශේෂ වැඩසටහන් සඳහා අවශ්‍ය ඉලෙක්ට්‍රොනික සහ ශ්‍රව්‍ය-දෘශ්‍ය පහසුකම් සැපයීම.
- වැඩසටහන්වලට පෙර සහ පසුව උපකරණ නිසි පරිදි සකස් කිරීම, පරීක්ෂා කිරීම සහ ගලවා ඉවත් කිරීම සහතික කිරීම.
- ශ්‍රව්‍ය-දෘශ්‍ය උපකරණවල තොග බඩු ලේඛනය (inventory) පවත්වාගෙන යාම.

9. පරිපාලන සහ සහායක කාර්යයන්

- විනිසුරුවරුන්ගේ සහ අදාළ පාර්ශවකරුවන්ගේ නිල ඊමේල් ගිණුම් යාවත්කාලීන කිරීම සහ පවත්වාගෙන යාම.
- නිල වැඩසටහන් සඳහා අවශ්‍ය වූ විට සති අන්ත සහ රජයේ නිවාඩු දිනවල සේවයට වාර්තා කිරීම.
- ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ අධ්‍යයන සම්බන්ධීකාරක විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.

❖ **මූල්‍ය අංශය - කාර්යභාරයන් සහ වගකීම්**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මුදල් අංශය විසින්, සියලුම මූල්‍ය කටයුතු කළමනාකරණය කිරීම, ව්‍යවස්ථාපිත සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම් සහතික කිරීම සහ ආයතනයේ මෙහෙයුම් මෙන්ම උපායමාර්ගික අරමුණු සඳහා සහය දැක්වීම සම්බන්ධයෙන් වගකීම දරනු ලබයි.

1. මූල්‍ය සැලසුම්කරණය සහ අයවැය කළමනාකරණය

- මහා භාණ්ඩාගාරය සහ අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ ඒ ආශ්‍රිත වාර්තා සකස් කිරීම.
- අයවැය ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කිරීම සහ වියදම් අනුමත ප්‍රතිපාදන සීමාවන් තුළ පවතින බව සහතික කිරීම
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ ඒ ආශ්‍රිත ලේඛන සකස් කිරීමට සහය වීම.
- කාර්යක්ෂමතාව සහ වගවීම සහතික කරමින්, ආයතනික මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ නිරීක්ෂණය කිරීම.
- වැඩමුළු, පුහුණු වැඩසටහන් සහ අනෙකුත් ආයතනික ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය සැලසුම්කරණය සම්බන්ධීකරණය කිරීම..

2. ගෙවීම් සහ වියදම් කළමනාකරණය

- අනුමත ක්‍රියා පටිපාටිවලට අනුකූලව සියලුම ආයතනික වියදම් සත්‍යාපනය කිරීම සහ අනුමත කිරීම. ගෙවීම් වවුචර (vouchers), චෙක්පත් සකස් කිරීම සහ යාවත්කාලීන කරන ලද වවුචර සහ චෙක්පත් ලේඛන පවත්වාගෙන යාම.
- වැඩමුළු, සම්මන්ත්‍රණ සහ නිල සංචාර සඳහා විනිසුරුවරුන්, සම්පත්දායකයින් සහ කාර්ය මණ්ඩලය වෙත දීමනා ගෙවීම.
- විනිසුරුවරුන් සඳහා වන පශ්චාත් උපාධි ගෙවීම් කටයුතු සිදු කිරීම සහ ඒ ආශ්‍රිත වියදම් පිළිබඳ සම්පූර්ණ ලේඛන පවත්වාගෙන යාම.
- නෛතික අවශ්‍යතාවලට අනුකූලව අර්ථසාධක අරමුදල් දායකත්වයන්, සේවක ආරක්ෂණ අරමුදල් සහ මුද්දර ගාස්තු ඇතුළු ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කිරීම.
  නිල වාහන සඳහා ඉන්ධන අවශ්‍යතා සහ නිකුත් කිරීම් නිරීක්ෂණය කිරීම සහ නිවැරදි වාර්තා පවත්වාගෙන යාම.

3. ගිණුම්කරණය සහ වාර්තා කැබීම

- ලෙජර (ledgers), උපකාරක පොත්, සුළු මුදල් පොත් සහ අනෙකුත් මූල්‍ය වාර්තා පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම.
- මුදල් පොත් නිතිපතා සැසඳීම සහ ගිණුම් ශේෂයන් සත්‍යාපනය කිරීම.
- මුදල්, චෙක්පත් පොත් සහ මූල්‍ය ලේඛන සුරක්ෂිතව තබා ගැනීම සහ ඒවායේ ආරක්ෂාව සහතික කිරීම.
- විගණන කටයුතු, ව්‍යවස්ථාපිත ඉදිරිපත් කිරීම් සහ ආයතනික වාර්තාකරණය සඳහා වාර්තා පවත්වාගෙන යාම.
- මාසික මූල්‍ය ප්‍රකාශන, වියදම් වාර්තා සහ අවශ්‍ය අනෙකුත් ගිණුම්කරණ ලේඛන සකස් කිරීම.

4. විගණනය සහ අනුකූලතාව

- අභ්‍යන්තර විගණන රැස්වීම්වලදී ආයතනය නියෝජනය කිරීම සහ විගණන නිර්දේශ පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කිරීම.
- ව්‍යවස්ථාපිත අවශ්‍යතා, මුදල් රෙගුලාසි සහ භාණ්ඩාගාර උපදෙස්වලට අනුකූල වීම සහතික කිරීම.
- නියමිත කාලසීමාවන් තුළ ව්‍යවස්ථාපිත වාර්තා සහ ගිණුම් භාණ්ඩාගාරය වෙත හෝ අනෙකුත් ව්‍යවස්ථාපිත අධිකාරීන් වෙත ඉදිරිපත් කිරීම.
- විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සහ අභ්‍යන්තර මූල්‍ය පාලනයන් වැඩිදියුණු කිරීමට සහය වීම.

5. වැටුප් සහ කාර්ය මණ්ඩල ගෙවීම්

- ආයතනික කාර්ය මණ්ඩලයේ වැටුප් සකස් කිරීම, ගෙවීම් සිදු කිරීම සහ එම ගෙවීම් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම.
- වැටුප් ගෙවීම්, දීමනා සහ ඒ ආශ්‍රිත වාර්තා ක්‍රමානුකූලව හැසිරවීම.
- කාර්ය මණ්ඩල ගෙවීම් සඳහා අදාළ නීති, රෙගුලාසි සහ ආයතනික ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහතික කිරීම.

6. මෙහෙයුම් මූල්‍ය සහය

- ප්‍රතිපාදන වෙන් කිරීම් සහ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය, අධිකරණ අමාත්‍යාංශය සහ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.
- නිල කටයුතු, වැඩමුළු, පුහුණු වැඩසටහන් සහ විනිසුරුවරුන්ගේ විදේශ සංචාරක කටයුතු සඳහා අරමුදල් කළමනාකරණය කිරීම.
- ආයතනයේ ඉන්ධන, ලිපිද්‍රව්‍ය සහ පරිභෝජන ද්‍රව්‍ය අවශ්‍යතා නිරීක්ෂණය කිරීම සහ කාලෝචිත ලෙස ප්‍රසම්පාදන හා ගෙවීම් කටයුතු සඳහා පහසුකම් සැලසීම.

7. පරිපාලන සහ විවිධ රාජකාරි

- නිල සේවා අවශ්‍යතා සඳහා අවශ්‍ය වූ විට සති අන්ත හෝ රජයේ නිවාඩු දිනවල සේවයට වාර්තා කිරීම.
- ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හෝ අධ්‍යයන සම්බන්ධීකාරක විසින් පවරනු ලබන වෙනත් ඕනෑම රාජකාරියක් ඉටු කිරීම.
- ආයතනයේ මෙහෙයුම් සහ උපායමාර්ගික අරමුණු සඳහා සහය වීම පිණිස ක්‍රමානුකූල, සංවිධානාත්මක සහ විනිවිදභාවයකින් යුත් මූල්‍ය ක්‍රියාවලියක් පවත්වාගෙන යාම.

❖ **අධ්‍යයන අංශය – කාර්යභාරයන් සහ වගකීම්**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යයන අංශය, ආයතනය විසින් පවත්වනු ලබන අධිකරණ අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඒවායේ අධ්‍යයන ගුණාත්මකභාවය සහතික කිරීම සම්බන්ධයෙන් වගකීම දරන ප්‍රධානතම අංශය ලෙස ක්‍රියා කරයි. මෙම අංශය අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ සමස්ත අධීක්ෂණය යටතේ සහ අධ්‍යයන සම්බන්ධීකාරකවරයා සමඟ සමීප සම්බන්ධීකරණයෙන් යුතුව ක්‍රියාත්මක වේ.

අධ්‍යයන අංශයේ ප්‍රධාන කාර්යභාරයන් සහ වගකීම්වලට පහත සඳහන් දැ ඇතුළත් වේ:

1. ආයතනයේ අරමුණු සහ විධානයන්ට අනුකූලව, සියලුම මට්ටම්වල පසුවන විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන් සඳහා සේවාරම්භක (induction), සේවාස්ථ (in-service) සහ අඛණ්ඩ අධිකරණ අධ්‍යාපන වැඩසටහන් සැලසුම් කිරීම, හැඩගැස්වීම සහ සම්බන්ධීකරණය කිරීම.

2. සාකච්ඡා, ඇගයීම් සහ ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයන් මගින් අධිකරණ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ ඒ සඳහා ගැලපෙන මෙන්ම අදාළ වන පුහුණු විෂයමාලා සහ වැඩසටහන් සංවර්ධනය කිරීම.

3. හරවත් නීතිය (substantive law), කාර්ය පටිපාටික නීතිය (procedural law), අධිකරණ ආචාර ධර්ම, තීන්දු ප්‍රකාශ ලිවීම , දණ්ඩන නියම කිරීම , නඩු කළමනාකරණය, විකල්ප ආරවුල් නිරාකරණය සහ නීතියේ නැගී එන ක්ෂේත්‍ර පිළිබඳව සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන, මහා සම්මේලන සහ දැනුම යාවත්කාලීන කිරීමේ පාඨමාලා සංවිධානය කිරීම.

4. අධ්‍යයන වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ විනිසුරුවරුන්, නීති විද්‍යාර්ථීන්, විෂය පථයන් පිළිබඳ ප්‍රවීණයන් සහ ජාත්‍යන්තර උපදේශකයින් ඇතුළු සම්පත්දායකයින් සමඟ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

5. වැඩසටහන් සහ ප්‍රකාශන සඳහා අවශ්‍ය වන නෛතික සහ අධිකරණ පර්යේෂණ සිදු කිරීම, පසුබිම් වාර්තා), සංකල්ප සටහන් (concept සටහනs), පුහුණු ද්‍රව්‍ය සහ අධ්‍යයන අන්තර්ගතයන් සකස් කිරීම සඳහා පර්යේෂණ නිලධාරීන්ගේ කාර්යයන් අධීක්ෂණය කිරීම සහ ඒවාට සහය වීම.

6. යුක්තිය පසිඳලීම, අධිකරණ ප්‍රතිසංස්කරණ සහ සමකාලීන නෛතික වර්ධනයන් පිළිබඳ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ අධීක්ෂණය කිරීම මෙන්ම සාක්ෂි මත පදනම් වූ අධිකරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම.

7. අධිකරණ පුහුණු සහ පර්යේෂණ කටයුතු සඳහා සහය වීම පිණිස මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික ද්‍රව්‍ය ඇතුළු ආයතනයේ පුස්තකාලය සහ නීති පර්යේෂණ සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය කිරීම.

8. ආයතනය විසින් පවත්වනු ලබන සියලුම පුහුණු වැඩසටහන් පුරාවටම අධ්‍යයන ප්‍රමිතීන්, ගුණාත්මකභාවය සහ අනුකූලතාවය පවත්වාගෙන යාම සහතික කිරීම.

9. ආයතනයේ පුහුණු අත්පොත්, පර්යේෂණ පත්‍රිකා, සඟරා, වාර්තා සහ අනෙකුත් ශාස්ත්‍රීය ප්‍රකාශන වැනි අධ්‍යයන ප්‍රතිදානයන් (academic outputs) සකස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම සඳහා සහය වීම.

10. ජාතික හා ජාත්‍යන්තර ආයතන, සංවර්ධන හවුල්කරුවන් සහ අධිකරණ පුහුණු ආයතන සමඟ එක්ව පවත්වනු ලබන සහයෝගීතා වැඩසටහන් සඳහා අධ්‍යයන දායකත්වයන් සම්බන්ධීකරණය කිරීම.

11. ආයතනික වාර්තාකරණ සහ සැලසුම්කරණ අරමුණු සඳහා අධ්‍යයන වැඩසටහන්, සහභාගිවන්නන්ගේ ඇගයීම් සහ පර්යේෂණ කටයුතුවලට අදාළ වාර්තා, ලේඛන පවත්වාගෙන යාම.

12. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යක්ෂ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා විසින් පවරනු ලබන වෙනත් එවැනි අධ්‍යයන හා පර්යේෂණවලට අදාළ කාර්යයන් ඉටු කිරීම.

පාලන ව්‍යුහය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වනාහී අවිච්චින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් වන අතර, එහි පරිපාලනය සහ කළමනාකරණය කළමනාකරණ මණ්ඩලය වෙත පැවරී තිබේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය, අග්‍රවිනිශ්චයකාරතුමන්ගෙන් සහ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර, අග්‍රවිනිශ්චයකාරතුමන් කළමනාකරණය මණ්ඩලයේ සභාපතිවරයා වේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රතිව්‍යුහගත සැලැස්මෙන් පසුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ආයතනික ව්‍යුහය පහත දැක්වේ.

- **කළමනාකරණ මණ්ඩලය**

2025 වර්ෂයේ ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ.:

ශ්‍රී ලංකාවේ ගරු අගවිනිසුරු, පී. පද්මන් සූරසේන මැතිතුමා (සභාපති)

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, මහින්ද සමයවර්ධන මැතිතුමා (සාමාජික)

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, අර්ජුන ඔබේසේකර මැතිතුමා (සාමාජික))

- **පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ එළැඹී ප්‍රධාන තීරණවල සාරාංශය**

අනුක්‍රමික අංකය	දිනය	වැදගත් තීරණ
1	20.02.2025	• වැඩමුළු සහ පුහුණු වැඩසටහන් කිහිපයක් පැවැත්වීම සඳහා අනුමැතිය. • විනිසුරුවරුන්ගේ අත්පොත (Judges' Manual) නවීකරණය සහ සංශෝධනය කිරීම. • ළමුන් සම්බන්ධ නඩු කටයුතු හැසිරවීමේදී විනිසුරුවරුන්ට සහය වීම සඳහා විස්තීර්ණ අත්පොතක් සකස් කිරීම.
2	24.03.2025	• ශ්‍රී ලංකාවේ උසාවිවල නඩු වාර්තා සඳහා ඒකාකාරී නඩු අංකන ක්‍රමයක් සහ වර්ණ කේතකරණ (colour-coding) යාන්ත්‍රණයක් හඳුන්වා දීම. • උසාවි නඩු භාණ්ඩ (බැහැර කිරීමට අදාළ ක්‍රියා පටිපාටි. • අලුතින් පත් වූ විනිසුරුවරුන් සඳහා සේවාරම්භක වැඩසටහනක් පැවැත්වීම. • විනිසුරුවරුන්ගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා මූල්‍ය ආධාර අනුමත කිරීම.
3	20.05.2025	• හඳුනාගත් අධිකරණ පුහුණු ක්ෂේත්‍ර පිළිබඳ වැඩමුළු සහ දේශන පැවැත්වීම. • ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතන (SLJI) පුස්තකාල එකතුව සංවර්ධනය කිරීම සඳහා පොත් සහ ප්‍රකාශන භාර දෙන ලෙස ඉල්ලා සිටීම.
4	26.09.2025	• වැඩමුළු, සම්මන්ත්‍රණ, පුහුණු වැඩසටහන් සහ වාර්ෂික අධිකරණ සම්මේලනය පැවැත්වීම සඳහා අනුමැතිය. • ලිංගික හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ පිරික්සුම් ලැයිස්තුවේ (Checklist) අවසාන පිටපත ඉදිරිපත් කිරීම. • බුද්ධිමය දේපළ විනිශ්චයාසන පොත (Intellectual Property Bench Book) එළිදැක්වීම. • නඩු කළමනාකරණ පිළිවෙත් (CMP) සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) සහාය ලබා ගැනීම පිළිබඳව සලකා බැලීම. • ආයතනය සඳහා සේවකයින් බඳවා ගැනීම. • නීති ශිෂ්‍යයන් සඳහා සීමාවාසික පුහුණු අවස්ථා අනුමත කිරීම.

		• පුස්තකාලයට අදාළව දඩ මුදල් අය කිරීම සඳහා ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම. , ඡායා පිටපත් ගාස්තු, එක්දින සාමාජික ගාස්තු ක්‍රියාත්මක කිරීම සහ පුස්තකාල සේවාවන් ශක්තිමත් කිරීමේ පියවර ගැනීම. • එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) – JURE ව්‍යාපෘතියේ මූලික නිපුණතා රාමුවේ (CCF) ප්‍රගතිය. • ශ්‍රවණාගාරයට අදාළ වියදම් සඳහා ආයතනයේ අරමුදල් පරිහරණය කිරීම.
5	2.12.2025	• ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය (SLJI) වෙත අලුතින් බඳවාගත් කාර්ය මණ්ඩලය පත් කිරීම. • අදාළ ඇගයීම් ලිපියේ සඳහන් පරිදි, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සතු වාහන ඒවායේ වත්මන් ආර්ථික වටිනාකම පදනම් කරගෙන වත්කම් ලෙස ඇතුළත් කිරීම. • පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ගෙවීම් සිදු කිරීම. • වැඩමුළු සහ පුහුණු වැඩසටහන් ගණනාවක් පැවැත්වීම සඳහා අනුමැතිය.

- **අභ්‍යන්තර විගණන කාර්යයන්හි ව්‍යුහය**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය (SLJI), සියලුම මෙහෙයුම් කටයුතුවලදී ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමේ සහ විනිවිදභාවය, වගවීම මෙන්ම යහපාලනය සහතික කිරීමේ වැදගත්කම පිළිගනු ලබයි. මෙම කැපවීමට අනුකූලව, ආයතනය තුළ අභ්‍යන්තර විගණන කාර්යය විධිමත් ලෙස ස්ථාපිත කිරීමට පියවර ගන්නා ලදී. ආයතනයේ අභ්‍යන්තර පාලන රාමුව ශක්තිමත් කිරීම සඳහා සහ මූල්‍ය මෙන්ම මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ ස්වාධීන සහ අපක්ෂපාතී විශ්වාසනීයත්වයක් ලබා දීම සඳහා 2025 දෙසැම්බර් 05 වන දින අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගන්නා ලදී.

ආයතනයේ අභ්‍යන්තර පාලනයන්, අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සහ පාලන යාන්ත්‍රණයන්හි ප්‍රමාණවත්භාවය සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීම සහ අඛණ්ඩ දියුණුව සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය වගකීම් දරනු ලබයි. ආයතනයේ මෙහෙයුම් අවශ්‍යතා සහ අදාළ නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූලව, අභ්‍යන්තර විගණන රාමුව තවදුරටත් සංවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම සිදු කරනු ඇත.

මෙහෙයුම් පරිසරය

ප්‍රධාන කොටස්කරුවන්

මෙම ආයතනය ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය ආයතන, සංවර්ධන හවුල්කරුවන්, ජාත්‍යන්තර සංවිධාන සහ අරමුදල් සපයන ආයතන ආදියෙන් සමන්විත බහු-පාර්ශවකරුවන්ගෙන් යුත් පාලන සහ සංවර්ධන පරිසරයක් තුළ ක්‍රියාත්මක වේ. මෙම පාර්ශවකරුවන් ප්‍රතිපත්තිමය මගපෙන්වීම්, නියාමන අධීක්ෂණය, ආයතනික පාලනය, අරමුදල් සැපයීම, තාක්ෂණික සහයෝගීතාව, ධාරිතා සංවර්ධනය සහ මහජන සම්බන්ධතා යන ක්ෂේත්‍රයන්හිදී එකිනෙකට අනුපූරක වන කාර්යභාරයන් ඉටු කරනු ලබයි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ පුහුණු අංශය ලෙස ක්‍රියා කරන මෙම ආයතනය, ශ්‍රී ලංකාවේ අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතාවන්ට අනුකූල වන පරිදි සිය වැඩසටහන් සකස් කරමින්, අධිකරණ ධාරිතාව ශක්තිමත් කිරීම, වෘත්තීය සංවර්ධනය සහ අධිකරණ අධ්‍යාපනය ලබා දීම සම්බන්ධයෙන් වන මූලික ආයතනික කාර්යභාරය ඉටු කරනු ලබයි.

- **අදාළ අමාත්‍යාංශ සහ ආයතනවල ප්‍රතිපත්තිමය සහ නියාමන කාර්යභාරය**

අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, රේඛීය අමාත්‍යාංශය ලෙස ආයතනය වෙත සමස්ත ප්‍රතිපත්තිමය මගපෙන්වීම්, උපායමාර්ගික උපදෙස් සහ ආයතනික අධීක්ෂණය ලබා දෙයි. ආයතනයේ විධානයන්, වැඩසටහන් සහ උපායමාර්ගික ප්‍රමුඛතා, ජාතික අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ, පාලන රාමු සහ නීතියේ ආධිපත්‍යය පිළිබඳ අරමුණු සමඟ අනුකූල කරවීම සඳහා මෙම අමාත්‍යාංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

මෙම ආයතනය, **අධිකරණ සේවා කොමිෂන් සභාවේ** පුහුණු අංශය ලෙස, එම කොමිෂන් සභාව සමඟ සමීප ආයතනික සම්බන්ධීකරණයකින් යුතුව ක්‍රියාත්මක වේ. එමගින් අධිකරණ පුහුණු, වෘත්තීය සංවර්ධන වැඩසටහන් සහ ධාරිතා වර්ධන මූලපිරීම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාපිත විධානයන්, අධිකරණ ප්‍රමිතීන් සහ අධිකරණ ක්ෂේත්‍රයේ විකාශනය වන අවශ්‍යතාවලට අනුකූල වන බව සහතික කෙරේ.

ජාත්‍යන්තර සබඳතා, විදේශීය අරමුදල් මගින් ක්‍රියාත්මක වන වැඩමුළු, විදේශීය පුහුණු වැඩසටහන් සහ ජාත්‍යන්තර සහයෝගීතා මූලපිරීම්වලට අදාළ කටයුතුවලදී, ආයතනය **විදේශ කටයුතු අමාත්‍යාංශයේ** සම්බන්ධීකරණයෙන් කටයුතු සිදු කරයි. එමගින් ජාතික විදේශ ප්‍රතිපත්ති රාමුව, රාජ්‍ය තාන්ත්‍රික ප්‍රොටෝකෝල සහ ජාත්‍යන්තර සහයෝගීතා ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම සහතික කරනු ලබයි.

- **ආයතනය කෙරෙහි බලපාන ප්‍රධාන රාජ්‍ය ක්‍රියාකාරකම්**

අයවැය ප්‍රතිපාදන, අධිකරණ ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ, ආයතනික ශක්තිමත් කිරීමේ වැඩසටහන්, රාජ්‍ය සේවාවන් ඩිජිටල්කරණය කිරීම, පාලන ප්‍රතිසංස්කරණ සහ ජාතික සංවර්ධන උපායමාර්ග ඇතුළු රාජ්‍ය ක්‍රියාකාරකම්, ආයතනයේ මෙහෙයුම් ප්‍රමුඛතා, වැඩසටහන් සැලසුම් කිරීම සහ උපායමාර්ගික සැලසුම්කරණය කෙරෙහි සෘජුවම බලපායි. මෙම ක්‍රියාකාරකම් මගින් සම්පත් බලමුලු ගැන්වීම, සේවා සැපයීමේ ආකෘති, පුහුණු රාමු සහ දිගුකාලීන ආයතනික සංවර්ධන මාවත් හැඩගස්වනු ලබයි.

- **සංවර්ධන හවුල්කරුවන්, දායකත්ව සහ අරමුදල් සපයන ආයතන**

මූල්‍ය ආධාර, තාක්ෂණික විශේෂඥතාව, පුහුණු සහය සහ ආයතනික ධාරිතා සංවර්ධනය සපයන පුළුල් පරාසයක විහිදුණු සංවර්ධන හවුල්කරුවන්, දායකත්ව සහ අරමුදල් සපයන ආයතන සමඟ ආයතනය ශක්තිමත් සහයෝගීතා සබඳතා පවත්වාගෙන යයි. මෙම හවුල්කාරිත්වයන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, අධිකරණ අධ්‍යාපනය, දැනුම හුවමාරු කර ගැනීම සහ ආයතනික ශක්තිමත් කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් සපයයි.

2025 වර්ෂය සඳහා මෙම ආයතනයට සහයෝගීත්වය ලබාදුන් ප්‍රධාන හවුල්කරුවන්, **දායකත්ව** සහ අරමුදල් සපයන ආයතන අතරට පහත ආයතන ඇතුළත් වේ:

- මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNODC)
- CEELI ආයතනය
- ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපද නියෝජිතායතනය(USAID)
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) (JURE ව්‍යාපෘතිය යටතේ)
- එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ළමා අරමුදල(UNICEF) (JURE ව්‍යාපෘතිය යටතේ)
- ජාත්‍යන්තර සාමය සහ නීතියේ ආධිපත්‍යය සඳහා වූ මැක්ස් ප්ලාන්ක් පදනම
- ආසියානු සංවර්ධන බැංකුව (ADB)
- United States Department of Justice ආයතනය
- නීතිවිශාරදයන්ගේ ජාත්‍යන්තර කොමිසම (ICJ)
- ILO අන්තර්ජාතික පුහුණු මධ්‍යස්ථානය (ITCILO)
- CCC-ICLP ජාත්‍යන්තර ADR මධ්‍යස්ථානය
- අනෙකුත් අරමුදල් සපයන ආයතන සහ සංවර්ධන හවුල්කරුවන්

තාක්ෂණික සහයෝගීතාව, ධාරිතා වර්ධන වැඩසටහන්, දැනුම හුවමාරු කර ගැනීමේ මුලපිරීම් සහ ආයතනික සංවර්ධන සහයෝගීතාව සඳහා විධිමත් රාමුවක් සපයමින්, 2025 වසරේදී අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමක් (MoU) හරහා ලෝක බුද්ධිමය දේපළ සංවිධානය (WIPO) සමඟ පිහිටුවා ගත් විධිමත් හවුල්කාරිත්වයක් ද මෙම ආයතනය විසින් පවත්වාගෙන යනු ලබයි.

ආයතනයේ අරමුදල්

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පරිපාලනය කරනු ලබන වෙනම අරමුදලක් පවත්වාගෙන යායුතු බවට 2025 වර්ෂයේදී යෝජනා විය. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා අධිකරණ අමාත්‍යාංශය හරහා ගලනය වන මහා භාණ්ඩාගාර ප්‍රදානවලින් ප්‍රදාන වශයෙන් ම ආයතනයේ මුල්‍ය කටයුතුවලට අවශ්‍ය මුදල් සම්පාදනය කරගනු ලැබේ. මෙම වියදම් සඳහා අධිකරණ අමාත්‍යාංශය / මහා භාණ්ඩාගාරය උපරිම වියදම් සීමා පනවන අතර, මෙම සීමාවන් ඇතුළත ක්‍රියාත්මක වීමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට සිදුවී ඇත.

1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය පනතෙහි විධිවිධාන ප්‍රකාරව, ජනාධිපතිවරයා විසින් අනුමත කරන යම් කවර ම මූලාශ්‍රවලින් ලැබෙන පරිත්‍යාග, තෑගි සහ ප්‍රදාන භාර ගැනීමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට බලය තිබෙන අතර, එවැනි යම් කවර ම වූ මූලාශ්‍රවලින් ආයතනයට ලැබෙන පරිත්‍යාග, තෑගි සහ දීමනා ආයතනයේ අරමුදලට ගෙවිය යුතු වේ. ආයතනයේ පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් දරන සියලු ම වියදම් (පඩිනඩි ගෙවීම ද ඇතුළුව) ආයතනයේ අරමුදලින් ගෙවා පියවා දැමිය යුතුය.

භාණ්ඩාගාරය විසින් අධිකරණ අමාත්‍යාංශය හරහා 2025 වර්ෂය සඳහා වන 228 අතුරු සම්මත ගිණුම යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 47.2 ක් සහ පුනරාවර්තන වියදම් ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 29.5 ක් ලබා දී ඇත.

කාර්ය සාධන සමාලෝචනය

ප්‍රධාන කාර්ය සාධන සමාලෝචනය – 2025

- **සමාලෝචනය**

මෙම කොටස මඟින් 2025 වර්ෂය සඳහා වන මූලික කාර්යසාධන දර්ශක (KPIs) හමුවේ අත්කර ගෙන ඇති ප්‍රගතිය ඉදිරිපත් කරන අතර, 2026 වර්ෂය සඳහා ස්ථාපිත කර ඇති උපායමාර්ගික ඉලක්ක පිළිබඳ දළ විශ්ලේෂණයක් ද සපයයි. විධිමත් පුහුණුවීම්, ඩිජිටල් පරිවර්තනය සහ පර්යේෂණ මූලපිරීම් හරහා අධිකරණ ධාරිතාව ශක්තිමත් කිරීමට, වෘත්තීය නිපුනතා ඉහළ නැංවීමට සහ ආයතනික සංවර්ධනය ඉදිරියට ගෙන යාමට මෙම ආයතනය අඛණ්ඩව කැපවී සිටියි.

1.1 අධිකරණ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්

- **ඉලක්කගත වැඩසටහන් ගණන:** 24
- **පවත්වන ලද වැඩසටහන් සංඛ්‍යාව:** 23

1.2 අධිකරණ නිලධාරීන්ගේ සහභාගීත්වය

- **ඉලක්කගත කණ්ඩායම:** සියලුම මහාධිකරණ විනිසුරුවරුන්, දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන් සහ කම්කරු විනිශ්චයාධිකරණ සභාපතිවරුන්

මෙම පුහුණු වැඩසටහන් මගින් පුළුල් ආයතනික ආවරණයක් සහ වෘත්තීය සංවර්ධනයක් සහතික කරමින් අධිකරණ ක්ෂේත්‍රයෙහි සියලුම ස්ථරයන්හි පුළුල් සහභාගීත්ව ලබා ගන්නා ලදී.

- **සමස්ත භෞතික ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස**

අනුක්‍රමික අංකය	දර්ශකය	ඒකක	% දර්ශකය සඳහා බර තැබීම්		ඉලක්කය සහ ප්‍රගතිය (සමුච්චිත)								
					කා 1	%	කා 2	%	කා 3	%	කා 4	%	එකතුව
01	මහාධිකරණ විනිසුරුවරුන්, අධිකරණ නිලධාරීන්, කම්කරු විනිශ්චයාධිකරණ සභාපතිවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම	වැඩසටහන් සංඛ්‍යාව	50%	ඉ	11	63%	04	100%	08	112.5 %	01	300 %	24
				කා	7		04		09		03		23
02	අලුතින් බඳවා ගත් අධිකරණ නිලධාරීන් සඳහා අධිකරණ සේවාරම්භක පුහුණු වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	38%	ඉ	-	-	54	100%	30	100 %	-	-	84
				කා	-		54		30		-		84
03	විනිසුරුවන්ගේ සහරාව ප්‍රකාශනය – X වෙළුම (2025)	පළ කරන ලද ලිපි සංඛයාව	4%	ඉ	-	-	-	-	-	-	-	-	-
				කා	-		-		-		-		-
04	මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන් සඳහා පශ්චාත් උපාධි අනුග්‍රහයන් ලබා දීම.	රු.මි	4%	ඉ	2.1	-	2.1	128.6 %	-	-	-	-	-
				කා	-		2.7		-		-		-
05	කම්කරු විනිශ්චයාධිකරණ සභාපතිවරුන් සඳහා පශ්චාත් උපාධි අනුග්‍රහය පිරිනැමීම	රු.මි	4%	ඉ	0.25	-	0.25	0%	-	-	-	-	-
				කා	-		-		-		-		-
සාමාන්‍ය භෞතික ප්‍රගතිය			100%		21 %		82%		106.25 %		300 %		127.31%

➢ **2025.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීම**

අංකය	ක්‍රියාකාරකම	දර්ශකය		කාලරාමුව				මූල්‍ය ප්‍රගතිය	වෙනත්
				Q1	Q2	Q3	Q4		
1.	ත්‍රස්තවාදය මැඩපැවැත්වීම මහාධිකරණ විනිසුරුවරුන්		ඉ	01	-	-	-		
			කා	**0**					
2.	ශ්‍රී ලංකාවේ අධිකරණය සඳහා ප්‍රජා පාදක විශෝධනයන්		ඉ	01	-	-	-		
			කා	**01**					
3.	CMP පුහුණුව		ඉ	04	03	01	-		
			කා	**01**					
4.	තෝරාගත් විනිසුරුවන් සඳහා GESI ToT වැඩමුළුව		ඉ	-	-	05	-		
			කා	**-**					
5.	විනිසුරුවන් සඳහා IP පුහුණුව		ඉ	-	-	-	-		
			කා	**01**					
6.	මහාධිකරණ, දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ විනිසුරුවරුන් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ පුහුණුව		ඉ	-	-	-	-		
			කා	**01**					
7.	අර්බුදකාරී කාලවලදී අධිකරණ තීරණ ගැනීම සඳහා අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රවේශයක් පිළිබඳ වැඩමුළුව		ඉ	-	-	01	02		
			කා	-		**01**	**02**		
8.	ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරුන් සමඟ අධිකරණ සංවාදයක්		ඉ	-	-	01	-		
			කා	-		**01**			

අරමුදල් සපයන ලද වැඩසටහන්

* 1, 2 සහ 3 කාර්තුවලදී: අරමුදල් සපයනු ලැබූවන්ගේ ප්‍රතිපත්තිවල වෙනස්කම් හේතුවෙන් ඉලක්කගත නොකරන ලද පුහුණු වැඩසටහන් අපි පවත්වා ඇත්තෙමු.

සටහන: මෙම වැඩමුළු සඳහා සම්පූර්ණයෙන්ම අරමුදල් සපයනු ලබන්නේ පරිත්‍යාගශීලී ආයතන විසිනි.

- 2025.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය

	විස්තරය	ප්‍රතිපාදනය (රු.මි)		මූල්‍ය ප්‍රගතිය (සමුච්චිත) රු. මි.				මූල්‍ය ප්‍රගතිය (%)			
				1 කාර්තුව	2 කාර්තුව	3 කාර්තුව	4 කාර්තුව	1 කාර්තුව	2 කාර්තුව	3 කාර්තුව	4tකාර්තුව
	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම										
වැය විෂය	කාර්යාල ගෘහ භාණ්ඩ උපකරණ - වායු සමීකරණ	10.6	ඉ	2.5	2.4	2.4	2.4	28%	24%	24%	24%
			කා	**0.19**	**0.42**	**0.0**	**1.6**	**8%**	**17%**	**0%**	**67%**
	ධාරිතා වර්ධනය										
	අධිකරණ නිලධාරීන්	36.2	ඉ	9.05	9.05	9.05	9.05	**0%**	**32%**	**16%**	63%
			කා	**0**	**3.1**	**1.5**	**5.7**				
	කාර්ය මණ්ඩල පුහුණුව	0.40	ඉ	0.10	0.10	0.10	0.10	**60%**	**30%**	**(-20%)**	0%
			කා	**0.06**	**0.03**	**(0.02)**	**0.00**				
	එකතුව	**47.2**	ඉ	**11.66**	**11.55**	**11.55**	**11.55**	**25%**	**50%**	**75%**	**100%**
			කා	**0.19**	**3.43**	**1.48**	**7.3**	**2%**	**31%**	**13%**	**63%**

ඉ – ඉලක්කය
කා - කාර්යසාධනය

පුහුණු වැඩසටහන්

1985 වර්ෂයේ දී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය ආරම්භ කළ අවස්ථාවේ පටන් ආයතනය තුළ පුහුණු පාඨමාලා සහ වැඩසටහන් ගණනාවක් ම පවත්වා ඇත. කෙසේ වුව ද, 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය වඩ වඩාත් පුළුල් කිරීමත් සමඟ ම, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් දියත් කරන ලද වැඩසටහන් මඟින් මහාධිකරණ විනිශ්චයකාරවරයන්, දිසා විනිශ්චයකාරවරයන්, මහේස්ත්‍රාත්වරුන්, කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරුන්, කාන්සි උසාවිවල විනිශ්චයකාරවරයන් සහ අධිකරණ කළමනාකරණ සහකාරවරුන් සඳහා ද සේවයක් ඉටු කිරීමට අපේක්ෂා කරන ලදී. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මෙහි ඉහත සඳහන් කරන ලද පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අධිකරණය පිළිබඳ අධ්‍යාපනය, කුසලතා සංවර්ධනය ඇතුළුව ශක්‍යතාව සවිබල ගැන්වීම, ආකල්පමය වෙනසක් ඇති කිරීම සහ සමාජමය කැපවීම අරමුණු කරගෙන සකස් කරන ලද වැඩසටහන් හරහා අධිකරණ කාර්ය සාධනයේ ඉහළ ප්‍රමිතියක් සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය කැප වී ක්‍රියා කරයි. තව ද, අධ්‍යාපනය සහ පර්යේෂණ හරහා වැඩි දියුණු කළ අධිකරණ පරිපාලනය සහ කළමනාකරණය තවදුරටත් සංවර්ධනය කොට ස්ථාපිත කිරීම පිණිස ද, විනිශ්චයකාරවරයන්ගේ ආයතනය කැපවීමෙන් යුක්තව සිය සේවය ඉටු කරමින් සිටියි. අධිකරණ සේවාවේ විෂය පථය තුළ සිටින මුල් අධිකරණ බලය හිමි අධිකරණවල විනිශ්චයකාරවරයන් සහ කම්කරු විනිශ්චයාධිකාරීවල සභාපතිවරුන්ගේ පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස කටයුතු කිරීමට විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් දියත් කරන පුහුණු වැඩසටහන්වලින් නිබඳව ම අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පුහුණු වැඩසටහන්වලට සහභාගී වන සියලුම විනිශ්චයකාරවරයන්ට අදාළ වන පොදු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වුව ද, පුහුණු අත්පොත් සහ පුහුණුවට සහභාගී වන්නන්ගේ ස්වභාවය මත පුහුණු අවශ්‍යතාවන් වෙනස් වේ. පුහුණුවේ ස්වභාවය හා අධිකරණ නිලධරයාගේ පළපුරුද්ද හෝ ඔහු විසින් පුහුණු සැසිවාරවල මුල් අවස්ථාවේ දී අත්කරගෙන ඇති දැනුම මත පුහුණු වැඩසටහනක් විධානාත්මක, ස්වේච්ඡා හෝ වෛකල්පික විය හැකිය. අදාළ පුහුණු වැඩසටහන පාලනය කිරීමේ බලය ඇති තැනැත්තා කවරෙක් ද යන වග සහ පුහුණු වැඩසටහන්වලට අරමුදල් සම්පාදනය කරන්නේ කෙසේ ද යන කාරණය සහ පුහුණුවේ ඉලක්කගත කණ්ඩායම් සහ පුහුණුවට ගතවන කාලය යන ගැටළු, පුහුණු වැඩසටහනින් ම ආවරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකාව තුළ අධිකරණ නිලධරයන්ගේ සමස්ත වෘත්තීය ජීවිතය පුරාම ඔවුන්ගේ වෘත්තීමය විශේෂඥතාව ඉහල නැංවීම සහ ඔවුන්ගේ දැනුම වැඩිදියුණු කිරීම ඉලක්ක කරගෙන අනිවාර්ය සේවාස්ථ පුහුණු වැඩසටහනට සහභාගී වන ලෙස නියම කරනු ලැබේ. ඒ අනුව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ආයතනය තුළ එක් එක් සෙනසුරාදා දිනවල දී, පවත්වන සේවාස්ථ පුහුණු වැඩසටහන්වලට සහභාගී වන ලෙස මෙම අධිකරණ නිලධරයන්ට නියම කරන අතර, සහභාගී වීමට නොහැකි වූ අවස්ථාවක දී එවැනි අනිවාර්ය සේවාස්ථ

පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට නොහැකි වීමට බලපෑ හේතුව නිසි බලධරයන් වෙත දැනුම් දීමට නියම කරනු ලැබේ.

අලුතෙන් ම පත්වීම් ලැබ පුහුණුව ලබන අධිකරණ නිලධරයන් ඉලක්ක කරගෙන දෛනික පදනමක් මත හැඳින්වීමේ සහ මූලික පුහුණු වැඩසටහන් පවත්වනු ලබන අතර, එම පුහුණු වැඩසටහන්වලට සහභාගී වීම අනිවාර්ය වේ. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පවත්වන එවැනි පුහුණු සැසිවාරවලට සහභාගී නොවී සිටීමට එම අධිකරණ නිලධරයන්ට නොහැකි වේ. තව ද, සේවයේ නියුක්ත අධිකරණ නිලධරයකු වැඩිදුරටත් පුහුණු වීම සඳහා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට අනුයුක්ත කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් තීරණයක් ගෙන ඇති අවස්ථාවක දී, අනෙක් පුහුණු අවශ්‍යතාව පැන නගිනු ලැබේ.

- **පුහුණුවේ ස්වභාවය**

1. **අනිවාර්ය පුහුණුව**

ඉහත සඳහන් කළ පරිදි සේවයේ නියුක්ත සහ පුහුණුවන අධිකරණ නිලධාරීන් සඳහා වන පවත්නා අඛණ්ඩ අනිවාර්ය අධිකරණ පුහුණුව නොකඩවාම සිදු කර ගෙන යන අතර, වෛකල්පික හා ස්වේච්ඡා පුහුණු වැඩසටහන් හුදෙක් සේවයේ නියුක්ත අධිකරණ නිලධරයන් සඳහා ඉහළ නංවනු ලබයි. කෙසේ වුව ද, අධිකරණ නිලධරයන්ගේ අවශ්‍යතාවන් සැලකිල්ලට භාජනය කරමින් සහ තාක්ෂණය පදනම් කරගත් මුහුණට - මුහුණ ලා කෙරෙන දුරස්ථ අධ්‍යයන තාක්ෂණය පදනම් කරගත් ස්වයං - හැදෑරීමේ අධිකරණ පුහුණුව ප්‍රචලිත වන වර්තමාන සන්දර්භය තුළ වෙනත් අධිකරණ බලසීමාවන් තුළ සිදුවන වෙනස්කම් සැලකිල්ලට භාජනය කරමින් අධිකරණ පුහුණුව සඳහා නව ප්‍රවේශයන් හඳුන්වා දෙනු ලැබේ.

2. **වෛකල්පික පුහුණුව**

අධිකරණ නිලධරයන්ගේ ප්‍රමිතිය සහ අවශ්‍යතාව මත, අධිකරණ කටයුතු වලදී ඉංග්‍රීසි බස ලිඛිතව හැසිරවීම, පෞරුෂතා සංවර්ධනය, පරිගණක පුහුණුව, සෞඛ්‍ය ප්‍රර්ධනය වැනි වෙනත් අධිකරණ බලසීමා සම්බන්ධ ආධාරක පාඨමාලා වෛකල්පික පාඨමාලාවන් වශයෙන් සලකනු ලැබේ. එමෙන් ම සේවාස්ථ අධිකරණ නිලධරයන් සඳහා උපදේශන වැඩසටහන් වැනි ආධාරක පාඨමාලා වෛකල්පික වැඩසටහන් වේ.

3. **පුහුණු කාලසීමාව**

මනා ලෙස ස්ථාපිත ස්වයං සංවර්ධන හෝ පුහුණු වීම් වැඩසටහන්වලින් සංගෘහිත ශාස්ත්‍රීය අධ්‍යයන ආයතනවලින් සැලකිය යුතු ප්‍රමාණයක් විනිසුරුවරුන් බිහිවන රටවල් මෙන් නොව, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත්විට, පෞද්ගලික ක්ෂේත්‍රයේ නීතීඥ වෘත්තියේ හෝ රජයේ නීතීඥ වෘත්තියේ නීතීඥවරයකු වශයෙන් ආරම්භක අනිවාර්ය සේවා කාලයක් සපුරා ඇති නීතිඥවරුන්ගෙන් අධිකරණ නිලධරයන් පත්කරනු ලැබේ. ශ්‍රී ලාංකික අත්දැකීම්වලින් පිළිඹිබු වන්නේ ඇගයීම් ක්‍රමවේදයකට පසුව ආරම්භක පුහුණු කාලය දීර්ඝ කරන

සිවිල් නීති අධිකරණ බලසීමාවන් සමඟ සැසඳීමේ දී, අධිකරණ පුහුණුව සාමාන්‍යයෙන් මාස හයකට පමණ සීමා වන බවයි. මෙම අධ්‍යයන මොඩියුලයෙන් යෝජනා කෙරෙන්නේ අනිවාර්ය ඉදිරිපත් කිරීම්, පර්යේෂණ වැඩ සහ නිබන්ධනයක් ඉදිරිපත් කිරීමත් සමඟම අදාළ පුහුණුව එක් වසරක කාලයක් සඳහා දීර්ඝ කළ යුතු බවයි.

4. **පුහුණු බලධාරීන්**

වර්තමානයේ දී, අධිකරණ නිලධරයන් සඳහා පුහුණුවීම් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් ඉටු කරනු ලබයි. එසේ වුව ද, අධිකරණ නිලධාරීන් සඳහා අදාළ වන සහ ප්‍රයෝජනවත් වන යම් සුවිශේෂී වැඩසටහන් පැවැත්වීම පිණිස ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් ඊට අදාළ රජයේ නියෝජිතායතනවලට සහ විශ්ව විද්‍යාල ආයතනවලට අවසරය ප්‍රදානය කරනු ලැබේ. අධිකරණ නිලධරයන් සඳහා විදේශ පුහුණු වැඩසටහන් දියත් කරන විටක දී, එවැනි පුහුණු සැසිවාර, විදේශීය විශ්ව විද්‍යාල, අධිකරණ අධ්‍යයන ආයතන හෝ ඒ පිළිබඳ විශේෂඥතාවක් ලබා ඇති ආයතනය විසින් පවත්වනු ලබයි. තවද, 2025 වර්ෂයේදී, පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) වැඩසටහන සාර්ථකව නිමකිරීමෙන් පසුව, පුහුණුකරුවන් ලෙස උපරිමාධිකරණ විනිසුරුවරුන්ගෙන් සහ අනෙකුත් විනිසුරුවරුන්ගෙන් යුත් සංචිතයක් නිර්මාණය කිරීමට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සමත් විය.

5. **අධිකරණ පුහුණුකරුවන්**

වර්තමානයේ දී, අධිකරණ නිලධරයන් සඳහා අධිකරණ පුහුණුවීම් ලබා දෙන්නේ ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ අධිකරණ විනිශ්චයකාරවරුන් විසිනි. එසේම, රජයේ නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නීති නිලධාරීන් විසින් ද, යම් තෝරාගත් පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. එමෙන් ම, දැනුම, පළපුරුද්ද සහ අධිකරණ නිලධාරීන් සම්බන්ධයෙන් ලබා ඇති විශේෂඥතාව වැනි සාධක සැලකිල්ලට භාජනය කරමින් අධිකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීම පිණිස සුප්‍රකට නීතිවේදීන් සහ විද්වතුන්ට ද, ආරාධනා කරනු ලැබේ. පුහුණුව ලබන අධිකරණ නිලධරයන්ගේ අධ්‍යාපන පාඨමාලා සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, එම පුහුණු පාඨමාලා හුදෙක් ම විශ්‍රාමික සහ දැනට සේවයේ නිරත අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන් සහ මහාධිකරණ විනිශ්චයකාරවරුන් මෙන් ම, නීතිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ නීති නිලධරයන් විසින් ද පවත්වනු ලැබේ. තව ද, හඳුනාගැනීමේ පෙරෙට්ටු, මරණ පරීක්ෂණ සහ ස්ථානීය පරීක්ෂණ සහ එමෙන් ම ප්‍රකාශ සටහන් කිරීම වැනි ප්‍රායෝගික පුහුණුවීම් හා විවාදාත්මක අධිකරණ සැසිවාර පැවැත්වීම සඳහා ජ්‍යෙෂ්ඨ මහේස්ත්‍රාත්වරුන්ට ද ආරාධනා කරනු ලැබේ. එමෙන් ම, පරිගණක පාඨමාලා, ඉලෙක්ට්‍රොනික පාඨමාලා, මානසික සංවර්ධනය, වෝහාරික වෛද්‍ය විද්‍යා වැඩසටහන් වැනි කාර්යගත ආධාරක පාඨමාලා හුදෙක් ඒ පිළිබඳ විශේෂඥතාවක් ලබා ඇති බාහිර පුහුණුකරුවන් යෙදවීමෙන් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

- **පුහුණු පාඨමාලාවල ඉලක්ක සහ පරමාර්ථ**

1. යුක්තිය පසිදලීමේ දී අධිකරණ නිලධරයාගේ ගරුත්වය සහ විනිශ්චයකාරවරයන්ගේ භූමිකාව අවබෝධ කරගැනීම;

2. අධිකරණ නිලධරයන්ගේ අධිකරණමය සහ පරිබාහිර අධිකරණමය කටයුතුවල දී මහජන විශ්වාසය ගිලිහී යාම අවම කර ගැනීම පිණිස යුක්තිය පසිදලීමේ ක්‍රියාවලියේ දී අධිකරණ නිලධරයන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක වැදගත්කම අවබෝධ කරගැනීම;

3. නඩු කියන්නන්ගේ සහ මහජනතාවගේ සැක පළකිරීමෙන් ඔබ්බට ගොස් පෞද්ගලික කටයුතුවල පාලනය පිණිස මූලික නියමයන් අවබෝධ කරගැනීම;

4. අධිකරණවල සේවයේ නිරත නිලධාරීන්, නඩුකියන්නන් සහ මහජනතාව අතුළුව අධිකරණ චර්යාවේ සහ අධිකරණ ශිල්පයේ රීතීන් අවබෝධ කරගැනීම;

5. අධිකරණ නිලධරයන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය සංවර්ධනය කිරීම; (ලිඛිත ආචාර ධර්ම සංග්‍රහය හෝ ස්වයං-පැනවුම් චර්යා ධර්ම සංග්‍රහය)

- **සේවාස්ථ පුහුණු පාඨමාලාවල අඩංගු දෑ**

1. අධිකරණ චර්යාව, ආචාර ධර්ම සහ ක්‍රියාකලාපය;

2. හරයාත්මක නීතිමය දැනුම (හරවත් සහ කාර්ය පටිපාටික නීතිය - අපරාධ, සිවිල්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, වානිජ නීතිය, අපරාධ සහ සිවිල් නඩු විධාන කාර්ය පටිපාටිය, සාක්ෂි නීතිය ආදිය)

3. විශේෂ නීති සහ පනත්;

4. පෞද්ගලික නීති;

5. මානව අයිතිවාසිකම්;

6. දූෂණ විරෝධී නීති;

7. පරිගණක සාක්ෂරතාව සහ තොරතුරු තාක්ෂණය;;

8. බුද්ධිමය දේපළ;

9. අධිකරණ පරිපාලනය සහ අධිකරණ කළමනාකරණය;

10. නඩු කළමනාකරණය සහ නඩු ප්‍රවාහ කළමනාකරණය;

11. ගිණුම් සහ මුදල්;

12. විනය කාර්ය පටිපාටිය;

13. ළමා යුක්තිය;

14. යුක්තියට සහ නීති ආධාරවලට ප්‍රවේශය;

15. වෝහාරික විද්‍යාව සහ වෝහාරික වෛද්‍ය විද්‍යාව;

16. නඩු තීන්දු ලිවීම;
17. දඩුවම් පැනවීමේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මක කිරීම;
18. පර්යේෂණ ක්‍රමවේදය සහ පරිගණකය ඇසුරින් මාර්ගත පර්යේෂණ ක්‍රමවේදය;
19. විකල්ප ආරවුල් විසඳීම;
20. පෞරුෂත්වය සහ කුසලතා සංවර්ධනය;
21. සෞඛ්‍ය සංවර්ධනය සහ ආතති කළමනාකරණය;
22. ප්‍රායෝගික පුහුණුව, නඩු තීන්දු ලිවීමේ අභ්‍යාස, විසඳනාවන් කෙටුම්පත් කිරීම, චෝදනා සකස් කිරීම, හඳුනාගැනීමේ පෙරෙට්ටු, හදිසි මරණ පරීක්ෂණ පැවැත්වීම, පාපෝච්චාරණ සහ ප්‍රකාශ සටහන් කිරීම, ස්ථානීය පරීක්ෂණ සටහන් සකස් කිරීම;

- **පුහුණු ක්‍රමවේද**

1. කේන්ද්‍රීය සම්මුඛ සන්නිවේදන ක්‍රමවේදය;
2. විමධ්‍යගත / ප්‍රත්‍යන්ත පාදක සම්මුඛ සන්නිවේදන ක්‍රමවේදය;
3. අධිකරණ පාදක උපදේශක ක්‍රමවේදය;
4. පත් කළ උපදේශකවරුන් මඟින් කරන කේන්ද්‍රීය උපදේශක ක්‍රමවේදය (පත් කරන සම්පත් දායකයින්)
5. තනි තනි නිලධරයන් සඳහා රේඛීත ක්‍රමවේදය;
6. තොරතුරු තාක්ෂණය සහ වෙබ් අඩවි පාදක දුරස්ථ අධ්‍යාපන ක්‍රමය;
7. දෛනික වැඩ මෙවලම්, විනිශ්චයාසන පොත්, ශ්‍රව්‍ය සහ දෘෂ්‍ය පටිගත අධ්‍යාපන මෙවලම්;
8. මොඩියුලර්;
9. පාඨමාලා අත්පොත්;
10. පරිශීලන මෙවලම්; 11
11. පර්යේෂණ පත්‍රිකා;
12. වීඩියෝ සම්මේලන;
13. ප්‍රායෝගික ක්‍රමවේද, විවාදාත්මක සැසිවාර;
14. අධිකරණ ආයතන නැරඹීම;
15. ඉදිරිපත් කිරීම;
16. රචනා ලිවීම;
17. පර්යේෂණ වැඩ;
18. තනි පුද්ගල පාඨමාලා මෙවලම් සකස් කිරීම;
19. විදේශීය පුහුණු ක්‍රමවේදය;

20. උපදේශකත්වය;

උපදේශක පුහුණු පාඨමාලාව දෙයාකාර වැඩසටහන්වලින් සමන්විත වන අතර, එනම්, අග්‍රවිනිශ්චයකාරවරයා විසින් පවත්වන අධිකරණ පාදක උපදේශක වැඩසටහන සහ සම්පත් දායකයන් විසින් මෙහෙයවන කේන්ද්‍රීය උපදේශක වැඩසටහන වශයෙනි. ශ්‍රී ලංකාවේ දී, උපදේශකත්වය යම් කවර ම නිල හඳුනා ගැනීමකින් තොරව පෞද්ගලික මට්ටමක දී පුහුණුවක් වශයෙන් භාවිතා කරනු ලැබේ. කෙසේ වුව ද, අලුත් පුහුණු අත්පොත් මඟින් උපදේශක පුහුණු වැඩසටහනක් හඳුන්වා දෙන අතර, ඒ අනුව, ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරුවරුන් වන කෘතහස්ත සම්පත් දායකයන් දෙදෙනෙකු විසින් අධිකරණ නිලධරයන්, මහාධිකරණ විනිසුරන් සහ කම්කරු විනිශ්චයාධිකාරවල සභාපතිවරුන් වෙත උපදෙස් දීම කරනු ලැබේ. උපදේශකවරුන් විසින් පහත සඳහන් කාර්යයන් ඉටුකරනු ලැබේ.

1. අපරාධ නීතිය සහ සාක්ෂි – මුල් අවස්ථා අධිකරණ බලය සහිත සහ අභියාචනා - ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරු (උපදේශක)

2. සිවිල් නීතිය සහ කම්කරු නීතිය - මුල් අවස්ථා අධිකරණ බලය සහිත සහ අභියාචනා - ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණයේ විශ්‍රාමලත් විනිසුරු (උපදේශක)

මෙවැනි ස්වභාවයේ පුහුණු වීම් ප්‍රධාන වශයෙන් ම පුර්ව සැලසුම්ගත දුරකථන ඇමතුම්, ඊමේල්, වෙබ් අඩවි පාදක ක්‍රමවේද මෙන් ම පුර්ව සැලසුම්ගත සම්මුඛ ආයතනික සැසිවාර හරහා පවත්වනු ලැබේ.

- **2025.01.01 සිට 2025.12.31 දක්වා කාලය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ක්‍රියාකාරකම්**

අංකය	වැඩමුළුව, සම්මන්ත්‍රණය/ වෙබිනාරය	දායකත්ව ආයතනය	සහභාගී වූ විනිසුරුවරුන්	සැසි ගණන	සහභාගී වූවන් ගණන	දින
1.	බන්ධනාගාරගත කිරීමට විකල්ප පිළිබඳව විනිසුරුවරුන් දැනුවත් කිරීමේ නේවාසික වැඩමුළුව	UNODC	මහේස්ත්‍රාත්වරු	1	35	2025 ජනවාරි 17-19
2.	ඉදිරිපත් කිරීමේ කුසලතා පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩමුළුව	CEELI ආයතනය	අධියාචනාධිකරණ විනිසුරුවරු සහ මහාධිකරණ විනිසුරුවරු දෙදෙනෙක්	1	10	2025 ජනවාරි 18 – 19
3.	නඩු කළමනාකරණ වැඩසටහන පිළිබඳ නේවාසික වැඩමුළුව	USAID	දිසා විනිසුරුවරු	1	50	2025 ජනවාරි 25 – 26
4.	බුද්ධිමය දේපළ නඩු තීන්දු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ අධිකරණ වැඩමුළුව	UNDP	මහාධිකරණ විනිසුරුවරු / මහේස්ත්‍රාත්වරු	1	40	2025 ජනවාරි 22 – 23
5.	අධිකරණය මඟින් නඩු භාණ්ඩ රාජසන්තක කිරීම සහ විනාශ කිරීම/බැහැර කිරීම පිළිබඳ වෙබිනාර්ව	-	අධිකරණ නිලධාරීන්	1	147	2025 මාර්තු 08

6.	අධිකරණ සේවාරම්භක පුහුණු වැඩසටහන 2025 අවදානමට ලක්විය හැකි ජනගහනය (බාලවයස්කාර යෞවනයන් සහ HIV ආසාදනය වීමේ ප්‍රධාන අවදානමක් ඇති කණ්ඩායම්) සඳහා ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය (SRH) සේවාවන් පිළිබඳ නේවාසික වැඩමුළුව	SLJI	නව කණ්ඩායම 2025 - අධිකරණ නිලධාරීන්	85	49	2025 අප්‍රේල් 02- අගෝස්තු 22
7.		UNFPA	දිසා විනිසුරුවරු/ මහේස්ත්‍රාත්වරු	1	30	2025 අප්‍රේල් 04– 06
8.	ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා යුක්තිය ඉටුකිරීම පිළිබඳ අධිකරණ සම්මන්ත්‍රණය	UNICEF	අධිකරණ නිලධාරීන්	1	30	2025 අප්‍රේල් 25 - 27
9.	ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා යුක්තිය ඉටුකිරීම පිළිබඳ අධිකරණ සම්මන්ත්‍රණය	UNICEF	අධිකරණ නිලධාරීන්	1	35	2025 මැයි 16 -18
10.	මූල්‍ය අපරාධ විමර්ශනය කිරීම සහ නඩු පැවරීම පිළිබඳ වෙබිනාර්ව	-	මහේස්ත්‍රාත්වරු	1	38	2025 මැයි 21, 22 සහ 23
11.	1990 අංක 2 දරන ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සහ	-	දිසා විනිසුරුවරු/ අලුතින් බඳවා ගන්නා ලද විනිසුරුවරු	1	175	2025 ජූලි 05

	ඒ ආශ්‍රිත නීති පිළිබඳ එක්දින දෙමුහුන් (Hybrid) වැඩමුළුව					
12.	ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා යුක්තිය ඉටුකිරීම පිළිබඳ අධිකරණ සම්මන්ත්‍රණය	UNICEF	අධිකරණ නිලධාරීන්	1	35	2025 ජූලි 11 - 13
13.	වාණිජ සමථකරණය සහ බේරුම්කරණය පිළිබඳ මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වන නේවාසික වැඩමුළුව: නෛතික රාමුව, හොඳම භාවිතයන් සහ අභියෝග	ADB	මහාධිකරණ විනිසුරුවරු	1	20	2025 ජූලි 18 - 20
14.	අර්බුදකාරී කාලවල්වලදී අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයකින් අධිකරණ තීන්දු ගැනීම පිළිබඳ නේවාසික වැඩමුළුව	මැක්ස් ප්ලාන්ක් පදනම	මහාධිකරණ විනිසුරුවරු	1	30	2025 අගෝස්තු 22 – 24
15.	එක්සත් රාජධානියේ ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු සභාපතිනි, The Baroness Hale of Richmond ලෙස විරුධාවලිය ලත් ලේඩි බ්‍රෙන්ඩා හේල් (DBE) මහත්මිය විසින්	මැක්ස් ප්ලාන්ක් පදනම	මහාධිකරණ විනිසුරුවරු, දිසා විනිසුරුවරු, මහේස්ත්‍රාත්වරු.	1	9	2025 අගෝස්තු 27t

	පවත්වනු ලබන ප්‍රසිද්ධ දේශනය					
16.	ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් සමඟ අධිකරණ සංවාදය	මැක්ස් ප්ලාන්ක් පදනම	ශ්‍රේෂ්ඨාධිකරණ/අභියාචනාධිකරණ විනිසුරුවරුන්	1	30	2025 අගෝස්තු 29 – 31
17.	අධිකරණ ශාලාවල නඩු භාණ්ඩ බැහැර කිරීම/විනාශ කිරීම පිළිබඳ දෙමුහුන් (Hybrid) සැසිය	SLJI	මහාධිකරණ විනිසුරුවරු, මහේස්ත්‍රාත්වරු.	1	336	2025 සැප්තැම්බර්2
18.	මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වන දිශානුගතකිරීමේ (Orientation) වැඩසටහන	SLJI	මහාධිකරණ විනිසුරුවරු	7	18	2025 සැප්තැම්බර්8 – 16
19.	විකල්ප ආරවුල් විසඳීම පිළිබඳ අධිකරණ සම්මන්ත්‍රණය	CCC-ICLP International ADR Center together with the Commercial Law Development Program of the US Department of Commerce	මහාධිකරණ විනිසුරුවරු	1	5	2025 සැප්තැම්බර්13
20.	වාණිජ මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වන දිශානුගතකිරීමේ (Orientation) වැඩසටහන	SLJI	මහාධිකරණ විනිසුරුවරු		6	2025 ඔක්තෝම්බර් 1 – 14

21.	අර්බුදකාරී කාලවල්වලදී අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයකින් අධිකරණ තීන්දු ගැනීම පිළිබඳ නේවාසික වැඩමුළුව	මැක්ස් ප්ලාන්ක් පදනම	අධිකරණ නිලධාරීන්	24	2025 ඔක්තෝම්බර් 10 – 12
22.	අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන ප්‍රායෝගිකව උපයෝගී කර ගැනීම පිළිබඳ දෙමුහුන් සැසිය	SLJI	මහේස්ත්‍රාත්වරු		2025 ඔක්තෝම්බර් 25
23.	කම්කරු විනිශ්චය සභා විනිසුරුවරුන් සඳහා කම්කරු ආරවුල් වැළැක්වීම සහ විසඳීම පිළිබඳ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කේන්ද්‍ර කරගත් ප්‍රවේශයන් පිළිබඳ නේවාසික වැඩමුළුව	ILO – International Training Centre	කම්කරු විනිශ්චයාධිකරණ සභාපතිවරු	31	2025 නොවැම්බර් 1 – 2
24.	ඩිජිටල් යුගයේ යුක්තිය පසිඳලීම පිළිබඳ සම්මන්ත්‍රණය	UNDP	ශ්‍රේෂ්ඨාධිකරණ/ අභියාචනාධිකරණ විනිසුරුවරු, මහාධිකරණ විනිසුරුවරු, අධිකරණ නිලධාරීන්	75	2025 නොවැම්බර් 13 – 16
25.	අලුතින් පත් වූ අධිකරණ නිලධාරීන් සඳහා වන එක්දින සමාරම්භක පුහුණු වැඩසටහන	SLJI	අධිකරණ නිලධාරීන්	9	2025 නොවැම්බර් 25

26 .	ඩිජිටල් යුගයේ අධිකරණ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය ඉහළ නැංවීම පිළිබඳ වාර්ෂික සමුළුව සහ නේවාසික වැඩමුළුව	UNDP	අධිකරණ නිලධාරීන්	240	2025 දෙසැම්බර් 20– 21

- **විදේශ පුහුණු**

බෝපාල්හි ජාතික අධිකරණ ඇකඩමිය සමඟ ඇති කරගත් හවුල්කාරිත්වයකට අනුව, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන් 10 දෙනෙකුගෙන් සහ මහාධිකරණ විනිසුරුවරුන් 20 දෙනෙකුගෙන් සමන්විත විනිසුරු කණ්ඩායම් 2ක් 2025 දෙසැම්බර් 8-10 සහ දෙසැම්බර් 15-19 දක්වා ඉන්දියාවේදී පැවැත්වුණු පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූහ. ශ්‍රී ලංකා **විනිශ්චයකාරවරයන්ගේ** ආයතනය විසින් මෙම වැඩසටහන් සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම සිදු කරන ලදී.

- **මූල්‍ය ප්‍රතිපාදන**

ධාරිතා වර්ධනය සඳහා ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයට (SLJI) 2025 වර්ෂයේදී රුපියල් මිලියන 36.2 ක මුදලක් වෙන් කරනු ලැබීය. අධිකරණ නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා වන අප්‍රතිහත කැපවීමක් ලෙස, පශ්චාත් උපාධි පාඨමාලා හදාරන අධිකරණ නිලධාරීන් සඳහා මූල්‍ය ආධාර සැපයීම සඳහා මෙම ප්‍රතිපාදනය විශේෂයෙන් නම් කරන ලදී. මෙම මුලපිරීම අධ්‍යයන දියුණුව පෝෂණය කිරීමෙහිලා මෙන්ම අපගේ නිලධාරීන්ට ඔවුන්ගේ නීති විශේෂඥතාව වැඩි දියුණු කිරීමට අවස්ථාව ලබා දීමෙහිලා වන අපගේ කැපවීම උද්දීපනය කර දක්වයි. අප අධිකරණ විනිසුරුවරුන්ගේ උසස් අධ්‍යාපනය සඳහා ආයෝජනය කිරීමෙන්, තනි පුද්ගල වෘත්තීයභාවයන් ඉහළ නැංවීමක් සිදුකරන්නේ පමණක් නොව, අධිකරණ පද්ධතියේ සාමූහික දැනුම සහ හැකියාවන් ඉහළ නැංවීමක් සිදුවේ.

2025 වර්ෂයේදී, අපගේ පුස්තකාලය සහ ශ්‍රවණාගාරය පුළුල් ප්‍රතිසංස්කරණයකට ලක්වූ බැවින්, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය (SLJI) සැලකිය යුතු අභියෝගයකට මුහුණ දුන්නේය. අපගේ විනිසුරුවරුන්ගේ පර්යේෂණ සහ සාමූහික ඉගෙනීම සඳහා අත්‍යවශ්‍ය වන මෙම අත්‍යවශ්‍ය පහසුකම් තාවකාලිකව ප්‍රවේශ විය නොහැකි විය. මෙම පසුබෑම මධ්‍යයේ වුවද, අධිකරණ අමාත්‍යාංශයේ නොමසුරු අරමුදල් හරහා Law Ceylon නමින් හැඳින්වෙන මාර්ගගත නෛතික දත්ත පද්දතිය වෙත විනිසුරුවන්ට ප්‍රවේශය ලබා දීමෙන් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය එම ඍණාත්මක බලපෑම් අවම කරීමට කටයුතු කරන ලදි. මෙම ක්‍රියාමාර්ගය හරහා ප්‍රයෝජනවත් නෛතික තොරතුරු විශාල ප්‍රමාණයක් වෙත අඛණ්ඩ ප්‍රවේශය සහතක කරන්නේ පමණක් නොව යටිතල පහසුකම් පිලිසකරකිරම් සිදු කරන අතරවාරයේදී විනිසුරු අධ්‍යයන කටයුතු සඳහා මෙන්ම ඔවුන්ග් ධාරිතා වර්ධනය කිරීම සඳහා වන අපගේ කැපවීම විදහා දක්වයි.

මූල්‍ය කාර්ය සාධනය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ගණකාධිකාරීවරුන් විසින් සකසන ලද පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකසන ලදී.

සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් මිස, මූල්‍ය ප්‍රකාශයන්හී ඉදිරිපත් කර ඇති සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි.

2. උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදුකර නොමැත.

3. රජයේ ප්‍රදානයන්

රජයේ ප්‍රදාන ගිණුම්ගත කරනු ලබන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) 11 - විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම (ප්‍රදාන සහ මාරු කිරීම්) අනුව ය.

(අ) වත්කම් අත්පත් කර ගැනීමට අදාළ ප්‍රදාන

දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සඳහා ලැබෙන රජයේ ප්‍රදානයන්, එම හුවමාරු කරන ලද සම්පත්වල පාලනය ආයතනය සතු වන විට සහ වත්කම් හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලන විට වත්කම් ලෙස හඳුනා ගනු ලබයි.

එවැනි ප්‍රදානයන් කිසිදු කොන්දේසියකින් තොරව ලැබෙන අවස්ථාවලදී, එම ප්‍රදාන ආදායම වත්කමේ පාලනය ලබා ගන්නා අවස්ථාවේදී එය ආදායමක් ලෙස හඳුනා ගනු ලැබේ. කොන්දේසි සහිතව ලැබෙන අවස්ථාවලදී, එම කොන්දේසි සපුරාලනු ලබන ප්‍රමාණයට අනුකූලව ආදායම හඳුනා ගනු ලැබේ.

(ආ) අනෙකුත් රජයේ ප්‍රදාන

මෙහෙයුම් අරමුණු සඳහා ලැබෙන රජයේ ප්‍රදාන, අදාළ වියදම් හෝ බැඳීම් පැන නගින කාල සීමාව තුළ හෝ ආයතනය අදාළ සම්පත්හි පාලනය ලබා ගන්නා විට, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ආදායමක් ලෙස පිළිගනු ලැබේ.

4. ඉන්වෙන්ටරි (තොග)

තොග තක්සේරු කරනු ලබන්නේ පිරිවැයට අනුව ය. පිරිවැය තීරණය කරනු ලබන්නේ පෙර ඇතුළු පෙර පිට (FIFO) පදනම මත වන අතර තොග ඒවායේ වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද සියලු වියදම් ඇතුළත් වේ.

5. වගකීම් සහ ප්‍රතිපාදන.

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනයට වර්තමානයේදී නෛතික හෝ සම්මුතික බැඳීමක් පවතින විට සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයන් සහිත සම්පත් බාහිරට ගලායෑමක් සිදුවීමට ඉඩකඩ ඇති විට මෙන්ම, එම මුදල නිවැරදිව ඇස්තමේන්තු කළ හැකි අවස්ථාවන්හිදී ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ.

6. පාරිතෝෂික ප්‍රතිපාදන

අදාළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සේවකයින්ට ගෙවිය යුතු පාරිතෝෂික සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා ඇත. පාරිතෝෂික වගකීම ගණනය කරනු ලබන්නේ වාර්තාකරණ දිනය වන විට සේවකයින් සම්පූර්ණ කර ඇති සේවා කාලය පදනම් කරගෙනය.

පාරිතෝෂික වගකීම සඳහා බාහිරින් අරමුදල් සපයා නොමැති අතර, එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අරමුදල් සපයා නොමැති වගකීමක් (unfunded liability) ලෙස හඳුනා ගනු ලැබේ.

7. දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනීම සහ ප්‍රාග්ධනීකරණය

දේපළ, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ යනාදියෙහි පිරිවැය, වත්කමක් අනුව හඳුනාගැනීමක් කරනුයේ පහත පරිදිය.

අ) අයිතමය හා සම්බන්ධ සේවා විභවයේ අනාගත ආර්ථික ප්‍රතිලාභ වසරකට වැඩි කාලයක් ආයතනයට ගලා යාමට ඉඩ ඇති විටදී.

ආ) භාණ්ඩයේ සාධාරණ වටිනාකමේ පිරිවැය විශ්වසනීයව මැනිය හැකි විටදී.

ඇ) ප්‍රදානිත වත්කම් අත්පත් කර ගත් දිනට ඒවායේසාධාරණ වටිනාකමට හඳුනා ගැනෙන විටදී

රු. 10,000 ට වැඩි පිරිවැයක් හෝ සාධාරණ වටිනාකමක් ඇති වත්කම් දේපළ, පිරියත සහ උපකරණ ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර එම සීමාවට වඩා අඩු වටිනාකමක් ඇති වත්කම් ඒවා අත්පත් කරගත් කාල සීමාව තුළ වියදමක් ලෙස සටහන් වේ.

8. දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ ආරම්භයේදී පිරිවැය මත හඳුනා ගනු ලැබේ. 2025 වර්ෂයේදී ආයතනය විසින් සියලුම වත්කම් කාණ්ඩ ප්‍රත්‍යාගණනය කරන ලද අතර, ඒවායේ ධාරණ අගයන් සාධාරණ අගයන්ට (Fair values) ගැළපූ බැව් නිරීක්ෂණය විය.

ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, දේපළ, පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂයවීම් සහ කිසියම් හායන හානි (ඇත්නම්) අඩු කිරීමෙන් පසු ප්‍රත්‍යාගණනය කරන ලද අගය මත පවත්වාගෙන යනු ලැබේ. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුළ ඒවායේ පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය කළ අගය වෙන් කිරීම සඳහා පහත සඳහන් පදනම උපයෝගී කර ගනිමින් ක්ෂයවීම් ගණනය කරනු ලැබේ.

9. අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් ආරම්භයේදී පිරිවැය මත වාර්තා කරනු ලැබේ. රජයේ ප්‍රදාන හෝ පරිත්‍යාග ලෙස ලැබෙන අස්පෘශ්‍ය වත්කම්, ඒවා අත්පත් කරගත් දිනයේ පවතින සාධාරණ අගය මත හඳුනා ගනු ලැබේ. 2025 වර්ෂයේදී ආයතනය විසින් අස්පෘශ්‍ය වත්කම් සඳහා හායන සමාලෝචනයක් සිදු කරන ලද අතර, හඳුනාගත් කිසියම් හායන හානියක් ඇත්නම් ඒ සඳහා ධාරණ අගයන් ගැළපූ බැව් නිරීක්ෂණය විය.

ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ කිසියම් හායන හානි (ඇත්නම්) අඩු කිරීමෙන් පසු පිරිවැය හෝ සාධාරණ අගය මත පවත්වාගෙන යනු ලැබේ. වත්කමක ප්‍රයෝජනවත් ආයු කාලය අනියත නොවේ නම්, එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුළ සරල මාර්ග ක්‍රමය (Straight-line basis) මත ක්‍රමක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

10. ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය

(අ) දේපළ, පිරියත සහ උපකරණ

වත්කම භාවිතයට සූදානම් වූ දින සිට සියලුම දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ ප්‍රත්‍යාගණනය මුදල මත ක්ෂයවීම ගණනය කෙරේ. එක් එක් වත්කමෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පුරාවට ක්ෂයවීම් ගාස්තුව සරල රේඛීය පදනමක් මත හඳුනා ගැනේ.

(ආ) අස්පෘශ්‍ය වත්කම් (Intangible Assets)

අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුළ සරල රේඛීය පදනම මත ක්‍රමක්ෂය කරනු ලැබේ. කෙසේවුවද, අනියත (Indefinite) ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය නොකරන අතර ඒවා හායනය සඳහා පරීක්ෂාවට භාජනය කරනු ලැබේ.

ක්ෂය / ක්‍රමක්ෂය අනුපාත:

දේපළ පිරියත සහ උපකරණ:

කාර්යාලීය උපකරණ	20%
ගෘහ භාණ්ඩ හා උපාංග	12.5%
පුස්තකාල පොත්	10%

පරිගණක උපකරණ	25%
විද්‍යුත් උපකරණ	20%
පැන්ට්‍රි අයිතම	12.5%
ගමන් මළු	10%
යන්ත්‍ර සූත්‍ර	12.5%
වාහන	20%

අස්පෘශ්‍ය වත්කම්	25%

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2025		2024
		රු.	රු.	රු.
වත්කම්				
ජංගම වත්කම්				
මුදල් හා මුදල් සමාන දෑ	3	370,701		367,351
තොග (කාර්යාලීය ලිපි ද්‍රව්‍ය)		882,655		931,286
			1,253,356	1,298,637
ජංගම නොවන වත්කම්				
දේපළ පිරියත සහ උපකරණ	4	80,660,248		6,316,387
අස්පෘෂ්‍ය වත්කම්	5	1,671,156		3,607,214
ආපසු ගෙවිය යුතු තැන්පතුව		1,000	82,332,404	1,000
මුළු වත්කම්			83,585,759	11,223,238
වගකීම්				
ජංගම වගකීම්				
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		465,000		450,000
පාරිතෝෂිතය සඳහා ප්‍රතිපාදන		-		178,200
උපචිත වියදම්	6	769,237		181,810
			1,234,237	810,010
ජංගම නොවන වගකීම්				
පාරිතෝෂිතය සඳහා ප්‍රතිපාදන	7	1,384,483	1,384,483	988,700
මුළු වගකීම්			2,618,720	1,798,710
ශුද්ධ වත්කම්			80,967,039	9,424,528
ශුද්ධ වත්කම් / හිමිකම්				
ප්‍රග්ධන ප්‍රදාන			14,380,985	14,380,985
සමුච්චිත අතිරික්තය (හිඟ)	8		42,532,450	(7,798,054)
අඩු කළා: වර්ෂය සඳහා හිඟ /එකතු කළා : වසරේ ලාභය			24,053,605	2,841,598
			80,967,039	9,424,528
				9,424,528
			80,967,039	

2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

	සටහන	2025		2024
		රු.	රු.	රු..
ආදායම්				
පුනරාවර්තන ප්‍රදාන ලැබීම්	9	27,674,764		17,858,641
ප්‍රාග්ධන ප්‍රධාන ලැබීම්	10	32,796,447		8,426,494
විදේශ ප්‍රධාන ලැබීම්	11	16,551,887		4,645,460
ඉතිරිකිරීම් ගිණුමෙන් ලද පොළිය		9,155		8,967
වෙනත් ආදායම් -කුලී ආදායම	12	24,000		-
වෙනත් ආදායම් - හඳුනානොගත් තැන්පතු		-		5,000
මුළු ආදායම			**77,056,253**	**30,944,563**
අඩු කළා: වියදම්				
රැකියා ප්‍රතිලාභ පිරිවැය				
වැටුප හා වේතන	13	15,522,630		7,879,811
සේවක අර්ථසාධක අරමුදල් වියදම්		1,546,173		751,064
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් වියදම්		454,460		187,766
කාර්ය මණ්ඩල පුහුණු		70,553		125,394
අතිකාල		377,291		207,611
වෙනත් දීමනා	14	390,000		573,935
පාරිතෝෂිතය		217,583		540,863
			18,578,690	**10,266,444**
මෙහෙයුම් කටයුතු				
සම්මන්ත්‍රණ සහ පුහුණු වියදම්	15	8,828,418		6,333,545
විදේශීය පුහුණු වැඩසටහන් සඳහා වියදම්	16	1,152,066		1,417,497
නීති දත්ත සංහිතාවේ හානිකරණ පාඩුව		3,517,995		
වත්කම් බැහැර කිරීමේදී සිදුවන පාඩුව		10,841		
ආරක්ෂක ගාස්තු		612,522		1,204,796
			14,121,842	**8,955,838**

භාවිත කරන ලද සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය				
තැපැල් ගාස්තු		46,490		32,750
කාර්යාලීය ලිපි ද්‍රව්‍ය වියදම්		976,484		596,843
මුද්‍රණ වියදම්		2,500		-
ඉන්ධන		398,156		205,895
වෙනත් සේවා සහ සැපයුම්	17	2,432,939		1,859,861
			3,856,569	**2,695,350**
මූල්‍ය පිරිවැය				
WHT		804		448
බැංකු ගාස්තු		6,000		18,763
			6,804	**19,211**
වෙනත් වියදම්				
ගමන් වියදම්		54,127		64,063
වාහන නඩත්තු		514,341		456,482
ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව	18	1,588,285		573,439
පරිවර්තන ගාස්තු		120,143		110,935
දුරකතන සහ අන්තර්ජාල ගාස්තු		289,461		271,568
පිරිසිදු කිරීමේ ගාස්තු		1,100,565		810,099
විදුලි සහ ජල වියදම්		1,917,446		1,571,391
ක්ෂය වීම සහ ක්‍රමක්ෂය කිරීම	19	10,425,196		1,904,646
විගණන ගාස්තු		429,180		403,500
			16,438,744	**6,166,122**
මුළු වියදම්			**53,002,649**	**28,102,965**
අතිරික්තය (හිඟ)			**24,053,605**	**2,841,598**

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2025		2024
		රු.	රු..	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්				
ලැබීම්				
අමාත්‍යාංශයෙන් ලැබුණු පුනරාවර්තන අග්‍රිම		27,669,756		15,082,454
පොළී ලැබීම්		8,351		8,519
පෙර වසරට අදාළව අවලංගු කරන ලද චෙක්පත්				
ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්		11,996,447		8,408,494
වෙනත් ආදායම්		-		7,204
කුලී ආදායම		24,000		
චන්දිගාර් අධිකරණ ඇකඩමියේ ගෙවීම් සඳහා ලැබුණු මුදල්				
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා ඒම්			39,698,554	23,506,671
ගෙවීම්				
වැටුප්, වේතන සහ රැකියා ප්‍රතිලාභ	20	(18,326,337)		(10,080,027)
මෙහෙයුම් ක්‍රියාකාරකම්	21	(12,951,449)		(9,976,285)
සැපයුම් සහ පරිභෝජනය කළ හැකි දෑ	22	(6,890,352)		(2,829,726)
මූල්‍ය පිරිවැය	23	(6,000)		(18,763)
මුද්දර ගාස්තු		(5,175)		(4,550)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ගලා යාම			(38,179,314)	(22,909,351)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහය			**1,519,240**	**597,320**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ප්‍රවාහය				
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහය				
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිතවූ මුදල් ප්‍රවාහයන්				
ස්ථාවර වත්කම් මිළට ගැනීම්	24	(1,515,890)		583,800
ගිණුම්කරණ මෘදුකාංග මිලදී ගැනීම			(1,515,890)	583,800
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිතවූ ශුද්ධ මුදල් ප්‍රවාහය				
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම			3,350	13,520
ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ			367,351	353,830
අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ	25		370,701	367,351

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම්වල වෙනස්කම් ප්‍රකාශය

	දායකවූ ප්‍රාග්ධනය	සමුච්චිත අතිරික්තය (හිඟය)	එකතුව (රු.)
2024.01.01 දිනට ශේෂය	**18,315,483**	**(11,732,578)**	**6,582,905**
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් - රජයෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන, ප්‍රාග්ධන සංචිත ලෙස වෙනුවට ආදායම ලෙස පිළිගනු ලැබේ.	(3,934,498)	-	(3,934,498)
වර්ෂයේ අතිරික්තය (හිඟ)	-	2,841,598	2,841,598
2025.01.01 දිනට ශේෂය	**14,380,985**	**(4,956,482)**	**9,424,503**
2024 වසරේ හඳුනා නොගත් තැන්පතුව ඒකාබද්ධ අරමුදලකට තැන්පත් කිරීම.		(5,000)	(5,000)
වර්ෂයේ අතිරික්තය (හිඟ)	-	24,053,605	24,053,605
ප්‍රත්‍යාගණනය කළ අතිරික්තය - කාර්යාල උපකරණ	-	2,118,424	2,118,424
ප්‍රත්‍යාගණනය කළ අතිරික්තය – ගෘහභාණ්ඩ හා සවිකිරීම්	-	5,205,432	5,205,432
ප්‍රත්‍යාගණනය කළ අතිරික්තය – පරිගණක උපකරණ	-	29,838,701	29,838,701
ප්‍රත්‍යාගණනය කළ අතිරික්තය- පුස්තකාල පොත්	-	10,331,373	10,331,373
2025.12.31 දිනට ශේෂය	**14,380,985**	**66,586,055**	**80,967,039**

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන 03

මුදල් හා මුදල් සමාන දෑ.

දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා රුපියල්වලින්	2025	2024
ජංගම ගිණුම	-	5,002
ඉතිරිකිරීමේ ගිණුම	**370,701**	362,349
	370,701	**367,351**

සටහන 04

දේපළ, පිරියත හා උපකරණ

පිටු අංක 9 බලන්න.

සටහන 05

අස්පෘෂ්‍ය වත්කම්

පිරිවැය/සාධාරණ වටිනාකම	නීති දත්ත ගබඩාව	ගිණුම්කරණ මෘදුකාංගය	SLJI වෙබ් අඩවිය	SLJI වෙබ් අඩවියේ WIP	පුස්තකාල කළමනාකරණ පද්ධතිය	එකතුව
2025.01.01 දිනට ශේෂය	3,517,995	390,000	-	-	-	3,907,995
වසර තුළ එකතු කිරීම්	-	-	1,200,000	98,875	490,000	1,788,875
භාණ්ඩාගාරය - 2025	(3,517,995)	-	-	-	-	(3,517,995)
2025.12.31 දිනට ශේෂය	-	390,000	1,200,000	98,875	490,000	2,178,875
සමුච්චිත ක්‍රමක්ෂය						
2025.01.01 දිනට ශේෂය	-	300,781	-	-	-	300,781
වසර තුළ එකතු කිරීම්	-	89,219	116,712	-	1,007	206,938
2025.12.31 දිනට ශේෂය	-	390,000	116,712	-	1,007	507,719
2025.12.31 දිනට ශුද්ධ වටිනාකම	**-**	**0**	**1,083,288**	**98,875**	**488,993**	**1,671,156**

5.1 අභ්‍යන්තරව සකස් කරන ලද නීති දත්ත සමුදාය

ආයතනය අභ්‍යන්තරව නීති දත්ත ගබඩාවක් (මෘදුකාංගයක්) සංවර්ධනය කර ඇති අතර එය පූර්වයෙන් අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, මෘදුකාංගය 2017 සිට ක්‍රියාකාරී භාවිතයේ නොමැත. 2024 මූල්‍ය වර්ෂයේදී, ආයතනයෙහි මෙම පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිසංවර්ධන ක්‍රියාවලියක් ආරම්භ කරන ලදි. අඛණ්ඩ යාවත්කාලීන කිරීම් සහ වැඩිදියුණු කිරීම් වල ස්වභාවය සැලකිල්ලට ගෙන, නීති දත්ත පද්දතිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) - අස්පෘශ්‍ය වත්කම් වලට අනුකූලව අවිනිශ්චිත ප්‍රයෝජනවත් ආයු කාලයක් නොමැතිවූවක් බවට වර්ගීකරණය කර ඇත.අවිනිශ්චිත ප්‍රයෝජනවත් ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කමක් ක්‍රමක්ෂය නොකෙරෙන නමුත් එය වාර්ෂික හෝ හානිකරණ ඇඟවීමක් ඇති විටෙක හානිකරණ පරීක්ෂණයකට යටත් වේ. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළදී, නීති දත්ත සමුදායේ තත්ත්වය නැවත ඇගයීමකට ලක් කරන ලද අතර, 2025.12.31 දින වන විට එම පද්ධතියෙන් කිසිදු සේවා විභවයක් නොලැබෙන බව තීරණය කරන ලදී. ඒ අනුව, 2025.09.30 දින හාණිකරන ඇගයීමක් සිදු කරන ලද අතර, රු. 3,517,995.00 ක් වූ ධාරණ අගය (carrying amount) සම්පූර්ණයෙන්ම ඌනිත අගයට පත් කරන ලදී. ඒ අනුව, රු. 3,517,995.00 හාණිකරන අලාභයක්, 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි හඳුනාගෙන ඇත. ආයතනය විසින් 2026 වර්ෂයේදී මෙම පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට සහ නැවත සංවර්ධනය කිරීමට දැනට සැලසුම් සහගත මට්ටමක පැවතුණද, වාර්තාකරණ දිනය වන විටත් කිසිදු නැවත සංවර්ධනය කිරීමක් ආරම්භ කර නොතිබූ අතර කිසිදු සේවා විභවයක්ද නොපැවතුණි. එබැවින්, මෙම වත්කමේ අගය ශූන්‍ය (nil) දක්වා අඩු කර ඇත. අනාගතයේදී සිදු කරනු ලබන ඕනෑම නැවත සංවර්ධන වියදමක්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර) අනුකූලව නව අස්පෘශ්‍ය වත්කමක් ලෙස ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා ඇගයීමට ලක් කරනු ඇත.

5.2 ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ (SLJI) වෙබ් අඩවිය

වර්ෂය තුළදී, USAID (ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපද නියෝජිතායතනය) මූල්‍ය ආධාර යටතේ සංවර්ධනය කරන ලද වෙබ් අඩවියක් මෙම ආයතනය වෙත ලැබී ඇත. මෙම වෙබ් අඩවිය 2025 අගෝස්තු 12 දින නිල වශයෙන් ආයතනය වෙත භාර දී ඇති අතර, එම දිනයේදී එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) 20 ට අනුකූලව, ඇගයීම් කමිටුවක් විසින් තීරණය කරන ලද රු. 1,200,000.00 ක සාධාරණ අගය (fair value) මත මෙම වෙබ් අඩවිය හඳුනාගෙන තිබේ. ආයතනික තොරතුරු ප්‍රචාරය කිරීම සහ පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය මඟින් මෙම වෙබ් අඩවිය හරහා සේවා විභවයක් (service potential) සැපයෙයි.

සටහන 06
උපචිත
වියදම්

ගෙවිය යුතු දුරකතන බිල්	78,795	76,093
ගෙවිය යුතු EPF - ඉසුරි කාවින්දි	-	4,200
ගෙවිය යුතු ETF - ඉසුරි කාවින්දි	-	630
ගෙවිය යුතු ආරක්ෂක ගාස්තු	209,450	-
ගෙවිය යුතු පිරිසිදු කිරීමේ ගාස්තු	178,888	85,704
ගෙවිය යුතු මුද්දර ගාස්තු	1,950	25
ගෙවිය යුතු ඉන්ධන ගාස්තු	14,958	-
ගෙවිය යුතු විදුලි හා ජල ගාස්තු	245,960	
ගෙවිය යුතු අතිකාල	39,235	
ගෙවිය යුතු අනෙකුත් දෑ	-	15,159
	769,237	**181,810**

සටහන 04

දේපළ , පිරියත හා උපකරණ

කාර්යාල උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම්, පරිගණක උපකරණ සහ අනෙකුත් නැවත වර්ගීකරණය කරන ලද වත්කම් පන්ති (Reclassified classes) 2025 සැප්තැම්බර් 30 දිනට ප්‍රත්‍යාගණනය කර ඇත. පුස්තකාල පොත් 2025 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණනය කර තිබේ. වාහන, ඒවා හඳුනාගත් දිනයේදී පැවති සාධාරණ අගය මත හඳුනාගෙන ඇත.

පිරිවැය	2025/01/01 දිනට ශේෂය	වසර තුළ එකතු කිරීම	වසර තුළ බැහැර කිරීම	ඇතුළට ගලාඒම්/පිට තට මාරු කිරීම - නැවත වර්ගීකරණය කිරීම	ප්‍රත්‍යාගණන ඉහළ යෑම්	ප්‍රත්‍යාගණනය කළ දිනය දක්වා සමුච්චිත ක්ෂයවීම්	2025/12/31 දිනට ශේෂය	2024/12/31 දිනට ශේෂය
වාහන	-	20,800,000	-	-	-	-	20,800,000	-
කාර්යාල උපකරණ	2,655,354	603,943	(610,607)	(235,122)	2,118,424	(1,206,342)	3,325,650	2,655,354

ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	3,301,725	1,148,918	(1,748,731)	475,421	5,205,432	(1,559,986)	6,822,780	3,301,725
පුස්තකාල පොත්	7,361,608	31,000	(442,040)	-	10,331,373	(6,254,308)	11,027,634	7,361,608
පරිගණක උපකරණ	48,712,672	14,495,166	(2,978,169)	67,200	29,838,701	(44,226,250)	45,909,320	48,712,672
විදුලි උපකරණ	2,010,837	-	(330,953)	(1,409,884)	-	-	270,000	2,010,837
පැන්ට්‍රි අයිතම	121,858	-	(53,188)	(68,670)	-	-	-	121,858
ගමන් මලු	20,100	-	-	(20,100)	-	-	-	20,100
යන්ත්‍ර සූත්‍ර	1,266,905	-	-	(365,190)	-	-	901,715	1,266,905
	65,451,061	**37,079,027**	**(6,163,689)**	**(1,556,345)**	**47,493,932**	**(53,246,886)**	**89,057,099**	**65,451,061**
ක්ෂය	**2025/01/01 දිනට ශේෂය**	**වර්ෂය සඳහා ක්ෂය වීම**	**වසර තුළ බැහැර කිරීම්**	**නැවත වර්ගීකරණය සඳහා මාරු කිරීම**	**ප්‍රත්‍යාගණන යේදී ඉවත්කිරීම්**		**2025/12/31 දිනට ශේෂය**	**2024/12/31 දිනට ශේෂය**
වාහන	-	4,160,000	-	-	-	-	4,160,000	-
කාර්යාල උපකරණ	1,870,558	373,534	(610,607)	(305,529)	(1,165,349)	-	162,606	1,870,558
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	3,023,340	259,313	(1,743,343)	(50,400)	(1,295,450)	-	193,460	3,023,340
පුස්තකාල පොත්	6,055,413	635,592	(436,586)	-	(6,254,308)	-	110	6,055,413
පරිගණක උපකරණ	45,356,486	4,666,866	(2,978,169)	-	(44,175,850)	-	2,869,333	45,356,486
විදුලි උපකරණ	1,432,647	110,460	(330,953)	(1,102,527)	-	-	109,627	1,432,647
පැන්ට්‍රි අයිතම	121,258	458	(53,188)	(68,528)	-	-	-	121,258
ගමන් මලු	20,100	-	-	(20,100)	-	-	-	20,100
යන්ත්‍ර සූත්‍ර	1,254,871	12,034	-	(365,190)	-	-	901,715	1,254,871
	59,134,673	**10,218,257**	**(6,152,847)**	**(1,912,274)**	**(52,890,957)**	**-**	**8,396,851**	**59,134,673**
ශුද්ධ පොත් වටිනාකම	**6,316,387**						**80,660,248**	**6,316,387**

සටහන 07

<u>පාරිතෝෂිකය</u>

<u>සඳහා</u>

<u>ප්‍රතිපාදන</u>

පත්වීම් දිනය	2025.12.31 දිනට සේවා කාලය	**සේවා කාලය වසර වලින්**	**නම**	**තනතුර**	2025.12.31 දිනට දළ වැටුප
2020.03.20	ව: 5 මා: 9 දි:10	5	යූ.වී.ආර්.රාජකරුණා	ගණකාධිකාරී	80262
2021.09.01	ව: 4 මා: 4	4	ටී.පී.එන්. ද සිල්වා	කලමනාකරණ සහකාර	41891
2021.09.01	ව:4 මා: 4	4	වී.කේ. රණවීර	කලමනාකරණ සහකාර ඇගයීම් සහ අධීක්ෂණ	41891
2021.09.01	ව:4 මා: 4	4	වී.ඒ.එස්. ලක්මාලි	නිලධාර	71730
2017.6.01	ව:8 මා:6 දි:30	8	ඩබ්ලිව්. එම්. එම්. කරුණාරත්න	පර්යේෂණ නිලධාරී	59230
2016.6.27	ව:9 මා:6 දි: 4	9	එච්.කේ.ටී.එම්. සෙනෙවිරත්න	බංගලා භාරකරු	39265
2016.6.27	ව:9 සහ මා:8	9	ඩබ්ලිව්.ඒ. මේනකා පද්මසීලි	කාර්යාල කාර්ය සහායක	39265
2016.6.27	ව:9 සහ මා: 8	9	යූ.ඒ. නදීෂා වතුරාංගනී	කාර්යාල කාර්ය සහායක	39265
2024.07.11	ව:1 මා: 5 දි:20	1	මනෝහරන් සත්‍යකලා	කාර්යාල කාර්ය සහායක	36785
2024.07.11	ව:1 මා: 5 දි: 20	1	එච්.එම්. ඉරෝෂා සඳමාලි	කාර්යාල කාර්ය සහායක	36785

			එස්.ඩී.	පර්යේෂණ	
2024.12.01	ව:1 දි: 30	1	අතුකෝරල	නිලධාරී	51285
			එස්.ඒ.ජාවිත්		
2024.12.16	ව:1 දි: 15	1	රහුමාන්	IT	43379
2024.12.16	ව:1 දි: 15	1	කවිඳු ලියනගේ	IT	43379
				පුස්තකාලයාධි	
2025.02.05	මා: 10 දි: 29		ටී.යූ.ගමගේ	පති	43379
			එච්.පී.ටී.සී.		
2025.02.05	මා:10 දි:29		දිනේෂ් කුමාර	රියදුරු	38387
				කාර්යාල	
			ආර්.ඩී. දිලිනි	කාර්ය	
2025.04.01	මා:8 දි:30		දිමන්ති	සහායක	36475
2025.12.05	දි: 26		ඒ.එච්. චින්තක	රියදුරු	36475
				අභ්‍යන්තර	
2025.12.05	දි: 26		ජී,පී සූරියආරච්චි	විගණක	62475
			ඊ්.එම්.එන්.පෙරේ	පර්යේෂණ	
2025.12.05	දි: 26		රා	නිලධාරී	62448
				පරිපාලන	
2025.12.05	දි: 26		චාමී ආර්.හේවගේ	නිලධාරී	51052
			සී.එම්.එම්.මොව්	කලමනාකර	
2025.12.05	දි: 26		න්යා	ණ සහකාර	35190
			ඩබ්ලිව්.ජී.එන්.ම	කලමනාකර	
2025.12.05	දි:26		ල්කා වේමුල්ල	ණ සහකාර	35190
			එම්.ඩී.ටී.	කලමනාකර	
2025.12.05	දි: 26		නදීෂාදේවි	ණ සහකාර	35190

2025 දෙසැම්බර් 31 වන දිනට, විශ්‍රාම යන වයසට ළඟා වූ, ඉල්ලා අස් වූ හෝ ඉදිරි මාස දොළහ (12) තුළ විශ්‍රාම යාමට හෝ ඉල්ලා අස්වීමට අපේක්ෂා කරන කිසිදු සේවකයෙකු නොමැත. ඒ අනුව, 2025 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගෙන ඇති පාරිතෝෂික වගකීම්වල වත්මන් කොටසක් නොමැත.

	2025	2024
2025/01/01		
දිනට		
ප්‍රතිපාදනය	1166900	1007628
පාරිතෝෂික ගෙවීම්/ අතිරික්ත		
ප්‍රතිපාදන අඩු කිරීම	-	-381590

2025 වසර සඳහා ප්‍රතිපාදන	217583	540863
2025/12/31 දිනට ප්‍රතිපාදනය	**1384483**	**1166900**
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන - වත්මන් වගකීම්	-	178200
පාරිතෝෂික - ජංගම නොවන වගකීම් සඳහා ප්‍රතිපාදන	1384483	988700
	1384483	**1166900**

සටහන 08

සමුච්චිත අතිරික්තය/ (හිඟය)	**2025**	**2024**
2025/01/01 දිනට ශේෂය	(4,956,482)	(11,732,553)
2024 හඳුනා නොගත් තැන්පතුව ඒකාබද්ධ අරමුදලකට තැන්පත් කිරීම.	(5,000)	
2023.12.31 දිනට විලම්බිත ආදායම ආපසු හැරවීමේ දෝෂ නිවැරදි කිරීම	-	1,311,907
ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් - රජයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන - ප්‍රාග්ධන සංචිතය වෙනුවට ආදායම ලෙස පිළිගැනේ.	-	2,622,591
2025 වසර සඳහා ලාභය	24,053,605	2,841,598
ප්‍රත්‍යාගණන අතිරික්තය	47,493,932	
2025/12/31 දිනට ශේෂය	**66,586,055**	**(4,956,457)**

	2,025	**2,024**
සටහන 9		
පුනරාවර්තන ප්‍රදාන ලැබීම් - (රජයේ ප්‍රදාන)		
අධිකරණ අමාත්‍යාංශය වෙතින් ලැබුණු මුදල් අග්‍රිමය	27,674,764	15,082,454
අධිකරණ අමාත්‍යාංශය විසින් කරන ලද ගෙවීම්		
ජල සහ විදුලි වියදම	-	1,571,391
ආරක්ෂා සහ ඉන්ධන වියදම්	-	1,204,796
	27,674,764	**17,858,641**

සටහන 10

ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්- (රජයේ ප්‍රදානය)		
110 වැයවිෂය යටතේ ප්‍රාග්ධන ප්‍රධාන	-	613,000
228 වැයවිෂය යටතේ ප්‍රාග්ධන ප්‍රධාන	11,996,447	7,813,494
ප්‍රාග්ධන ප්‍රදාන - මුදල් රහිත (වාහන)	20,800,000	-
	32,796,447	**8,426,494**

සටහන 11
විදේශ ප්‍රධාන ලැබීම්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ, දායකත්ව අරමුදල් සහිත ධාරිතා සංවර්ධන වැඩසටහන් යටතේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) ආයතනය වෙත මූල්‍ය නොවන වත්කම් ලැබී ඇත. මෙලෙස ලැබුණු වත්කම්වලට ප්‍රධාන වශයෙන් ආයතනික කටයුතු සඳහා අවශ්‍ය කාර්යාල උපකරණ, පරිගණක උපකරණ, ගෘහ භාණ්ඩ හා සවිකිරීම් සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළත් වේ. මෙම වත්කම් ආයතනික සේවා සැපයීමේ අරමුණු සඳහාම පමණක් භාවිත කරනු ලබන අතර, ඒවා නැවත ගෙවීමේ කොන්දේසිවලට යටත් නොවේ.

දායකත්ව සහාය (ප්‍රදාන) මගින් ලැබෙන මූල්‍ය නොවන වත්කම් හඳුනාගනු ලබන්නේ:

- එම වත්කම්වල පාලනය ආයතනය වෙත පැවරී ඇති විට,
- අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයන් ඇතිවීමේ සම්භාවිතාවක් පවතින විට, සහ
- වත්කම්වල සාධාරණ අගය විශ්වසනීය ලෙස මැනිය හැකි විටය.

ඒ අනුව, පරිත්‍යාග කරන ලද වත්කම් ඒවායේ සාධාරණ අගයෙන් හඳුනාගත් අතර, ඊට අදාළ ප්‍රදාන ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනාගන්නා ලදී. මෙලෙස හඳුනාගත් වත්කම්, පසුව දේපළ, පිරියත හා උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වලට අදාළ ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලව, ක්ෂයවීම් හෝ ක්මක්‍රමයවීම, හානිකරණ තක්සේරු කිරීම් (Impairment assessment) සහ අදාළ වන අවස්ථාවලදී නැවත ප්‍රත්‍යාගණනයන්ද ඇතුළත්ව ගිණුම්ගත කර ඇත.

වත්කම් කාණ්ඩය	විස්තර	ලැබුණු දිනය	පිරිවැය (රු.)	එකතුව (රු.)
කාර්යාල උපකරණ	කැනන් ඩිජිටල් කැමරාව	24.04.2025	256,671	
	ගබඩා කබඩ්	24.04.2025	193,350	
	ජංගම ලාච්චු කට්ටලය	24.04.2025	51,024	
	කෝට් (කබා) එල්ලුම	24.04.2025	14,898	515,943
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	High back/Mid back පුටු	08.05.2025	291,338	
	මයික්‍රොවේව් උඳුන	08.05.2025	49,440	340,778
Computer Equipment	i. පූර්ණ ඩිජිටල් කරණය කරන ලද වයිෆයි (Wifi) සාකච්ඡා පද්ධති පාලකය	24.06.2025	538,540	
	ii.සාකච්ඡා මයික්‍රෆෝනය - සභාපති	24.06.2025	326,974	
	iii.සාකච්ඡා මයික්‍රෆෝනය - නියෝජිත	24.06.2025	980,922	
	iv.Charging Box	24.06.2025	115,400	
	v.ද්විත්ව රැහැන් රහිත අතේ ගෙන යා හැකි මයික්‍රෆෝන	24.06.2025	458,906	
	vi.හැන්ඩ්සෙට් සහ ලැපල් (කොලරයට සවිකරන) මයික්‍රෆෝනය	24.06.2025	516,606	
	vii.ඩිජිටල් ශ්‍රව්‍ය සකසනය (Digital Audio Processor)	24.06.2025	288,502	
	viii.ප්‍රතිපෝෂණ නිශේධකය (Feedback suppressor / හඬ දෝංකාරය වැළැක්වීමේ උපකරණය	24.06.2025	269,266	
	ix.2 channels ශබ්ද විකාශකය	24.06.2025	326,972	
	x.බ්‍රැකට්ටුව (රඳවනය) සහිත වෘත්තීය මට්ටමේ සාකච්ඡා ස්පීකරය	24.06.2025	384,660	14,495,166

	xi.වැනල 14 ශ්‍රව්‍ය මිශ්‍රකය (Audio Mixer)	24.06.2025	827,036	
	xii.USB ශ්‍රව්‍ය අතුරුමුහුණත	24.06.2025	84,000	
	xiii. 8 පෝට් ගිගාබිට් ඊතර්නෙට් ස්විචය	24.06.2025	88,200	
	xiv. 55" LED TV තිරය - Samsung 55" QLD	24.06.2025	1,980,000	
	xv. ඩිජිටල් වේදිකාව	24.06.2025	2,252,300	
	xvi.වේගා ප්‍රොජෙක්ටර් විද්‍යුත් තිරය 8*8 - එප්සන් EB L730 U ව්‍යාපාරික ප්‍රොජෙක්ටරය - අනුක්‍රමික අංකය (SN) X9P84Z00014	24.06.2025	1,325,000	
	xvii. AP රැහැන් රහිත සම්ප්‍රේෂකය	24.06.2025	288,502	
	xviii.සවිකිරීමේ උපාංග	24.06.2025	1,332,250	
	ඩීවීඩී රයිටරය	08.05.2025	16,500	
	ඩෙල් (Dell) ලැප්ටොප් පරිගණකය	08.05.2025	383,250	
	එච්පී (HP) ලැප්ටොප් පරිගණකය	08.05.2025	1,283,535	
	එච්පී (HP) ලැප්ටොප් පරිගණකය	08.05.2025	427,845	
අස්පෘශ්‍ය වත්කම්	SLJI SLJI වෙබ් අඩවියweb site	12.08.2025	1,200,000	1,200,000

16,551,887

සටහන 12

වෙනත් ආදායම් - කුලී ආදායම

විනිසුරුවරුන්ගේ නිල නිවාසයේ (Judges' Residence) කාමර කුලියට දීමෙන් වර්ෂය තුළ ලැබුණු කුලී ආදායම 'වෙනත් ආදායම්' වලට ඇතුළත් වේ.

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ, තාවකාලික නවාතැන් පහසුකම් අවශ්‍ය වූ විනිසුරුවරුන් දෙදෙනෙකු (2) සඳහා ආයතනය විසින් කාමර කුලියට ලබා දී ඇති අතර, එම කුලී ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ "වෙනත් ආදායම් - කුලී ආදායම" යටතේ හඳුනාගෙන ඇත.

සටහන 13
වැටුප් හා වේතන

ස්ථිර කාර්ය		
මණ්ඩලය - EPF හිමි	13,497,855	6,894,761
උපදේශක දීමනා - EPF අහිමි	2,024,775	985,050
	15,522,630	**7,879,811**

සටහන 14
අනෙකුත් දීමනා

වෘත්තීය දීමනා	342,000	72,000
නිල ඇඳුම් දීමනා	-	4,000
සන්නිවේදන දීමනා	48,000	497,935

	390,000	**573,935**

සටහන 15

සම්මන්ත්‍රණ හා පුහුණු වියදම්

දේශීය පුහුණු වැඩසටහන් හා වැඩමුළු සඳහා ආහාර හා වෙනත් වියදම්	1,231,915	-
වැඩමුළු හා දේශීය පුහුණු වැඩසටහන්	3,564,503	279,345
අධිකරණ නිලධරයන්ගේ පශ්චාත් උපාධි පාඨමාලා	4,032,000	6,054,200
	8,828,418	**6,333,545**

සටහන 16

විදේශ පුහුණු වියදම්

ආනුෂංගික වියදම්/දෛනික දීමනාව	1,152,066	1,299,458
උණුසුම් ඇඳුම් වියදම්	-	118,040
	1,152,066	**1,417,497**

සටහන 17

වෙනත් සේවා සහ සැපයුම්

අන් අය සඳහා ආහාරපාන	190,751	105,483
වෙනත් වියදම්	13,950	15,020
කාර්ය මණ්ඩල සුබසාධනය	125,337	57,697
බදවා ගැනීම් වියදම්	171,171	181,662
වාර්ෂික දායක ගාස්තුව	1,775,619	1,500,000
භාවිත කළ සැපයුම් හා පරිභෝජනය කළ හැකි දෑ	156,111	-
	2,432,939	**1,859,861**

සටහන 18

ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ උපාංග නඩත්තු

පරිගණක හා කාර්යාලීය උපකරණ අලුත්වැඩියාව හා නඩත්තුව	83,691	76,381
ගොඩනැගිලි සහ උපකරණ නඩත්තුව	212,834	101,117

සේවා ගිවිසුම් සහ නඩත්තුව	1,291,761	395,941
	1,588,285	**573,439**

සටහන 19

ක්ෂය සහ ක්‍රමක්ෂය

වාහන	4,160,000	-
කාර්යාලීය උපකරණ	373,534	166,308
පුස්තකාල පොත්	635,592	690,351
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	259,313	85,857
පරිගණක සහ උපකරණ	4,666,866	681,412
විදුලි උපකරණ	110,460	66,096
පැන්ට්‍රි අයිතමය	458	4,406
යන්ත්‍රෝපකරණ	12,034	112,714
අස්පෘෂ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය	206,938	97,500
	10,425,196	**1,904,646**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සෘජු ක්‍රමයට සකස් කර ඇත.

	2025	2024
සටහන 20		
වැටුප් සහ වේතන සහ රැකියා ප්‍රතිලාභ		
වැටුප හා වේතන	12,851,648	6,960,862
උපදේශක ගාස්තුව	2,024,500	984,500
සේවක අර්ථසාධක අරමුදල් වියදම්	2,640,213	1,251,773
සේවක භාර අරමුදල් වියදම්	396,032	187,766
අතිකාල	338,047	207,611
නිල ඇඳුම් දීමනාව		4,000
කාර්ය මණ්ඩල පුහුණුව	75,898	101,950
පාරිතෝෂික ගෙවීම		381,565
ගෙවූ උත්සව අත්තිකාරම්		-
අනෙකුත් කාර්ය මණ්ඩල දීමනා		
	18,326,337	10,080,027
සටහන 21		
මෙහෙයුම් ක්‍රියාකාරකම්		
සම්මන්ත්‍රණ සහ පුහුණු වියදම්	3,109,478	333,920
විනිසුරුවන්ට ගෙවන ලද LLM ගාස්තු	4,486,975	6,054,200
විදේශ පුහුණු වැඩසටහන	1,152,066	1,417,497
සම්මන්ත්‍රණ සහ අනෙකුත් වැඩසටහන් සඳහා සංග්‍රහ	1,414,432	129,264
සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා වන වියදම්	171,171	144,949
ආරක්ෂක වියදම්	403,072	-
වීඩියෝ සම්මන්ත්‍රණ ගාස්තු		-
වාර්ෂික දායකත්ව ගාස්තු	1,800,075	1,499,975
විගණන ගාස්තුව	414,180	396,480
	12,951,449	9,976,285

සටහන 22

භාවිත කළ සැපයුම් හා පරිභෝජනය කළ හැකි දෑ

තැපැල් ගාස්තු	46,490	32,750
කාර්යාලීය ලිපි ද්‍රව්‍ය මිලට ගැනීම්	927,728	231,742
ඉන්ධන වියදම්	383,048	205,845
වෙනත් සේවා හා සැපයුම්	6,575	15,020
ගමන් වියදම්	54,127	64,063
වාහන නඩත්තු	514,216	468,740
සේවා හා නඩත්තු	676,372	395,816
පරිගණක නඩත්තු	83,691	53,881
මුද්‍රණ වියදම්	2,500	-
ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ උපාංග නඩත්තු	713,099	113,827
දුරකතන හා අන්තර්ජාල ගාස්තු	286,758	271,762
විදුලි හා ජල ගාස්තු	1,943,163	
පිරිසිදු කිරීමේ ගාස්තු	1,007,156	807,100
කාර්ය මණ්ඩල සුබසාධනය	125,337	58,296
පරිවර්තන ගාස්තු	120,093	110,885
	6,890,352	2,829,726

සටහන 23

මූල්‍ය පිරිවැය

බැංකු ගාස්තුව	6,000	18,763
	6,000	18,763

සටහන 24

ස්ථාවර වත්කම් මිලදී ගැනීම

මෙම කාලපරිච්ඡේදය තුළ, ආයතනය විසින් මුළු පිරිවැය රු. 1,515,890 ක් වූ දේපළ, පිරියත සහ උපකරණ අතපත් කරගත් අතර, එය රජය විසින් ලබාදෙන ප්‍රාග්ධන ප්‍රදාන යටතේ අත්පත් කර ගන්නා ලදී. දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම සඳහා රු. 1,515,890 ක මුදල් ගෙවීම් සිදු කරන ලදී.

ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	808,090	244,950
පුස්තකාල පොත්	31,000	8,500
අස්පෘශ්‍ය වත්කම් - පුස්තකාල කළමනාකරණ පද්ධතිය	588,825	-
කාර්යාල උපකරණ	87,975	330,350
	1,515,890	583,800

සටහන 25

මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල් හා බැංකු ශේෂයන්ගෙන් මුදල් හා මුදල් සමාන දෑ සැදී ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් මුදල් හා මුදල් හා සමාන දෑ පහත දැක්වෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අගයන්ගෙන් සමන්විත වේ.

	2,025	2,024
අතැති මුදල්	-	-
ලංකා බැංකුවේ ජංගම ගිණුම් ශේෂය	-	5,002
ලංකා බැංකුවේ ඉතිරිකිරීම් ගිණුම් ශේෂය	370,701	362,349
	370,701	367,351

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව සහ සත්‍ය වියදම් සැසඳීම

				Rs.		
උප ව්‍යාපෘති	වැය විෂය	මූල්‍ය	වර්ගය/ විෂයේ නම	2025 සඳහා ඇස්තමේන්තුව	සත්‍ය වියදම 2025	සත්‍ය වියදම් %
1	1503		**පුනරාවර්තන වියදම**			
			පුද්ගල පඩිනඩි			
	1001	11	වැටුප් හා වේතන	17,546,446	17,156,446	98%
	1002	11	අතිකාල හා නිවාඩු දින වැටුප්	350,215	350,215	100%
	1003	11	වෙනත් දීමනා	803,339	755,667	94%
1	1509		**වෙනත් (පුද්ගල පඩිනඩි හැර)**			
			ගමන් වියදම්			
	1101	11	දේශීය	100,155	-	0%
	1102	11	විදේශීය	-	-	-
			සැපයීම්			
	1201	11	ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	1,702,619	996,567	59%
	1202	11	ඉන්ධන	480,739	385,044	80%
	1203	11	ආහාර පාන හා නිල ඇඳුම්	8,012	-	0%
			නඩත්තු වියදම්			
	1301	11	වාහන	600,539	455,878	76%
	1302	11	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	751,156	610,150	81%
	1303	11	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	201,541	136,810	68%
			සේවා			
	1401	11	ප්‍රවාහන	50,077	18,627	37%
	1402	11	තැපැල් හා සන්නිවේදන	561,948	332,113	59%
	1403	11	විදුලිය සහ ජලය	1,302,774	1,273,528	98%
	1404	11	Renබදුතුළී සහ පළාත් පාලන ආයතන බදු	-	-	
	1405	11	වෙනත්	5,040,441	5,039,703	100%
			මාරු කිරීම්			
	1505	11	සම්මාදම් සහ දායක මුදල්	-	-	-

			උප එකතුව	**29,500,000**	**27,510,749**	**93%**
1	2201		**මූලධන වියදම්**			
			ප්‍රාග්ධන වියදම් වැඩි දියුණු කිරීම හා අලුත් වැඩියා කිරීම			
	2001	11	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	534,410	399,500	71%
	2002	11	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	574,696	571,590	99%
	2003	11	වාහන	-	-	-
			ප්‍රාග්ධන වක්කම් අක්පත් කරගැනීම			
	2101	11	වාහන	-		
	2102	11	ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	430,734	308,975	72%
	2102(ii)	11	වෙනත් (නීතිමය දත්ත සංහිතාව සංවර්ධනය කිරීම)	7,979,421	588,825	7%
		11	2. පුස්තකාල පොත්	712,546	121,475	
	2103	11	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	374,087	-	-
	2104	11	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	-	-	-
			මානව සම්පත් සංවර්ධනය			
	2401(i)		විනිසුරු පුහුණුව - දේශීය	11,732,429	9,250,621	
			විනිසුරු පුහුණුව - විදේශීය	24,505,405	1,092,166	
	2401		කාර්ය මණ්ඩල පුහුණුව	356,273	75,898	21%
			උප එකතුව	**47,200,000**	**12,409,050**	**26%**
			මුළු වියදම	**76,700,000**	**39,919,799**	**52%**

මානව සම්පත් සහ ආයතනික ධාරිතාව

කාර්ය මණ්ඩල පැතිකඩ

- 2025.12.31 දිනට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අනුමත සහ පවතින සේවක සංඛ්‍යාව

තනතුර		සේවාව	ශ්‍රේණිය	වැටුප් කේතය	සේවා මට්ටම	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යමණ්ඩලය			පවත්නා කාර්ය මණ්ඩලය			
						ස්ථිර	කොන්ත්‍රාත්	අතිරේක	ස්ථිර	කොන්ත්‍රාත්	අතිරේක	හිඟයක් (+) ලබාගැනීම.....
අධ්‍යක්ෂවරයා			*			1			1			
නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා			*			1			1			
අධ්‍යයන සම්බන්ධීකාරක			*			1			1			
උපදේශක			**				2			1		
ලේකම්			II ශ්‍රේණිය	MM 1-3-2025	ජ්‍යෙෂ්ඨ මට්ටම	1			0			
පර්යේෂණ නිලධාරි			II ශ්‍රේණිය	AR 1-2025	ජ්‍යෙෂ්ඨ මට්ටම	3			3			
ගණකාධිකාරී			II ශ්‍රේණිය	MM 1-1-2025	ජ්‍යෙෂ්ඨ මට්ටම	1			1			
අභ්‍යන්තර විගණක			II ශ්‍රේණිය	MM 1-1-2025	ජ්‍යෙෂ්ඨ මට්ටම	1			1			
ඇගයීම් සහ අධීක්ෂණ නිලධාරී,			II ශ්‍රේණිය	MM 1-1-2025	ජ්‍යෙෂ්ඨ මට්ටම	1			1			
පරිපාලන නිලධාරී			II ශ්‍රේණිය	JM 1-1-2025	තෘතීයක මට්ටම	1			1			
මෘදුකාංග සහ දෘඩාංග තාක්ෂණික ශිල්පී			III ශ්‍රේණිය	MA 2-2-2025	ද්විතීයක මට්ටම	2			2			
පුස්ථකාලාධිපති			III ශ්‍රේණිය	MA 2-2-2025	ද්විතීයක මට්ටම	1			1			
ලඝු ලේඛක/යතුරු ලේඛක			III ශ්‍රේණිය	MA 1-2-2025	ද්විතීයක මට්ටම	1			0			
කළමනාකරණ සහකාර			III ශ්‍රේණිය	MA1-2-2025	ද්විතීයක මට්ටම	6			5			
භාෂා පරිවර්තක			III ශ්‍රේණිය	MA 4-2025	ද්විතීයක මට්ටම	1			0			
මූල්‍ය නිලධාරී			III ශ්‍රේණිය	JM 1-1-2025	තෘතීයක මට්ටම	1			0			
කාර්යාල සහකාර			III ශ්‍රේණිය	PL 1-2025	ප්‍රාථමික මට්ටම	5			5			
ගෘහ පාලක			III ශ්‍රේණිය	PL 1-2025	ප්‍රාථමික මට්ටම	1			1			
රියැදුරු			III ශ්‍රේණිය	PL 3-2025	ප්‍රාථමික මට්ටම	3			2			
	එකතුව					32	2	0	26	1	0	0

* අධිකරණ සේවාව වෙතින් අනුයුක්ත කිරීමට යටත්ව

** විශ්‍රාමලත් ගරු ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගෙන් පත්කරනු ලැබේ.

- **ආයතනයේ කාර්ය මණ්ඩලය**

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අරමුණු ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ, ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ අනෙකුත් නිලධාරීන් හා සේවකයින් පත් කිරීමේ බලය පාලක සභාව වෙත පැවරී ඇත.

තවද, ආයතනයේ අධ්‍යක්ෂවරයා, නිලධාරීන් සහ අනෙකුත් සේවකයින් සේවයෙන් පහ කිරීමේ බලය ද ඇතුළුව, ඔවුන් කෙරෙහි විනය පාලනය ක්‍රියාත්මක කරනු ලබන්නේ ද පාලක සභාව මඟිනි. මෙයට අමතරව, අධ්‍යක්ෂවරයාට සහ ආයතනයේ සියලුම නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයට අදාළ වන චේතන, දීමනා මෙන්ම අනෙකුත් සේවා කොන්දේසි හා නියමයන් තීරණය කිරීමට ද පාලක සභාවට බලය පැවරී ඇත.

මෙම අධිකාරී බලය මඟින්, ආයතනයේ මානව සම්පත් කළමනාකරණය තුළ නිසි පාලනයක්, වගවීමක් සහ පරිපාලනමය අධීක්ෂණයක් සහතික කෙරේ.

1	අධ්‍යක්ෂවරයා	ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු සම්පත් බී. අභයකෝන් මැතිතුමා
2	උපදේශකවරයා	ගරු හිටපු අභියාචනාධිකරණ විනිසුරු ආචාර්ය රුවන් ප්‍රනාන්දු මැතිතුමා,
3	නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා	ගරු මහාධිකරණ විනිසුරු ජී. එල්. ප්‍රියන්ත මැතිතුමා
4	අධ්‍යයන සම්බන්ධීකාරක	මහේස්ත්‍රාත් ටී.එම්.ඩී.සී.කේ. රත්නායක මහත්මිය
5	ලේකම් (වැඩ බලන)	නීතීඥ එස්.ඩී අතුකෝරාළ මෙය
6	ගණකාධිකාරී	යූ.වී. රත්මිණි රාජකරුණා මිය
7	අභ්‍යන්තර විගණක	ජී.පී. සූරියආරච්චි මිය
8	ඇගයීම් සහ අධීක්ෂණ නිලධාරී	වී.ඒ.එස්. ලක්මාලි මිය

9	පර්යේෂණ නිලධාරී	නීතිඥ ඩබ්ලිව්.එම්.එම්. කරුණාරත්න මෙය නීතීඥ එස්.ඩී අතුකෝරාළ මෙය නීතිඥ ඊ.එම්.එන්. පෙරේරා මිය
10	පරිපාලන නිලධාරී	සී.ආර්. හේවගේ මිය
11	මෘදුකාංග සහ දෘඩාංග තාක්ෂණික ශිල්පී	කේ.එන්. ලියනගේ මයා එස්.ඒ.ජේ. රහුමාන් මයා
12	පුස්තකාලයාධිපති	ටී.යූ. ගමගේ මිය
13	කළමනාකරණ සහකාරවරුන්	වී. කේ. රණවීර මිය ටී. පී. එන්. ද සිල්වා මිය සී.එම්.එම්. මොවින්යා චාදසේකර මෙය ඩබ්ලිව්.ජී.එන්. මාලිකා වේමුල්ල මිය එම්.ඩී.ටී. නදීෂාදේවි වීරසිංහ මිය
14	පොත් බැඳුම්කරු (අධිකරණ සේවා කොමිෂන් සභාව වෙතින් අනුයුක්ත කර ඇති)	ඩබ්ලිව්.ජී. ඒ. ඩී. වීරසිංහ මයා ආර්.එම්. බුද්ධිමා සුමුදුනී රාජපක්ෂ මිය
15	රියැදුරු	එච්.පී.ටී.සී. දිනේෂ් කුමාර මයා ඒ.එච්. චින්තක මයා
16	කා.කා.ස	මේනකා පද්මසීලි මිය නදීෂා චතුරාංගනී මිය මනෝහරන් සත්‍යාකලා මිය එච්.එම්. ඉරෝෂා සඳමාලි විජේසූරිය මිය ආර්.ඩී.ඩී.ඩී.ඩී. කෞෂල්‍යා මිය
17	ගෘහ පාලක	එච්.කේ.ටී.එම්. සෙනෙවිරත්න මයා

බඳවා ගැනීම් උසස්වීම්, විශ්‍රාම වැටුප්

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් 2025 වර්ෂයේ දී තම කාර්ය මණ්ඩල සංඛ්‍යාව පුළුල් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් පහත සඳහන් තනතුරු සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදී:

- අභ්‍යන්තර විගණක
- සංඛ්‍යාලේඛනඥ / ඇගයීම් සහ අධීක්ෂණ නිලධාරී
- පරිපාලන නිලධාරී
- භාෂා පරිවර්තක
- මුදල් සහකාර
- ලඝුලේඛක / යතුරුලේඛක

මෙයට අමතරව, ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ කාර්ය මණ්ඩලය වෙත තවත් අතිරේක පර්යේෂණ නිලධාරියෙකු සහ එක් කළමනාකරණ සහකාරවරයෙකු බඳවා ගැනීම සඳහා ද අනුමැතිය හිමි විය.

ඒ අනුව, බඳවා ගැනීමේ කටයුතු සිදු කර 2025.12.05 දින, අභ්‍යන්තර විගණක, සංඛ්‍යාලේඛනඥ / ඇගයීම් සහ අධීක්ෂණ නිලධාරී (අභ්‍යන්තර අපේක්ෂක), පර්යේෂණ නිලධාරී, පරිපාලන නිලධාරී සහ කළමනාකරණ සහකාර (පුරප්පාඩු තුනක් සඳහා) යන තනතුරු සඳහා පත්වීම් ලබා දෙන ලදී.

ධාරිතා වර්ධනය

වැඩසටහනේ මාතෘකාව	ආයතනය	දිනය	සහභාගිවන්නන් සංඛ්‍යාව	පිරිවැය
ප්‍රසම්පාදන ක්‍රියාවලිය	ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය	26.03.2025 – 27.03.2025	6	රු.59,975.00
"නවීන පුස්තකාලවල කෘතිම බුද්ධිය භාවිතය"	ශ්‍රී ලංකා පුස්තකාල සංගමය	2025.09.23	1	රු.3000.00

කාර්ය මණ්ඩල විවිධාංගීකරණ දර්ශක

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය, ආබාධිත ප්‍රජාව ඇතුළත් කරගැනීම සහ තරුණ රැකියා නියුක්තිය

කාණ්ඩය	එකතුව	පුරුෂ	ස්ත්‍රී	ආබාධිත ප්‍රජාව ඇතුළත් කරගැනී	තරුණ රැකියා නියුක්තිය
ඉහළ කළමනාකරණය	4	3	1	0	0
ජ්‍යෙෂ්ඨ මට්ටම	6	0	6	1	0
තෘතීයක මට්ටම	1	0	1	0	0
ද්විතීයක මට්ටම	8	2	6	0	0
ප්‍රාථමික මට්ටම	10	4	6	0	0

ප්‍රධාන අභියෝග සහ උගත් පාඩම්

මෙහෙයුම් සහ උපායමාර්ගික අභියෝග

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය සිය දිගු ගමන පුරා සුවිශේෂී ජයග්‍රහණ රැසක් අත්කරගෙන ඇත. වෙබ් අඩවිය සංවර්ධනය කිරීම, අධිකරණ පුහුණුව සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ (IOJT) සාමාජිකත්වය ලබා ගැනීම, අනෙකුත් අධිකරණ ඇකඩමි සහ යුරෝපා සංගමය (EU), ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව (US Department of State), UNDP, UNICEF, USAID, ICRC, ICJ සහ ජාත්‍යන්තර සාමය සහ නීතියේ ආධිපත්‍යය සඳහා වූ මැක්ස් ප්ලෑන්ක් පදනම (Max Planck Foundation) ඇතුළු ජාත්‍යන්තර ආධාරක නියෝජිත ආයතන සමඟ හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම ඒ අතර වේ.

අධිකරණ අධ්‍යාපනය සහ පුහුණුව සම්බන්ධයෙන් අප ලබා ඇති සැලකිය යුතු ප්‍රගතිය මධ්‍යයේ වුවද, දැනට පවතින අභියෝගයන් පිළිබඳවද අප අවධානය යොමු කළ යුතුය. ඉගෙනීමට සහ වෘත්තීය වර්ධනයට හිතකර පරිසරයක් ඇති කිරීම සඳහා අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය පහසුකම්වලින් සමන්විත, අධිකරණ ඇකඩමිය සඳහාම වෙන්වූ ගොඩනැගිල්ලක ඇති දැඩි අවශ්‍යතාවයක් පවතී. මෙයට අමතරව, ප්‍රමාණවත් මානව සම්පත් නොමැතිකම අපගේ ප්‍රයත්නයන්ට බාධාවක් වන අතර, ඒ සඳහා බඳවා ගැනීම් සහ රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන් උපායමාර්ගික ප්‍රවේශයක් අවශ්‍ය වේ. මූල්‍යමය බාධාවන්, විශේෂයෙන්ම 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය මගින් පනවා ඇති අයවැය සීමාවන්, අපගේ අධිකරණයේ අඛණ්ඩ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාව සීමා කර ඇත. අධිකරණ ක්ෂේත්‍රයේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගැනීමට අප උත්සාහ කරන බැවින්, මෙම අභියෝගවලට විසඳුම් සෙවීම අතිශයින්ම තීරණාත්මක වනු ඇත.

පොදුරාජ්‍ය මණ්ඩලීය (ලැටිමර් හවුස්) මූලධර්ම (Commonwealth Latimer House Principles) මගින් අවධාරණය කර ඇති පරිදි, අධිකරණ ආයතනයක මූල්‍ය ස්වාධීනත්වය යනු එහි ස්වාධීනත්වයේ මූලික පදනමයි. කෙසේවුවද, අප ආයතනය බාහිර මූල්‍ය මූලාශ්‍ර මත යැපීම, මෙම මූලධර්මයන්ට අප අනුකූල වීම සම්බන්ධයෙන් ගැටලු මතු කරයි. බාහිර අනුමැතියට යටත් වන ප්‍රතිපාදන සහ ආධාර මත පදනම් වූ වත්මන් මූල්‍ය ආකෘතිය, නොදැනුවත්වම අපගේ මූල්‍ය ස්වාධීනත්වයට හානි පමුණුවයි. මෙම මූල්‍ය පරායත්තතාවය (අන් අය මත යැපීම) අපගේ මෙහෙයුම් ස්වාධීනත්වය පළුදු වන තත්ත්වයක් නිර්මාණය කරන අතර, ස්වාධීන අධිකරණ ආයතනයක් සඳහා වූ ලැටිමර් හවුස් මූලධර්මවල ප්‍රමිතීන්ට සම්පූර්ණයෙන්ම අනුකූල වීම අභියෝගයක් බවට පත් කරයි.

විගණකාධිපතිවරයා විසින් උද්දීපණය කරන ලද ප්‍රධාන විගණන කරුණු

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/B/SLJI/FA/2025/09

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026 මැයි 26 දින

අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තරකර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01හි 55 ඡේදය ප්‍රකාරව, සංසන්දනාත්මක අගයන් යළි වර්ගීකරණය කළ විට අස්ථිත්වයන් විසින් වර්ගීකරණයේ ස්වභාවය හා වර්ගීකරණයට හේතුව යන තොරතුරු හෙළිදරව් කළ යුතු වුවත්, ආයතනය විසින් රු.2,475,659ක වටිනාකමින් යුත් අයිතම 22ක් සඳහා යළි වර්ගීකරණයට අදාළව එම තොරතුරු හෙළිදරවිකර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07හි 49 ඡේදය ප්‍රකාරව, දේපළ පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටෙක එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනයකළ යුතු වුවත්, රු.1,171,715ක වටිනාකමකින් යුත් වායුසමීකරණ යන්ත්‍රය සහ Floor Stand A/C යන්ත්‍රය ප්‍රත්‍යාගණනයකර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொலதுவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07හි 90 ඡේදය ප්‍රකාරව, දේපළ පිරියත හා උපකරණ පන්තියක් ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශකර ඇති විටෙක ස්වාධීන තක්සේරුකරුවෙකු යොදාගත්තේ ද යන වග, වත්කම්වල සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු කිරීමේ දී ව්‍යවහාරකළ ක්‍රම සහ වැදගත් උපකල්පනයන්, වත්කම්වල සාධාරණ වටිනාකම් සෘජුව සක්‍රිය වෙළඳපොළක නිරීක්ෂණයකළ හැකි මිල ගණන්වලට යොමුකර හෝ අතේ දුටින් වූ පදනම මත මැන හාගයේ සිදුවූ වෙළඳපොළ ගනුදෙනුවලට හෝ වෙනත් තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රම භාවිතාකර නිරණය කරන ලද්දේ කොතෙක් දුරට ද යනාදී තොරතුරු රු.59,025,610ක වටිනාකමින් යුත් ප්‍රත්‍යාගණිත වත්කම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවිකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 20හි 111(ආ) ප්‍රකාරව අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා හැකියාවන් අපේක්ෂා නොකරන විටෙක දී වත්කම බැහැරකිරීම් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේද ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවති සහ 2026 වර්ෂයේ භාවිතයට අපේක්ෂිත මට්ටමට වැඩිදියුණු වෙමින් පවතින රු.3,517,995ක වියදමක් දැරූ නීතිදත්ත ගබඩා පද්ධතියේ වටිනාකම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වියදමක් ලෙස අතිරික්තයට එරෙහිව කපාහැර නිබුණි.

(ඉ) 2025 සැප්තැම්බර් 30 දින වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ දී එදිනට ආරම්භක ශේෂ ලෙස දක්වා තිබූ රු.2,919,276ක වටිනාකමින් යුත් වත්කම් වර්ග 06ක් සහ රු.3,264,510ක වටිනාකමකින් යුත් භෞතිකව නොපැවති වත්කම් වර්ග 05ක් නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව සහ නිසි ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර තිබුණි.

(ඊ) 2012 ජනවාරි 01 දින සිට පැවති රු.211,393ක වටිනාකමක් සහිත පුස්තකාල පොත් සහ රු.277,100ක වටිනාකමක් සහිත අයිතම 10ක පරිගණක උපකරණ භාවිතාකළ හැකි මට්ටමේ නොමැති බව ප්‍රත්‍යාගණන කමිටු වාර්තාවේ සඳහන් වුවද ඊට අදාල ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2025 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතු ය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර, මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැළපෙනවා ද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තාකිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැතිවිට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ආයතනයේ ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරීපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරකිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු ය. කෙසේවුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත ආයතනයේ අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තරකර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අදාළ වන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසිමූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2(ඉ)හි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක්නොවී ය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත්කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර වක්‍රලේඛය සමඟ නිකුත් කර ඇති පොදු ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 2.3හි උපලේඛන I	මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15කට කලින් ඉදිරි වර්ෂ 05 සඳහා උපායමාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙලකර, රේඛීය අමාත්‍යාංශ ලේකම් හරහා භාණ්ඩාගාර ලේකම් සහ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත්කළ යුතු වුවත්, ආයතනය විසින් එවැනි උපායමාර්ගික සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.
(ආ)	2025 අප්‍රේල් 28 දිනැති අංක 01/2025 දරන කළමනාකරණ විගණන වක්‍රලේඛයේ 2.2 ඡේදය	සෑම කාර්තුවක් තුලම එක් රැස්වීමක් වන පරිදි අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පැවැත්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් පවත්වා නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනයකර භාවිතාකර නොමැති බව.

3. වෙනත් කරුණු

(අ) 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව පුටු සහ ෆැක්ස් යන්ත්‍ර ඇතුළුව අයිතම 21ක ප්‍රමාණයක් වෙන්දේසි කිරීමට යෝජනාකර තිබුණ ද, 2025 දෙසැම්බර් 31 වන විටත් වෙන්දේසි කටයුතු ක්‍රියාත්මකකර නොතිබුණි.

(ආ) වටිනාකම රු.මිලියන 3.5ක් වූ නීතිදත්ත ගබඩා පද්ධතිය 2017 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින වන විටත් නිශ්කාර්යව පැවතීම හේතුවෙන් ආයතනයේ සේවයේ නියුතු පර්යේෂණ නිලධාරීන්, මෘදුකාංග හා දෘඩාංග තාක්ෂණික නිලධාරීන් යන නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවල දැක්වූ නීති දත්ත ගබඩා පද්ධතියට අදාළ රාජකාරී ඉටුවීමක් සිදුවී නොතිබුණි.

(ඇ) පුස්තකාලයාධිපති තනතුරෙහි රාජකාරී ලැයිස්තුව අනුව, විද්‍යුත් පුස්තකාල (E – Library Service) සේවාව කළමනාකරණය කිරීම ප්‍රධාන කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණ ද, එම සේවාව 2025 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක මට්ටමේ නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා විනිශ්චයකාරවරුන් හා කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම මගින් රු.36,200,000ක් හා රු.356,273ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, 2025 දෙසැම්බර් වන විට රු.10,342,786ක් හා රු.75,897ක් පමණක් වැයකර පුහුණු වැඩසටහන් පවත්වා තිබුණි. ඒ අනුව වෙන්කළ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 71ක් හා සියයට 79ක් ඉතිරිව පැවතුණි.

(ඉ) 2025 දෙසැම්බර් 31 වන විට අවසන්කළ යුතු වුවත්, වටිනාකම රු.3,975,000ක් වූ පුස්තකාල පොත් රාක්ක, පුස්තකාල පොත්, Smart Digital Panel, Speaker Tracking Camera System Auditorium මිලදීගැනීම් යන ප්‍රසම්පාදන කාර්යයන් 04ක කටයුතු අවසන්කර නොතිබීම හේතුවෙන් වෙන්කළ ප්‍රතිපාදන ඌණ උපයෝජනය වී තිබුණි.

එල්.එස්.අයි. ජයරත්න
විගණකාධිපති

නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සහ අනාගත දියුණුව සඳහා උගත් පාඩම්

1. උපායමාර්ගික සැලසුම්කරණය සහ අනුකූලතාවය (Strategic Planning and Compliance

පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරි වර්ෂ පහ (05) සඳහා අදාළ මුදල් වර්ෂය ආරම්භ වීමට දින පහළොවකට (15) පෙර මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීමට කටයුතු කරීමට පියවර ගනිමින් සිටින අතර එමඟින් නියමිත රාජ්‍ය ප්‍රතිපත්තිමය අනුකූලතාවය තහවුරු කරීමට කටයුතු කරනු ඇත.

තවද, අලුතින් ස්ථාපිත කරන ලද තනතුර සඳහා සංඛ්‍යාලේඛනඥ/අධීක්ෂණ හා ඇගයීම් නිලධාරියෙකු 2025.12.05 දින බඳවා ගන්නා ලදී. එම නිලධාරියා උපායමාර්ගික බැඳීම්, ක්‍රියාකාරී සැලසුම් සහ වාර්තාකරණ අවශ්‍යතා ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු වන අතර, එමඟින් ආයතනික අධීක්ෂණය ශක්තිමත් කරමින්, අනාගතයේදී ප්‍රධාන සැලසුම් ලේඛන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීමේදී ඇතිවිය හැකි ප්‍රමාදයන් වැළැක්වීමට ද දායක වේ.

2. අභ්‍යන්තර විගණනය සහ ආයතනික පාලනය (Internal Audit and Governance)

අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සඳහා 2026 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ඇති බැවින්, ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතීන් තවදුරටත් ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත. අඛණ්ඩ අධීක්ෂණය යටතේ වසරකට අවම වශයෙන් අනිවාර්ය විගණන කමිටු රැස්වීම් හතරක් (04) පැවැත්වීමට කටයුතු සම්පාදනය කර ඇත.

3. මූල්‍ය කළමනාකරණය සහ ධාරිතා සංවර්ධනය (Financial Management & Capacity Building)

ප්‍රතිපාදන ඵලදායීව භාවිතය සහ ප්‍රසම්පාදන කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන වඩාත් ඵලදායී ලෙස උපයෝජනය කරගැනීම සඳහා නව කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට පියවර ගනිමින් පවතී. එමෙන්ම, උපරිම මෙහෙයුම් නිමැවුමක් ළඟා කරගැනීම වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන භාවිතය පිළිබඳ නිරන්තර හා දැඩි ඇගයීම් සිදු කරනු ලැබේ.

4. මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් (Operational Efficiency and IT Infrastructure)

ආයතනයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තොරතුරු තාක්ෂණ (IT) යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින්, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය හා උපායමාර්ගික දායකත්වය ඇතිව, INOVA ආයතනය හරහා ආයතනික තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

5. 2025 වර්ෂයේ වියදම් ක්‍රියාත්මක කිරීම (Implementation of expenditure)

2025 වර්ෂයේ වියදම් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සහ අනුමැති ලබාගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් ඇතැම් ප්‍රතිපාදන නියමිත කාලසීමාව තුළ සම්පූර්ණයෙන් උපයෝජනය කිරීමට අපහසු වූ බව හඳුනාගෙන ඇත. ඒ අනුව, 2026 වර්ෂයේදී ප්‍රසම්පාදන සැලසුම් කල්තබා සකස් කිරීම, වියදම් අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා පියවර ගෙන ඇත.

මීට අමතරව, අධිකරණ සාමාජිකයින්ගේ ධාරිතා සංවර්ධනය වැඩිදියුණු කිරීමේ අරමුණින්, වැඩි සංඛ්‍යාවක පුහුණු අවස්ථා ක්‍රියාත්මක කිරීම සහ පුහුණු කටයුතු සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන වඩාත් කාර්යක්ෂමව භාවිත කිරීම සඳහා, දේශීය නේවාසික සහ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා දැනට පවතින අයවැයමය සීමාවන් ඉවත් කිරීමේ හැකියාව පිළිබඳව සොයා බැලීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී.

ඉදිරි වසර සඳහා සැලසුම්

අනාගත මෙහෙයුම් සඳහා උපායමාර්ගික මාර්ග සිතියම සහ ඉදිරි මූල්‍ය වසර සඳහා ප්‍රධාන ප්‍රමුඛතා සහ ඉලක්ක

- **උපායමාර්ගික සැලැස්ම 2026 - 2031**

උපායමාර්ගික ප්‍රමුඛතාවය	**ව්‍යාපෘතියේ/වැඩසටහනේ නම**	**සමස්ත ප්‍රතිදානය/**	**මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මි.**	**අරමුදල් මූලාශ්‍රය**
කාර්යක්ෂම, පාරදෘශ්‍ය අධිකරණ පුහුණු පද්ධතියක් නිර්මාණය කිරීම.	අධිකරණ පුහුණු වැඩසටහන් පැවැත්වීම	පුහුණු වැඩසටහන් ගණන	රු.මි.1329	රජය
	අධිකරණ අත්පොත්, Bench books, පාඨමාලා ද්‍රව්‍ය සහ විද්‍යුත් ඉලෙක්ට්‍රොනික ලේඛන ප්‍රකාශයට පත් කිරීම	අධිකරණ අත්පොත්, Bench book, පාඨමාලා ද්‍රව්‍ය සහ විද්‍යුත් ඉලෙක්ට්‍රොනික ලේඛන සංඛ්‍යාව	රු.මි.7.5	රජය
	විනිසුරු නීති දත්ත සංහිතාව සහ ඉ-පුස්තකාලය ක්‍රියාත්මක කිරීම.	දත්ත සංහිතාව සහ ඉ-පුස්තකාලය	රු.මි.48	රජය

➢ ක්‍රියාකාරී සැලැස්ම 2026

අනුක්‍රමික අංකය	දර්ශකය*	ඒකක (වැඩසටහන් සංඛ්‍යාව)	% දර්ශකය සඳහා බරතැබීම්	ඉලක්කය (සමුච්චිත)				
				කා1	කා2	කා3	කා4	එකතුව
1	මහාධිකරණ විනිසුරුවරුන්, අධිකරණ නිලධාරීන් සහ කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් සඳහා අඛණ්ඩ පුහුණු වැඩසටහන් පැවැත්වීම	41	17.00%	7	10	10	14	41
2	අභියාචනාධිකරණයට උසස්වීම් ලැබූ මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වන සමාරම්භක වැඩසටහන	1	2.00%		1			1
3	අලුතින් පත් කරන ලද මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වන සමාරම්භක වැඩසටහන	2	2.00%	1			1	2
4	අලුතින් බඳවා ගන්නා ලද අධිකරණ නිලධාරීන් සඳහා වන අධිකරණ සේවාරම්භක පුහුණු වැඩසටහන	1	4.00%	0.25	0.25	0.25	0.25	1
5	විනිසුරුවන්ගේ සඟරාව (Judges Journal) XI කාණ්ඩය - 2025 සහ ජේ. එෆ්. ඒ. සෝසා අනුස්මරණ දේශනය	01	4.00%		1			1
6	කාන්ති විනිසුරුවරුන් සඳහා වන පුහුණු වැඩසටහන	1	3.00%		1			1
7	විනිසුරුවන්ගේ අත්පොත (Judges Manual) 2026 II කාණ්ඩය	1	3.00%		1			1
8	විනිසුරුවන්ගේ අත්පොත් (Judges' Handbooks)	4	5.00%		1	1	2	4

9	විනිසුරුවන්ගේ නීතිමය දත්ත සංහිතාව (Judges Legal database)	1	4.00%	0.25	0.25	0.25	0.25		1
10	මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන් සඳහා වන පශ්චාත් උපාධි පාඨමාලා	04	6.00%				2	2	4
11	WIPO Lex නඩු තීන්දු යාවත්කාලීන කිරීම (ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නඩු තීන්දු)	1	3.00%	0.25	0.25	0.25	0.25		1
12	භාෂා පුහුණු වැඩසටහන් (ඉංග්‍රීසි/දෙමළ/සිංහල)	4	5.00%	1	1	1	1		4
13	මහාධිකරණ විනිසුරුවරුන්ගේ වාර්ෂික සමුළුව	1	4.00%				1		1
14	අධිකරණ නිලධාරීන්ගේ වාර්ෂික සමුළුව	1	4.00%				1		1
15	විනිසුරුවරුන් සඳහා විදේශීය පුහුණු වැඩසටහන්	8	8.00%	2	2	2	2		8
16	කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් සඳහා පශ්චාත් උපාධි අනුග්‍රාහකත්වය	2	4.00%				1	1	2
17	අධිකරණ නායකත්ව සංවර්ධනය	2	4.00%	0.5	0.5	0.5	0.5		2
18	විශේෂිත අධිකරණ ධාරිතා වර්ධනය සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) වැඩසටහන්	4	5.00%	1	1	1	1		4
19	පර්යේෂණ, නවෝත්පාදන නීතිය සහ ප්‍රතිසංස්කරණ සහාය	4	5.00%				2	2	4
20	යුක්තිය ඉටුකිරීමට ඇති ප්‍රවේශය සහ ළමා හිතකාමී අධිකරණ වැඩසටහන	2	4.00%		1	1			2
21	ආයතනික තිරසාරභාවය සහ පාලනය	1	4.00%	0.25	0.25	0.25	0.25		1
	සාමාන්‍ය භෞතික ප්‍රගතිය		**100.00%**						

- **ක්‍රියාකාරකම් සැලැස්ම 2026**

ක්‍රියාකාරකම	දායකත්ව ආයතනය	ඉලක්කගත සහභාගිවන්නන්
බ්‍රිතාන්‍ය කවුන්සිල ඉංග්‍රීසි භාෂා පාඨමාලාව (මූලික සහ උසස් පාඨමාලා)		අයදුම්කරුවන් සඳහා සියලුම දෙමළ කතා කරන විනිසුරුවන්
දෙමළ භාෂාව කථා කරන විනිසුරුවරුන් සඳහා වන සිංහල භාෂා පාඨමාලාව		
ශ්‍රී ලංකා **විනිශ්චයකාරවරයන්ගේ** ආයතන (SLJI) පුස්තකාලය සඳහා ඉහළ කාර්යසාධනයක් සහිත පරිගණක මිලදී ගැනීම – ඒකක 02		
SLJI පුස්තකාලය සඳහා පොත් රාක්ක මිලදී ගැනීම – රාක්ක 20		
පුස්තකාල පොත් මිලදී ගැනීම (ඉ- පොත් , සඟරා...)		
SLJI පුස්තකාලය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම		
SLJI පුස්තකාලය සඳහා ලැමිනේටින් (Laminating) යන්ත්‍රයක් මිලදී ගැනීම		
SLJI පුස්තකාලය සඳහා RFID ආරක්ෂක පද්ධතියක් මිලදී ගැනීම (UNDP අනුමැතියට යටත්ව)		
SLJI සඳහා වෙබ් මේල් (Web mails) මිලදී ගැනීම		
SLJI හි අභ්‍යන්තර දුරකථන/intercom පද්ධතිය යාවත්කාලීන කිරීම		
SLJI සඳහා ශ්‍රවණාගාර පුටු මිලදී ගැනීම – ඒකක 10		
SLJI සඳහා ෆයිබර් අන්තර්ජාල සම්බන්ධතාවයක් මිලදී ගැනීම සහ ස්ථාපනය කිරීම		
SLJI කාර්ය මණ්ඩලය සඳහා මොනිටර රහිත පරිගණක මිලදී ගැනීම – ඒකක 13		
පවතින පරිගණක අලුත්වැඩියා කිරීම		
SLJI ශ්‍රවණාගාරය සඳහා වෙබ් කැමරාවක් (Web camera) මිලදී ගැනීම		
SLJI සම්මන්ත්‍රණ ශාලාවේ පවතින ශබ්ද පරිපාලන පද්ධතිය	-	

අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිස්ථාපනය කිරීම
SLJI නිල නිවාසය සඳහා ගෘහස්ථ භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීම
වාහන අලුත්වැඩියාව සහ වාහන උපාංග මිලදී ගැනීම:
මෝටර් රථය – ටයර් 04
වෑන් රථය – දොර

කාර්යාල උපකරණ මිලදී ගැනීම:
Workstations – ඒකක 02
යකඩ අල්මාරි – ඒකක 05

දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන් (කොළඹ) සඳහා සමථ කුසලතා සහ සමථකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ ADB පුහුණු පාඨමාලාව	ADB	බස්නාහිර පළාතේ දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන්
දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන් (මහනුවර) සඳහා සමථ කුසලතා සහ සමථකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ ADB පුහුණු පාඨමාලාව	ADB	මධ්‍යම පළාතේ දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන්
WIPO Lex නඩු තීන්දු යාවත්කාලීන කිරීම - ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ නඩු තීන්දු		
2023 අංක 29 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යටතේ පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණ (Pre-Trial Conference) පිළිබඳ වැඩමුළුව – 01 වන පූර්ව නඩු විභාග පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය	-	බස්නාහිර පළාතේ දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන්

මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විනිසුරුවරුන් සඳහා වන පුහුණු වැඩසටහන	CIPM	
සාක්ෂි නීතිය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණ මාලාව – (01)		අධිකරණ නිලධාරීන්
කාන්ති විනිසුරුවරුන් සඳහා වන වැඩමුළුව (01)		කාන්ති විනිසුරුවරු
SLJI දත්ත සමුදාය නඩත්තු කිරීම (නීතිමය දත්ත සංහිතාව නඩත්තු කිරීම සඳහා සේවා සපයන්නා සමඟ ඇති ගිවිසුම) – වාර්ෂික නඩත්තු ගාස්තු		
පර්යේෂණ කණ්ඩායමක් සඳහා ගෙවීම්		
Word/PDF මෘදුකාංග (Software) මිලදී ගැනීම		-
සාක්ෂි නීතිය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණ මාලාව – (02)		අධිකරණ නිලධාරීන්
		-
දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන් (.....) සඳහා සමථ කුසලතා සහ සමථකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ ADB පුහුණු පාඨමාලාව	ADB	..... පළාතේ දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන්
මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වාණිජ සමථකරණය (විනිසුරුවරුන් සඳහා නඩු කළමනාකරණය) – 02 වන වැඩමුළුව	UNDP	
2023 අංක 29 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යටතේ පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණ පිළිබඳ වැඩමුළුව – 02 වන පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය		මධ්‍යම පළාතේ දිසා විනිසුරුවරුන් සහ විනිසුරුවරුන්
SLJI දත්ත සංහිතාව ආරම්භ කිරීම (ප්‍රතිසංවිධානය)		-
විදේශීය පුහුණු වැඩසටහන – (01) (ඉන්දියාවේ බෝපාල් හි ජාතික අධිකරණ ඇකඩමියෙහි පැවැත්වෙන පුහුණු වැඩසටහන)		විනිසුරු කණ්ඩායම් දෙකක් (එක් එක් කණ්ඩායමට 30 බැගින්)
අධිකරණ සේවාරම්භක වැඩසටහන -2026		2026 නව කණ්ඩායම –

		අධිකරණ නිලධාරීන්
විනිසුරු ජේ. එෆ්. ඒ. සෝසා අනුස්මරණ දේශනය (විනිසුරුවන්ගේ සහරාව සහ විනිසුරුවන්ගේ අත්පොත එළිදැක්වීම) විනිසුරුවන්ගේ අත්පොත්		
මුදල් විශුද්ධිකරණය වැළැක්වීම, අපරාධවලින් උපයාගත් පල සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට එරෙහි නීතිමය පද්ධතීන් පිළිබඳ මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වන වැඩමුළුව		මහාධිකරණ විනිසුරුවරු
		..... පළාතේ
දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන් (.....) සඳහා සමථ කුසලතා සහ සමථකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ ADB පුහුණු පාඨමාලාව	ADB	දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන්
		..... පළාතේ
දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන් (.....) සඳහා සමථ කුසලතා සහ සමථකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ ADB පුහුණු පාඨමාලාව	ADB	දිසා විනිසුරුවරුන් සහ සුළු හිමිකම් අධිකරණ විනිසුරුවරුන්
ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරුවරුන් සඳහා වන අධිකරණ සම්මන්ත්‍රණය (01)		ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරුවරුන්
සාක්ෂි නීතිය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණ මාලාව – (03)	-	අධිකරණ නිලධාරීන්
2023 අංක 29 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යටතේ පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය පිළිබඳ වැඩමුළුව – 03 වන පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය		..... පළාතේ දිස්ත්‍රික් විනිසුරුවරුන් සහ විනිසුරුවරුන්
2024 අංක 8 දරන අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීමේ පනත – වැඩමුළුව (01)		කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් සහ අධිකරණ නිලධාරීන්
බ්‍රිතාන්‍ය කවුන්සිල ඉංග්‍රීසි භාෂා පාඨමාලාව (මූලික සහ උසස් පාඨමාලා) – II වන කොටස		ඉල්ලුම්කරුවන් සඳහා

සාක්ෂි නීතිය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණ මාලාව – (04)		අධිකරණ නිලධාරීන්
අධිකරණ ගිණුම්කරණ පටිපාටිය සහ ප්‍රසම්පාදනය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණ මාලාව – (01)		මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන්
සමූහ මිනීවලවල් කැණීමේ පටිපාටිය පිළිබඳ වැඩමුළුව – (එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN) මගින් පවත්වනු ලද)	UN	-
සාක්ෂි නීතිය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණ මාලාව		මහාධිකරණ විනිසුරුවරුන්
අධිකරණ ගිණුම්කරණ පටිපාටිය සහ ප්‍රසම්පාදනය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණ මාලාව – (02)		මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන්
සමූහ මිනීවලවල් කැණීමේ පටිපාටිය පිළිබඳ වැඩමුළුව – (එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN) මගින් පවත්වනු ලද)	UN	-
ළමුන් සම්බන්ධ නඩුවලදී කටයුතු කිරීම පිළිබඳ විනිසුරුවන් සඳහා වන අත්පොත	UNISEF	TBD
WIPO - බුද්ධිමය දේපළ පිළිබඳ වැඩමුළුව		
2023 අංක 29 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යටතේ පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණ පිළිබඳ වැඩමුළුව – 04 වන පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය		
අධිකරණ ගිණුම්කරණ පටිපාටිය සහ ප්‍රසම්පාදනය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණ මාලාව – (03)		මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන්
විදේශීය පුහුණු වැඩසටහන – (02) (ඉන්දියාවේ චන්දිගාර් හි අධිකරණ ඇකඩමියෙහි පැවැත්වෙන පුහුණු වැඩසටහන)		විනිසුරුවරු කණ්ඩායම් තුනක් (එක් එක් කණ්ඩායමට 30 බැගින්)
2024 අංක 8 දරන අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීමේ පනත – වැඩමුළුව (02)		කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් සහ අධිකරණ නිලධාරීන්
අධිකරණ ගිණුම්කරණ පටිපාටිය සහ ප්‍රසම්පාදනය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණ මාලාව – (04)		මහාධිකරණ විනිසුරුවරුන් සහ

	අධිකරණ නිලධාරීන්
කම්කරු විනිශ්චය සහා පටිපාටිය තුළ ඉලෙක්ට්‍රොනික සාක්ෂි (Electronic Evidence) භාවිතය	කම්කරු විනිශ්චය සහා සභාපතිවරුන් සහ අධිකරණ නිලධාරීන්
අධිකරණ ගිණුම්කරණ පටිපාටිය සහ ප්‍රසම්පාදනය පිළිබඳ එක්දින සම්මන්ත්‍රණ මාලාව – (05)	මහාධිකරණ විනිසුරුවරුන් සහ අධිකරණ නිලධාරීන්
2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පන්ත – වැඩමුළුව (01)	දිසා විනිසුරුවරු
2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පන්ත – වැඩමුළුව (02)	දිසා විනිසුරුවරු
මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වන වැඩමුළුව	මහාධිකරණ විනිසුරුවරු
විදේශීය පුහුණු වැඩසටහන – (03)	TBD
විදේශීය පුහුණු වැඩසටහන – (04)	TBD
අධිකරණ නිලධාරීන්ගේ වාර්ෂික සමුළුව- 2026	අධිකරණ නිලධාරීන්
2023 අංක 29 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යටතේ පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණ පිළිබඳ වැඩමුළුව – 05 වන පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය නඩු තීන්දු ලිවීම පිළිබඳ වැඩමුළුව ඉංග්‍රීසි භාෂා ලිවීමේ කුසලතා වැඩසටහන (බ්‍රිතාන්‍ය කවුන්සිලය සමඟ ඒකාබද්ධව)	
2024 අංක 49 දරන විදේශ නඩු තීන්දු අන්‍යෝන්‍යව පිළිගැනීම, ලියාපදිංචි කිරීම සහ බලාත්මක කිරීම පිළිබඳ පන්ත – වැඩමුළුව (03)	දිසා විනිසුරුවරුන් - විනිසුරු කණ්ඩායම් තුනක් (එක් එක් කණ්ඩායමට 60 බැගින්)
තොරතුරු තාක්ෂණ (IT) කුසලතා වැඩසටහන (එක්දින)	
අලුතින් පත් කරන ලද මහාධිකරණ විනිසුරුවරුන් සඳහා වන සේවාරම්භක පුහුණු වැඩසටහන (02)	මහාධිකරණ විනිසුරුවරු

අලුතින් පත් කරන ලද අභියාචනාධිකරණ විනිසුරුවරුන් සඳහා වන සේවාරම්භක පුහුණු වැඩසටහන (01)	අභියාචනාධිකරණ විනිසුරු
ඉදිරිපත් කිරීමේ කුසලතා (Presentation Skills) පිළිබඳ එක්දින වැඩසටහන	
කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන් සඳහා වන නේවාසික වැඩමුළුව	කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්
මුදල් විශුද්ධිකරණය, අපරාධවලින් උපයාගත් පල සහ වත්කම් අයකර ගැනීම	
සිංහල භාෂාව කථා කරන විනිසුරුවරුන් සඳහා වන දෙමළ භාෂා පාඨමාලාව	50 බැගින්
වීඩියෝ සම්මන්ත්‍රණ (Video Conferencing) පුහුණු වැඩසටහන	
විශේෂිත අධිකරණ ධාරිතා වර්ධනය සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) මූලික සහ උසස් වැඩසටහන් - සයිබර් අපරාධ, ඉලෙක්ට්‍රොනික සාක්ෂි, මුදල් විශුද්ධිකරණය/වත්කම් අයකර ගැනීම, බුද්ධිමය දේපළ, ළමුන් සඳහා යුක්ති පද්ධතිය (Juvenile Justice)	
අධිකරණ යහපැවැත්ම (Judicial Well-being) පිළිබඳ වැඩසටහන (එක්දින)	කණ්ඩායම් 02 (එකකට 50 බැගින්)
අවබෝධතා ගිවිසුම් (MoUs) අත්සන් කිරීම සහ ජාත්‍යන්තර සහයෝගීතාව	
ඇගයීම් සමාලෝචනය සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs)	

අයවැය ප්‍රතිපාදන ඉදිරි දැක්ම

අයවැය ඇස්තමේන්තුව – 2026

ශීර්ෂය: 228- අධිකරණ පරිපාලනය
වැඩසටහන: 01- යුක්තිය පසඳලීම
ව්‍යාපෘතිය: 01 - අධිකරණ පරිපාලනය

උප ව්‍යාපෘති	විෂය විෂය	අයිතම	ආයතන වර්ගීකරණය	වර්ගය/ විෂයේ නම		2026 සඳහා ඇස්තමේන්තුව	
1	**1503**			**පුනරාවර්තන වියදම**			
				පුද්ගල පඩිනඩි		**24.90**	**25.00**
	1001		11	වැටුප් හා වේතන	ඇමිණුම1/සටහන 01	21.25	21.34
	1002		11	අතිකාල හා නිවාඩු දින වැටුප්	සටහන 1	2.35	2.36
	1003		11	වෙනත් දීමනා	ඇමිණුම1	1.30	1.30
1	**1509**			**වෙනත් (පුද්ගල පඩිනඩි හැර)**			
				ගමන් වියදම්		**79.64**	**30.00**
	1101		11	දේශීය	සටහන 2	0.10	0.04
	1102		11	විදේශීය	ඇමිණුම 2	57.22	21.56
				සැපයීම්			
	1201		11	ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	සටහන 3	2.20	0.83
	1202		11	ඉන්ධන	සටහන 4	0.48	0.18
	1203		11	ආහාර පාන හා නිල ඇඳුම්	සටහන 5	0.01	0.00
				නඩත්තු වියදම්			
	1301		11	වාහන	සටහන 6	0.94	0.35
	1302		11	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	සටහන 7	0.57	0.21
	1303		11	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	සටහන 8	0.50	0.19
				සේවා			
	1401		11	ප්‍රවාහන	සටහන 9	0.05	0.02
	1402		11	තැපැල් හා සන්නිවේදන	සටහන 10	0.63	0.24
	1403		11	විදුලිය සහ ජලය	සටහන 11	3.12	1.18
	1404		11	බදුකුළී සහ පළාත් පාලන ආයතන බදු		-	-
	1405		11	වෙනත්	සටහන 12	13.82	5.20

				මාරු කිරීම්			
	1505		11	සම්මාදම් සහ දායක මුදල්		-	-
				උප එකතුව		**104.54**	**55.00**
1	**2201**			**මූලධන වියදම්**			
				ප්‍රාග්ධන වියදම් වැඩි දියුණු කිරීම හා අලුත් වැඩියා කිරීම			
	2001		11	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	සටහන 13	1.50	1.50
	2002		11	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	සටහන 13	0.35	0.35
	2003		11	වාහන		-	-
				ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම			
	2101		11	වාහන		-	-
	2102		11	ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	සටහන 14	1.41	1.41
			11	2. පුස්තකාල පොත්		2.00	2.00
			11	3.වෙනත්		-	-
	2103		11	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	සටහන 15	4.04	4.04
	2104		11	ගොඩනැගිලි සහ ඉදිකිරීම්		-	-
	2401			***මානව සම්පත් සංවර්ධනය***			
				විනිසුරු පුහුණුව - දේශීය	ඇමිණුම 4	32.17	32.15
				විනිසුරු පුහුණුව - විදේශීය	ඇමිණුම 5	14.88	14.87
				කාර්ය මණ්ඩල පුහුණුව		0.50	0.50
				උප එකතුව		**56.85**	**56.80**
				මුළු වියදම		**161.39**	**111.81**

ඩිජිටල් හෝ ප්‍රතිසංස්කරණ සැලසුම්

- අධිකරණ පර්යේෂණ සහ නෛතික සම්පත් සඳහා ඇති ප්‍රවේශය පුළුල් කිරීම සඳහා විනිසුරුවන්ගේ විස්තීර්ණ නීති දත්ත සමුදායක් (Judges' Legal Database) සහ ස්වයංක්‍රීය පුස්තකාල පද්ධතියක් (E-Library) සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

ස්තූතිය

පහත සඳහන් අය විසින් ලබාදෙන සහය හා සහයෝගය ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනය විසින් අගය කරනු ලබයි.

1. කළමනාකරණ මණ්ඩලය
2. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් සහ කාර්ය මණ්ඩලය
3. අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් සහ කාර්ය මණ්ඩලය
4. භාණ්ඩාගාර ලේකම් සහ භාණ්ඩාගාර කාර්ය මණ්ඩලය
5. UNDP, USAID, UNICEF සහ අරමුදල් සපයන අනෙකුත් සංවිධාන
6. විගණකාධිපති සහ එහි කාර්ය මණ්ඩලය
7. බන්ධනාගාර අධිකාරී සහ එහි කාර්ය මණ්ඩලය
8. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්
9. අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්
10. ශ්‍රේෂ්ඨාධිකරණයේ මාෂල්
11. කොළඹ අධිකරණ වෛද්‍ය නිලධාරී සහ අධිකරණ වෛද්‍ය විද්‍යාඥයින්ගේ විද්‍යාලය
12. ලංකා වෛද්‍ය විද්‍යාලය
13. සමාජ සංවර්ධන ජාතික ආයතනය